


අතහැරීම 4

# මහ රහතුන් වැඩි මඟ ඔස්සේ



# මහ රහතුන් වැඩි මඟ ඔස්සේ

අතහැරීම 4

© මහරහතුන් වැඩි මඟ ඔස්සේ ප්‍රකාශන කමිටුව

පළමුවන මුද්‍රණය - 2016 ජනවාරි

ISBN 978-955-7887-11-1

**පොත ලබාගත හැකි ස්ථාන**

**දිවයින පුරා ප්‍රධාන පොත් අලෙවි සැල්**

**විමසීම් -** 071 2 199 900
(කාර්යාල වේලාවන් හීදී පමණක් ඇමතීමට කාරුණිකවන්න)

ඡායාරූප
**වාසල සේනාරත්න**

මුද්‍රණය සහ බෙදාහැරීම
ස්මාර්ට් ප්‍රින්ට් සොලියුෂනස් සෙන්ටර්
444/3B, පිටිපන දකුණ, හෝමාගම

(සෝයා තෙල් භාවිතයෙන් නිපදවනු ලැබූ, විෂ රහිත පරිසර හිතකාමී තින්ත භාවිතයෙන් මුද්‍රිතයි.)

මේ ඝෝර කටුක භයානක සංසාරයේ
නියැදුන, මේ අන්ධකාරයේදී
සසර දුකින් මිදීමට [illegible]
අධිෂ්ඨානය කරන්න වීර්ය වඩන්න
[illegible] ඔබ [illegible] "[illegible]"
නිසි [illegible] [illegible] වඩන්න
ඒ අනිත්‍ය ස්වභාවය
ප්‍රඥාවන්ත වෙමු, [illegible] වෙමු
ආර්යයන්ම වෙමු
තම තමාම එළඹෙන [illegible]
තම තමන්ගේ ජීවිත [illegible] [illegible] ගනිමු.
දුරු [illegible] ව්‍යාකූල [illegible] [illegible]
ඔබ [illegible] [illegible]
ඔබ [illegible]
[illegible] [illegible]
[illegible] [illegible] [illegible] [illegible]
[illegible] [illegible] [illegible].
[illegible] [illegible] [illegible] [illegible]
ඔබ [illegible] [illegible] වෙමු,
තම තමාටම [illegible] [illegible] ගනිමු.

*(පින්වත් ඔබ වෙනුවෙන් මෙම සටහන් තැබූ භික්ෂූන් වහන්සේ විසින් ලියූවකි.)*

# පිදුම

මේ අනන්ත වූ සංසාරයේ අප කරක් නොගැසූ තැනක් වේද? අත් නොවිඳි අත්දැකීමක් වේද්ද? ඒ සා තැන්හී කරක් ගසා, ඒ සා අත්දැකීම් විඳ මෙලෙසින් තවත් උපතක් ලැබූ අපි මේ භව චක්‍රයේ තවත් කැරකෙමුද? අප හැමදාම කැරකුනේ එකම තැනක් වටාය. විඳගත්තේ ජාති, ජරා, ව්‍යාධි, මරණ.... වැනි එකම අත්දැකීම් පෙළකි.

හිත හැරුණු අතේ, හිස හැරුණු අතේ....යන්නන් වාලේ ගිය මේ ගමනේ වෙහෙස යනු 'දුක' යැයි කියාදුන්, ඒ දුකට සමුදීමේ ක්‍රමවේදය 'දුක අවබෝධ කිරීම' යැයි කියාදුන්, දුක අවබෝධ කිරීමේ උත්සාහයට වචනයකින් හෝ ආදර්ශයෙන් හෝ සවිය දෙන කළ්‍යාණ මිත්‍රයෙක් යැයි කියන්නා වූ යමෙක් වෙත්ද, ඒ කළ්‍යාණ මිත්‍රයා වෙනුවෙන් මෙය පුදමි.

'මහ රහතුන් වැඩි මග ඔස්සේ ' ලිපි මාලාව පින්වත් ඔබ වෙනුවෙන් පුදනු ලැබූ උන්වහන්සේ එදා ඒ සටහන් තබනු ලැබුවේ අප්‍රකටවය. මහා ඝන වනන්තරයේ ඈත කුටියක සිට, සිතත්, පරිසරයත් සහ මුළින්ම නිසල මොහොතක, ලොවම නිදනා රාත්‍රියක, විටෙක රූස්ස ගස් අතරින් පෙරී එන ළහිරු කිරණ හෝ තවත් විටෙක ලන්තෑරුමේ දුප්පත් එලියේ පිහිටෙන් තැබූ ඒ සටහන් දිවයින සිසාරා සදහම් සුවඳ වී හමා ගියේය. ඒ සුවඳ හමන්නේ කොයි ඉසව්වෙන් දැයි සැදැහැති දනෝ විමසූහ. ඒ දහම් සුවඳින් හදවත සුවඳවත් කරගත් අයෙක් ඒ භාග්‍යවතුන් වහන්සේගේ ඒ දහම් සුවඳ පතුරුවාහල බුදුපුතුන් දැකීමට ප්‍රාර්ථනා කළහ. සත්‍යක්‍රියා කළහ. තවමත් ගලපා ගත නොහැකි දහම් ගැටළුවක් වේ නම් එය ඒ පින්වත් ස්වාමීන්වහන්සේගෙන්ම විමසා ගලපා ගැනීමට උනන්දු වූහ.

කාලයාගේ ඇවෑමෙන් ඒ ප්‍රාර්ථනා ඉටුවිය. සටහනකින් ඔබ දුටු උන්වහන්සේව සියැසින් දැක ගැනීමට ඔබට හැකිවිය. නැතිනම් ඔබට ඒ සඳහා හේතු තිබුණි. එතෙක් ඇසින් කියවූ දහම් ගැලපුම දෙසවනින් ඇසීම උදෙසා දස දහස් ගණනින් රැස්වූහ. පිරිස කොතරම් උන්වහන්සේ වටා රැස්වුවද, උන්වහන්සේ උන්වහන්සේගේ ස්වභාවයෙන්ම සිටිසේක. රැස්වන කඳු ගණන් පිරිකරද, දහස් ගණන් පිරිවරද ලෝකය වශයෙන්ම, මාරයා වශයෙන්ම දුටු සේක. ප්‍රසංශාවත්, සාධුකාරයත්, ගැරහුමත්, විවේචනයත් ධර්මයටම ගැලපූහ.

වනයේ රුක්ෂ මණ්ඩලයක රැඳුණු හුදකලාව තමන් වහන්සේගේ විවේකය පිණිසත්, ගම නගරයේ සැකසුණු ධර්ම මණ්ඩපයක ඉල්ලීම ධර්මකාමී ජනතාවගේ පහසුව පිණිස කැපකිරීමක් ලෙසත් වස්කාලයෙන් වස්කාලය, උන්වහන්සේ ඉකුත් වසර කිහිපය ගෙවා දැමූහ. නමුත් 'ඉරිදා දිවයින' පුවත්පතේ අඛණ්ඩව 'මහ රහතුන් වැඩි මග' ලිපි පළවිය. මේ එහි තවත් එකතුවකි.

**2014 සැප්තැම්බර්**

# පටුන


සියළු සංස්කාරයෝ අනිත්‍යය, අප්‍රමාදී වෙන්න 1

අශ්‍රද්ධාවේ අකීකරුකමට, හොඳම ඔසුව කල්‍යාණමිත්‍ර ආශ්‍රයයි 5

සීලය අර්ථවත් වීමටනම්, ඊට ඉහළින් ප්‍රඥාව තිබිය යුතුමයි 8

සංස්කාරයන්ගේ ඵලයක් වූ දෙවියන්, කොහොමද අනුනගේ
සංස්කාරයන් වෙනස් කරන්නේ? 12

ජීවිතයත්, ධර්මයත් එකක් බවට පත්කොට ගන්න 17

ඔබ හෙලන සෑම කඳුලක්ම, සංසාරයේ ඔබ අනුනට
දුන් කඳුලක්මයි 21

උතුම් රහත්ඵලයට පත්වෙනතුරු,
තේරුම් නොගත් ජීවිතයේ යථාර්ථය 25

හිංසාවෙන් විමුක්තිය සොයන මිනිස්සු, සුගතියෙන් ඈතට යනවා 31

සීලයෙන් බැහැරවූ මනුෂ්‍යයා රත් පැහැයට හුඟාක් කැමතියි 37

පින්වත් ඔබ ලෝකයෙන් හුදකලා වෙන්න.
එම හුදකලාව තුල සිටිමින් ලෝකය දකින්න 46

දානය වැරදිලාවත් අපේ ගෙදරට ආවොත් බල්ලා ලිහනවා 55

උභතෝභාගවිමුක්ත රහතන්වහන්සේලා
ලෝකයේ වැඩ සිටිනවාද? 64

ලෝකය ගමන්කරන්නේ මනුෂ්‍යයා තුල මෘගසංඥාව
සකස්වෙන දිශාවටයි. 69

තමා තුළින්ම කල්‍යාණ මිත්‍රයා
මතුකොට ගන්න දක්ෂවෙන්න 77

තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාව තුළින්
ධර්ම මාර්ගය කෙරෙහි වීර්‍යය මෝදුකොටගන්න 85

අශ්‍රද්ධාව තුළින් පෝෂණය වන වීර්යය,
ක්‍රියාත්මකභාවයෙන් බලවත්වෙනවා 90

සංස්කාරයන්ට අදාළවයි ඔබේ දැනීම් සකස්වෙන්නේ 94

දානයේ ආනිසංශ බෞද්ධ අබෞද්ධ කාටත් පොදුයි 97

ක්‍රමානුකූලව පල්ලම් බහින බෞද්ධ මනෝභාවය 103

නියඟයත්, ගංවතුරත්, දුස්සීලභාවයේම ඵලයන් 108

# සියළු සංස්කාරයෝ අනිත්‍යය, අප්‍රමාදී වෙන්න

ලොව්තුරා බුදුරජාණන්වහන්සේ පිරිනිවන් පෑමට මොහොතකට පෙරාතුව, භික්ෂූන් වහන්සේලා අමතා ප්‍රකාශ කරනවා, "මහණෙනි, පින්වත් ඔබලාට ධර්ම මාර්ගය සම්බන්ධයෙන් යම් ගැටළුවක් ඇතොත්, එම ගැටළු බුදුරජාණන් වහන්සේ ජීවමානව වැඩසිටින අවසාන මොහොතේදී, අසා දැන ගන්නය කියලා. නමුත් ස්වාමීන්වහන්සේලා නිහඬව සිටිය මිසක් කිසිදු ප්‍රශ්නයක් බුදුරජාණන්වහන්සේගෙන් විමසුවේ නැහැ. එවිට බුදුරජාණන්වහන්සේ දේශනා කරනවා භාග්‍යවතුන්වහන්සේ වෙහෙසට පත්වෙනවාය කියලා. ඔබට, ඇති ප්‍රශ්න නොවිමසා සිටින්න එපා, ඔබට ප්‍රශ්නය විමසීමට බැරිනම් අන් භික්ෂුවක ලවා හෝ අදාල ප්‍රශ්නය ඉදිරිපත්කරන්නය කියලා. බුදුරජාණන්වහන්සේ දෙවන වතාවටත් දැනුම් දුන්නත් කිසිදු ස්වාමීන්වහන්සේ නමක් බුදුරජාණන්වහන්සේ වෙහෙසට පත්වේවිය යන සිතුවිල්ලෙන්, ප්‍රශ්න ඉදිරිපත් කළේ නැහැ. රැස්ව සිටි ස්වාමීන්වහන්සේලාගේ නිහඬභාවය දැකලා, බුදුරජාණන්වහන්සේ තම ශ්‍රී මුඛයෙන්, අවසාන අවවාදය ලෝකයාට දේශනාකොට වදාළා. භාග්‍යවතුන්වහන්සේ දේශනා කරනවා, මහණෙනි සියළු සංස්කාරයෝ අනිත්‍යයි. සියළු සංස්කාරයෝ කියලා කියන්නේ, සත්වයා අවිද්‍යාව හේතුවෙන් සකස් කොට ගන්නා කුසල් සහ අකුසල් සංස්කාරයන්ටයි. මහණෙනි, මේ සැම කුසල් සහ අකුසල් සංස්කාරයන් විපාකදීලා අනිත්‍ය වෙනවා. කුසල් සංස්කාරයන්ගේ අග්‍රඵලය වන,

ලොව්තුරා බුදුරජාණන්වහන්සේත්, අනිත්‍ය භාවයට පත්වෙන ලෝක ධර්මතාවයක්. අකුසල් සංස්කාරයන්ගේ අග්‍රඵලය වන අවීචිමහා නිරයේ නිරි සත්වයාත් අනිත්‍ය භාවයට පත්වෙන ලෝක ධර්මතාවයක්. එම නිසා පින්වත් මහණෙනි, සංස්කාරයන්ට බැදෙන්න එපා. සංස්කාරයන් නිත්‍ය වශයෙන් දකින්න එපා. සංස්කාරයන් වර්ණනා කරන්න එපා. හිස ගිනිගත්තෙක් එම ගිනි නිවා දැමීමට යම් වෙහෙසක් ගන්නේ ද, ඊට වැඩි වෙහෙසක් ගනිමින් භව ගින්දර නිවාගන්න කියලයි අවසාන වශයෙන් බුදුරජාණන්වහන්සේ ලෝකයාට අවවාද කරන්නේ. බුදුරජාණන්වහනසේ ලෝකයාට දේශනාකොට වදාළ අවසාන අවවාදය තුල ගැබ්වෙලා තිබෙන, පරම සත්‍යය අර්ථය වෙන්නේ, සියළු සංස්කාරයෝ අනිත්‍ය නිසා අප්‍රමාදී වෙන්න කියන කාරණයයි. කුමක් කෙරෙහිද පින්වත් ඔබ අප්‍රමාදීභාවයට පත්විය යුත්තේ, ආර්ය අෂ්ඨාංගික මාර්ගය කෙරෙහියි, ඔබ අප්‍රමාදීභාවයට පත්විය යුත්තේ. බුදුරජාණන්වහන්සේ තම අවසාන අවවාදයෙන් ලෝකයාට දේශනා කරන්නේ නැහැ, මහණෙනි සියළු සංස්කාරයෝ අනිත්‍යයි. එම නිසා ශාසනය ආරක්ෂාකොට ගන්න සටන් කරන්නය කියලා. බුදුරජාණන්වහන්සේ දේශනාකොට වදාළ අප්‍රමාදීභාවය කියන අර්ථයෙන් බැහැරවෙලා, ශාසනය ආරක්ෂා කිරීම උදෙසා පින්වත් ඔබ සටන් කරන්න ගියොත්, ඒ සටන් කිරීම තුලින් නැවත රැස්වෙන්නේ, අනිත්‍ය වූ සංස්කාරයක්ම පමණයි. අතීතයේ සාරාසංඛ කල්ප ලක්ෂ ගණනාවක්, බුදුරජාණන්වහන්සේලා ලක්ෂ ගණනක්, සම්මා සම්බුද්ධ ශාසන ලක්ෂ ගණනක් මුණගැසිලත්, ඒ සැම බුදුරජාණන්වහන්සේ නමක්ම, පින්වත් ඔබට අප්‍රමාදීවෙන්න කියන, අර්ථය දේශනා කරද්දී, අපි තෝරාගෙන ඇත්තේ, ශාසනය ආරක්ෂා කිරීමට සටන් කිරීමයි. බුදුරජාණන්වහන්සේලාගේ අනුශාසනාවන් ඇසුවේ නැහැ. බුදුරජාණන්වහන්සේලා ඉක්මවාගියා, සම්බුදු අවවාදයන් ඉක්මවාගියා, ඒ අතීත සංසාරික පුරුදු වර්තමානයෙත්, පටිච්චසමුප්පන්නව අපි තුල හොල්මන් කරනවා. අතීත සම්මා සම්බුද්ධ ශාසනයක්, එක දවසකින් හෝ වැඩිපුර ආරක්ෂාවුනා

නම්, එම ශාසනය ආරක්ෂා වුනේ සටන් කරලා, යුද්ධකරලා, උපවාසකරලා නොවේ. මනුෂ්‍ය ජීවිතවලට සම්මා දිට්ඨියේ අර්ථයන් එකතුකොට ගැනීම තුලින්මයි. ආර්ය අෂ්ඨාංගික මාර්ග යේ අර්ථයන් ජීවිතයට එකතුකොට ගැනීම තුලින්මයි. පින්වත් ඔබ සම්මා දිට්ඨියේ අර්ථයන් දූර්වලකොටගන්නා මොහොතක් පාසා සම්මා සම්බුද්ධ ශාසනය අතුරුදහන්කිරීමේ උපකාරක ධර්මයන්ට දායකවෙනවා.

බුදුරජාණන්වහන්සේ උතුම් සම්මා සම්බුද්ධත්වයට පත්වෙන දඹදිව සමාජයේ විමුක්තිය අරමුණුකොට ගන්න මිත්‍යා දෘෂ්ඨීන් 62 ක් තිබුණාය කියලා බුදුරජාණන්වහන්සේ බ්‍රහ්මජාල සූත්‍රයේදි දේශනා කරනවා. මේ සෑම දෘෂ්ඨියක්ම මනුෂ්‍යයා තුල මමත්වයේ කුණු හැව වන, සක්කායදිට්ඨිය පෝෂණය කරන අධර්මයන්, බුදුරජාණන්වහන්සේ හතලිස් පස්වසරක් උතුම් සද්ධර්මය දේශනා කළ ද, බුදුරජාණන්වහන්සේ පිරිනිවන් පාන මොහොත දක්වා මෙම දෘෂ්ඨීන් තව තව වැඩිවුණා මිස අඩුවක් නම් වුනේ නැහැ. ධර්මයේ නාමයෙන් අප්‍රමාදී නොවී, ප්‍රමාදයට පත්වෙන මනුෂ්‍යයෝ, ලෝකයේ ඉතිරිකොට තබා බුදුරජාණන්වහන්සේලා, මහරහතන්වහන්සේලා ලෝකයෙන් මිදී යනවා. උතුම් සම්බුදු වදනට අකීකරුවන සත්වයෝ නැවත නැවත දුකටම යනවා. ශාක්‍ය වංශයේ රජකිරුලේ උරුමය දරාගෙන පැමිණි, අභියෝග යන්ගෙන් තොරව එම ශාක්‍ය රජකිරුල හිමිකොට ගැනීමට සියළු අවස්ථාවන් තිබුණ නන්ද කුමරුන්ට, රාහුල කුමරුන්ට, ඥාති උරුමය ලෙස, පිය උරුමය ලෙස, උතුම් පැවිදි උපසම්පදාව ලබාදෙන්නේ, රාහුල ඔබට ලෝකය හදන්න බැහැ. ලෝකය යන ලෝකයකට ගියාදෙන්, පින්වත් රාහුල, ඔබ ලෝකයෙන් මිදී යන්න කියලයි. පින්වත් ඔබට මෙය සටහන් කරන භික්ෂුව ධර්මාවවාදයක් දෙනවා "ලෝකයට යන ලෝකයකට යන්න දෙන්න, පින්වත් ඔබ ලෝකයෙන් මිදීයන්න." අතීතයේ බුදුරජාණන්වහන්සේලා, මහරහතන්වහන්සේලා, ලෝකයාට ලබාදුන් පරම ආදර්ශය එයම නේද? මෙය සටහන් තබන භික්ෂුව

දෑස් දෙක පියාගෙන මොහොතක් මෙනෙහිකරනවා, අතීතයේ පටිච්චසමුප්පන්නව මට මුණගැසුන බුදුරජාණන්වහන්සේලා ලෝකයට ලබාදුන් එම පරම ආදර්ශයට පිටුපෑම නිසා ලෝකය හදන්නට ගොස් මම ලෝකයේ බන්ධනාගාරගතවීම නිසා, කොයිතරම් නම් දුක් කන්දරාවක් විඳින්නට ඇතිද කියලා. සම්මාසම්බුද්ධ ශාසන භාරකරත්වය දැරූ, බුදුරජාණන්වහන්සේලා ලක්ෂ ගණනක් පිරිනිවීයද්දීත්, උතුම් සද්ධර්මය දේශනාකොට වදාළ මහරහතන්වහන්සේලා කෝටි ගණනක් පිරිනිවීයත්දිත් ඒ උතුම් පරම ආදර්ශයට පිටුපා යමින් අපි තවමත් අප්‍රමාදීනොවී සටන් කරනවා. අප්‍රමාදීභාවය තුල තිබෙන සැපයත්, ප්‍රමාදීභාවය තුල තිබෙන දුකත්, යෝනිසෝ මනසිකාරයෙන් දකින පින්වතා, සැපත්, දුකත්, දෙකෙන්ම මිදීමේ මාවතට අවතීර්ණ වෙනවා.

# අශ්‍රද්ධාවේ අකීකරුකමට, හොඳම ඔසුව කල්‍යාණමිත්‍ර ආශ්‍රයයි

සාරිපුත්ත මහරහතන්වහන්සේගේ ගිහි කාලයේ නම උපතිස්ස. මේ පින්වත් උපතිස්ස තරුණයා, අස්සජි මහරහතන්වහන්සේගෙන් උතුම් සද්ධර්මය ශ්‍රවණය කරලා තෙරුවන් කෙරෙහි අචල ශ්‍රද්ධාවට පැමිණෙනවා. ධර්මයේ ඇස මතුකොටගන්න පින්වත් උපතිස්ස තරුණයා, තමන් සමග එකම ගුරු නිවසේ ශිල්ප හදාරමින් සිටි යහළුවන් සියළු දෙනාමත් එකතුකරගෙන බුදුරජාණන්වහන්සේ බැහැදකින්න යන්න සැරසෙන මොහොතේ, පින්වත් උපතිස්ස තරුණයාට සිතෙනවා, ගුරු ගෙදර තමන්ගේ ගුරුවරයා වන සංජය නැමති ගුරුවරයාවත් බුදුරජාණන්වහන්සේ හමුවීමට කැඳවාගෙන යන්නට ඕනෙය කියලා. පින්වත් උපතිස්ස තරුණයා තම ගුරුවරයාට කියනවා, ගුරුතුමනි ලොව්තුරා බුදුරජාණන්වහන්සේ ලෝකයේ පහළවෙලා තිබෙනවා, තෙරුවන් ලෝකයේ වැඩසිටිනවා, පින්වත් ගුරුතුමාත් එන්න අපිත් සමඟ බුදුරජාණන්වහන්සේ බැහැදකින්න යන්න කියලා. එවිට සංජය ගුරුවරයා කියනවා උපතිස්ස ඔබලා යන්න, ඔබ මගේ ගුරු ගෙදර සියළුම ශිෂ්‍යයින් එකතුකරගෙන යන්න. මම එන්නෙ නැහැ බුදුරජාණන්වහන්සේ දකින්න යන්න. මගේ ගෝලයින් සියළු දෙනාම මා අතහැරගියත්, මගේ පිරිස කවදාවත් අඩුවෙන්නේ නැහැ. මගේ ගුරු ගෙදර කවදාකවත් වසාදමන්නේ නැහැ. මොකද මම හොඳාකාරවම දන්නවා, ලෝකයේ අනුවණ පිංවතුන්, මෝඩ පිංවතුන් වැඩිය කියලා.

සංජය ගුරුවරයා, තම උපතිස්ස ශිෂ්‍යයාට කරන මේ ප්‍රකාශය, බුදුරජාණන්වහන්සේලා දේශනාකොට වදාළ අප්‍රමාදීභාවයට පිටුපාන ලෝකයාගේ සැබෑම තත්වය පෙන්වා දෙනවා. බුදුරජාණන්වහන්සේ ජීවමානව සිටි කාලයේදීත් ලෝකයේ සැබෑ තත්වය මෙසේනම්, මේ සංසාරික බිය නුවණින් මෙනෙහි කිරීමට දක්ෂ පින්වතා, ධර්ම මාර්ගයේ අප්‍රමාදීභාවයට පත්වීම හැර, වෙන කුමන විකල්පයක් ජීවිතයට එකතුකොට ගන්නද? මෙය සටහන් තබන භික්ෂුව පින්වතුන්ලාට යම් ධර්මයක් දේශනා කරනවා නම්, යම් ධර්මයක් සටහන් තබනවා නම්, එම ධර්මය සටහන් තබන්නේ ලෝකය හදන්න නොවේ, පින්වත් ඔබට ලෝකයෙන් මිදීයන්නයි. අතීතයේ බුදුරජාණන්වහන්සේලා ලක්ෂ ගණනක් පහළවෙලත්, දසරාජධර්මයෙන් රාජ්‍ය කරන සක්විති රජවරුන් ලක්ෂ ගණනක් පහළවෙලත්, හදන්න බැරිවුණ ලෝකයක් මේක. අපේ කාලයේ කාල්මාක්ස්, ලෙනින්, පිදෙල් කැස්ත්‍රෝ වැනි මහත්වරුන්ටත් හදනවා තබා, තමන්ටවත් ගොඩඑන්න බැරිවූ ලෝකයක් මේක. බුදුරජාණන්වහන්සේලා, මහරහතන්වහන්සේලා ධර්මමාර්ගය උපයෝගීකොටගෙන ලෝකයෙන් මිදීයත්දී මෝඩ අපි, තවමත් ලෝකය හදන්නට යනවා, නිවැරදි කරන්නට යනවා. සංස්කාරයන් වේගයෙන් අනිත්‍යභාවයට පත්වීගෙන යනවා, සංස්කාර අනිත්‍යභාවයට පත්වෙන වේගයෙන්, අපි නැවත නැවත වේගයෙන් සංස්කාරයන් රැස්කොටගන්නවා. සංස්කාරයන් විපාකදීමත්, සංස්කාරයන් රැස්වීමත් එකම ක්‍රියාන්විතයක ඇස්බැන්දුමක් බව නුවණින් දකින පින්වතා, සංස්කාර හේතුවෙන් සකස්වෙන විඤ්ඤාණය නැමති මැජික්කරුවාට නිරතුරුවම, සතියෙන් සිහියෙන් යුතුව වේවැල පෙන්වන අප්‍රමාදීභාවයට පත්වූ පිංවතෙක් වෙනවා.

අයෝනිසෝ මනසිකාරය තුල නිරතුරුවම යෝනිසෝ මනසිකාරය සැඟවී තිබෙනවා, අයෝනිසෝ මනසිකාරය තුලින් යෝනිසෝ මනසිකාරය මතුකොට දෙන්නේ කල්‍යාණමිත්‍ර ආශ්‍රය තුලින්, එක් පින්වත් මහත්මයෙක් තම හොඳම හිතවතෙකුට

ආර්යඅෂ්ඨාංගික ධර්මය සටහන් තැබූ පොතක් ධර්මදානයක් වශයෙන් පූජාකොට තිබෙනවා. ආර්ය අෂ්ඨාංගික මාර්ගය පොත අතට ගත්ත එම හිතවතා අපෝ මේ හාමුදුරුවන්ගේ පොත් මම කියවන්නේ නැහැ, මේ හාමුදුරුවො ධර්මය විකෘති කරනවා කියලා, එම පොත ප්‍රතික්ෂේප කරලා තිබෙනවා. එවිට ආගන්තුක හිතවතා ප්‍රකාශ කරල තිබෙනවා ඔයාට එපානම් බිරිඳ පොත කියවයි කියලා. බිරිඳට පොත පූජාකරලා තිබෙනවා. තම සැමියාගේ විරෝධය මැද්දේම බිරිඳ පොත කියවලා, එහි ධර්මානුකූල වටිනාකමක් දැකලා, ඒ බව තම සැමියාට කියලා තිබෙනවා. සැමියා එතනදීත් පොත ප්‍රතික්ෂේප කරලා. බලන්න අශ්‍රද්ධාවේ අකීකරුකමක අනතුරුදායකභාවය. නුවණැති බිරිඳ තම ස්වාමිපුරුෂයා කෙරෙහි අනුකම්පාවෙන් ස්වාමිපුරුෂයාට හොඳින් ඇසෙන්න පොත ශබ්දනගලා කියවලා තිබෙනවා. බිරිඳගේ උපක්‍රමශීලීභාවය හමුවේ පොතේ කරුනු තේරුම්ගත් ස්වාමිපුරුෂයා පසුව එම ධර්ම පුස්තකය බිරිඳගෙන් ඉල්ලාගෙන කියවලා තිබෙනවා. සතියකට විතර පස්සේ එම පින්වත් මහත්මයා, පොත පූජාකරපු මහත්මයාට දුරකථනයෙන් කතාකොට දැනුම් දෙනවලු ඔබ පූජාකරපු පොත් පිංච ගොඩාක් වටිනවා, මට මගේ පන්සලේ සිල් ඇත්තන්ට බෙදා දෙන්න පොත් පනහක් එවන්නය කියලා. ඉහත සිද්ධිය තුලින් පින්වත් ඔබට පැහැදිලි වෙනවා අනුවණභාවය තුල නුවණැතිභාවය සැඟවී තිබෙනවා. නමුත් ඔහු එය මතුකොටගන්නේ තම බිරිඳගේ කල්‍යාණමිත්‍ර උපකාරය තුලින්මයි.

# සීලය අර්ථවත් වීමටනම්, ඊට ඉහළින් ප්‍රඥාව තිබිය යුතුමයි

පින්වත් ඔබ කල්‍යාණමිත්‍ර ආශ්‍රය, සද්ධර්ම ශ්‍රවණය, ශ්‍රවණය කළා වූ සද්ධර්මය නුවණින් මෙනෙහි කිරීම තුලින් ඇතිකොට ගන්නා වූ තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාව අයත්වන්නේ ආර්ය අෂ්ඨාංගික මාර්ගයේ මුල්ම මාර්ග අංගයවන සම්මාදිට්ඨියට. අනුවණභාවයට එරෙහිව, නුවණැතිභාවයට ගොඩවෙන මුල් පියවර සම්මා දිට්ඨියයි. භවයේ සැපය උදෙසා වගේම භවගමනේ නිරෝධය උදෙසා, සම්මා දිට්ඨියේ ඇති වැදගත්භාවය නිසාම අති ප්‍රබල අනුවණ ලෝකයෙන් මිදී නුවණැති ලෝකයට ගොඩවන්නට උපකාරවන නිසාම, සම්මා දිට්ඨියත්, සම්මා දිට්ඨිය හේතුවෙන් සකස්වෙන සම්මා සංකප්ප කියන ධර්මථාවයන් බුදුරජාණන්වහනසේ පණවන්නේ ආර්ය අෂ්ඨාංගික මාර්ගයේ ප්‍රඥාවට අදාළ අංගයන් දෙක හැටියට. සමහර පින්වතුන්ලා ප්‍රශ්න කරනවා, ප්‍රඥාවට අදාළ අංගයන් දෙකක් ආර්ය අෂ්ඨාංගික මාර්ගයේ මුලට එන්නේ කොහොමද කියලා. බුදුරජාණන්වහන්සේ සීල, සමාධි, ප්‍රඥා වශයෙන් දේශනා කොට ඇති ධර්මමාර්ගයේ ප්‍රඥාවට අදාළ අංග දෙක වන සම්මා දිට්ඨියත්, සම්මා සංකප්පයනුත් ආර්ය අෂ්ඨාංගික මාර්ගයේ මුලට පැමිණීම ගැනයි මේ ප්‍රශ්නය සමහර පින්වතුන් නගන්නේ. මේ ප්‍රශ්නයට පිළිතුරු දෙන්න නම් පින්වත් ඔබ සම්මා දිට්ඨියට පත්වෙන්නට අවශ්‍යයි. මේ ප්‍රශ්නය පින්වත් ඔබ නිවැරදිව තේරුම් ගන්නෙත් ඔබ සම්මා දිට්ඨියට පත් වූ කෙනෙක් නම් පමණක්මයි. සීලයත් ආර්ය සීලයත්, සමාධියත් ආර්ය සමාධියත්,

ප්‍රඥාවත් ආර්ය ප්‍රඥාවත් කියන අර්ථයන්, පින්වත් ඔබ නිවැරදිව තේරුම් බේරුම් කොටගත් තැනදී, ඔබට ඔය ප්‍රශ්නය විසඳාගන්න පුළුවන්.

පෙර සටහනේ, භික්ෂුව සඳහන් කළ ආර්ය අෂ්ඨාංගික මාර්ගය පොත ප්‍රතික්ෂේප කළ පින්වත් මහත්මයා, සිල්පද පහ හොඳින් ආරක්ෂා කොටගන්නා පින්වතෙක්. ඒ කියන්නේ ආර්ය අෂ්ඨාංගික මාර්ගයේ සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව කියන සීලයට අයත් අංග තුන ආරක්ෂා කොටගෙන ජීවත්වන පින්වතෙක්. සීලයෙන් එම පින්වතා පරිපූර්ණ වුවත් ඔහු තුල සම්මා සංකප්පයන් වැඩිලා නැහැ. එම පින්වතා ධර්මරත්නය කෙරෙහි කිසිඳු ගෞරවයකින් තොරව ධර්ම පුස්තකය ප්‍රතික්ෂේප කරන්නේ, සංඝරත්නය කෙරෙහි කිසිඳු ගෞරවයකින් තොරව සද්ධර්මය විකෘති කරනවාය කියලා සංඝරත්නයට චෝදනා කරන්නේ, තමන්ට එම ධර්ම පුස්තකය පූජාකළ තම හොඳම හිතවතාගේ සිත රිදෙයි කියලාවත් නොසිතා එම පොත දැඩිව ප්‍රතික්ෂේප කරන්නේ. තම බිරිඳ එම ධර්ම පුස්තකය කියවනවාටත් ඔහු අකමැති වෙන්නේ ඔහු සීලයෙන් පරිපූර්ණ වූවත් සම්මා සංකප්පයන්ගෙන් දුර්වල නිසාමයි. ඔහුගේ සීලය සම්මා සංකප්පයන්ගෙන් පෝෂණය නොවූ නිසාමයි. සම්මා සංකප්පයන්ගෙන් පෝෂණය නොවීමට හේතුවන්නේ ඔහු සම්මා දිට්ඨියෙන් දුර්වල වීමයි.

ඉහත කාරණා තුලින්, පින්වත් ඔබට වැටහෙනවා ඇති, ආර්ය අෂ්ඨාංගික මාර්ගයේ සීලයට අදාළ අංග තුනට ඉහළින්, ප්‍රඥාවට අදාළව සම්මා සංකප්පයන් සහ සම්මා දිට්ඨිය බුදුරජාණන්වහන්සේ පනවන්නේ නිවැරදි සම්බුද්ධ දේශනාවන්ට අදාළව, ධර්ම මාර්ගය හඳුනාගැනීමට ධර්ම මාර්ගය ජීවිතයට එකතුකොට ගැනීමට, ප්‍රඥාව කියන අර්ථය තිබිය යුතුම නිසාමය. ප්‍රඥාවට අදාළ අංග දෙකවන සම්මා දිට්ඨියෙන් සහ සම්මා සංකප්පයන්ගෙන් පෝෂණය නොවූ සීලය දෘෂ්ඨිගත සීලයක් වශයෙනුයි පින්වතුන් තුල වැඩෙන්නේ. නමුත් මෙතනදී ප්‍රඥාව කියන්නේ, විදර්ශනා

නුවණින් පෝෂණය වූ ආර්ය ප්‍රඥාව නොවේ. කල්‍යාණමිත්‍ර ආශ්‍රය තුලින්, සද්ධර්ම ශ්‍රවණය තුලින්, නුවණින් මෙනෙහි කිරීම තුලින් සකස්කොට ගන්නා ලෞකික ප්‍රඥාවයි. ලෞකික ප්‍රඥාව කියන කාරණය පින්වත් ඔබ වචන කෙරෙහි පැටලෙන්නේ නැතිව, කරුණාවෙන් මෙසේ තේරුම් ගන්න උත්සාහ ගන්න. තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාව සකස්කොටගත් පින්වතෙක් සිටිනවා, නමුත් ඔහු තෙරුවන් කෙරෙහි අචල ශ්‍රද්ධාවට පැමිණිලා නැහැ. මේ තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාව ඇති පින්වතා තුල සම්මා දිට්ඨියේ, සම්මා සංකප්පයන්ගේ අර්ථයන් වැඩිලා තිබෙන්නේ. ඒ කියන්නේ ලෞකික ප්‍රඥාවට අදාළ ධර්මයන් වැඩිලා තිබෙන්නේ. නමුත් මේ තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාව ඇති පින්වතා, අසත්පුරුෂ ආශ්‍රයට වැටිලා පිරිහිලා යනවා. මොකද වුණේ මෙතනදී? ඔහු තුල වැඩී තිබූ ලෞකික ප්‍රඥාව පිරිහුනා. වෙනස්වෙන ප්‍රඥාව ලෞකික ප්‍රඥාවයි. නොවෙනස්වන ප්‍රඥාව ආර්ය ප්‍රඥාවයි. නමුත් මේ ලෞකික ප්‍රඥාව, පින්වත් ඔබට මේ දෘෂ්ඨි මතවාදවලින් ඔද්දල්වූ පංචඋපාදානස්කන්ධ ලෝකය තුල නිවැරදි ධර්ම මාර්ගය, පින්වත් ඔබට විවෘතකොට දෙනවා. ඉහතින් භික්ෂුව සටහන් කළ ලෞකික ප්‍රඥාව අසත්පුරුෂ ආශ්‍රය, පංචනීවරණ ධර්මයන් නිසා පිරිහීමට පත්වෙනවා. නමුත් පින්වත් ඔබ නිවැරදි කල්‍යාණමිත්‍ර ආශ්‍රය ලබමින්, සද්ධර්මය නුවණින් මෙනෙහිකිරීමට ඇති දක්ෂභාවය තුලින්, මේ ලෞකික ප්‍රඥාව, පින්වත් ඔබව ලෞකික ආර්ය අෂ්ඨාංගික මාර්ගය තුල පරිපූර්ණ භාවයට පත්කරනවා. සම්මා දිට්ඨිය තුලින් ලෞකික ප්‍රඥාව මෝදුකොටගෙන, ආර්ය අෂ්ඨාංගික මාර්ගය පරිපූර්ණ කොටගෙන සම්මා සතිය, සම්මා සමාධිය, පරිපූර්ණ පින්වතා තුල ආර්ය ප්‍රඥාව මෝදුවෙනවා. මේ ආර්ය ප්‍රඥාව කියන්නේ විදර්ශනා නුවණ මුසු වූ නොවෙනස්වන ප්‍රඥාවයි. ඔහු ලෞකික ප්‍රඥාව තුලින් මෝදුකොටගත් ආර්ය ප්‍රඥාවෙන් සමස්ත ආර්ය අෂ්ඨාංගික මාර්ගයම, විදර්ශනා නුවණින් දකිමින් අවබෝධ ඥාණයන් සකස්කොට ගන්නවා. ඉහත කාරණා තුලින් පින්වත් ඔබ තේරුම්ගන්න ඕනේ, ලෞකික ප්‍රඥාවේ ඵලයයි ආර්ය ප්‍රඥාව කියන කාරණය. කල්‍යාණමිත්‍ර

ආශ්‍රය ඔස්සේ, ආර්ය අෂ්ඨාංගික මාර්ගයට ඇතුල්වීමේ දොරටුව, ලෞකික ප්‍රඥාවේ අර්ථයෙන් පෝෂණය වන අතර ආර්ය අෂ්ඨාංගික මාර්ගය පරිපූර්ණකොටගත් පින්වතා, අවබෝධ ඥාණයන්ගෙන් පරිපූර්ණ නොවෙනස්වන ආර්ය ප්‍රඥාවේ උරුමය ලබාගන්නවා. සටහනේ ඉහතින් සටහන් කළ ආර්ය අෂ්ඨාංගික මාර්ගය පොත ප්‍රතික්ෂේප කළ පින්වතා තම බිරිඳගේ උපක්‍රමශීලීභාවය හමුවේ, බිරිඳ හඬනගා කියවූ ධර්ම කරුණු නුවණින් විමසා, ලෞකික ප්‍රඥාව මෝදුකොටගත්තා. නමුත් මේ ලෞකික ප්‍රඥාව පිරිහෙනවා. පසුගිය සතියේ පොත් පනහක් ගෙන්වා ගන්න එම පින්වතා නැවතත් එම පොත ද්වේශයෙන් විවේචනය කොට ප්‍රතික්ෂේප කරන්න පුළුවන්. ආර්ය අෂ්ඨාංගික මාර්ගයට පින්වතුන්ලා අවතීර්ණ කරන ලෞකික ප්‍රඥාවේ ස්වභාවයන්, ආර්ය අෂ්ඨාංගික මාර්ගය පරිපූර්ණ කිරීමෙන් ලබන, ආර්ය ප්‍රඥාවන් යනු අර්ථයන් දෙකක් බව පින්වත් ඔබට ඉහත සටහනින් වැටහී යනු ඇත.

# සංස්කාරයන්ගේ ඵලයක් වූ දෙවියන්, කොහොමද අනුනගේ සංස්කාරයන් වෙනස් කරන්නේ?

පින්වත් මහත්මයෙක් භික්ෂුවගෙන් ප්‍රශ්නයක් විමසුවා, ස්වාමීන්වහන්ස, රටක් සෞභාග්‍යමත් කිරීමට දෙවියන්ට හැකි ද කියලා. රටක් සෞභාග්‍යමත් කිරීමට හෝ රටක යුධමය විනාශයන් නැවැත්වීමට දෙවියන්ට බැහැ. දෙවියා කියන්නෙත් සංස්කාරයන්ගෙ ඵලයන්, සංස්කාරයන්ගේ ඵලයක්වූ දෙවියන් කොහොමද අනුනගේ සංස්කාරයන් වෙනස් කරන්නේ. රටක යුධමය පරිසරයක්, උදාවෙනවාය කියන්නේ රටේ ජනතාවගේ අකුසල් විපාකයන්ගේ ඵලයන්. ජනතාව කියනකොට පාලක පින්වතුන්ලාත් ගැනෙනවා. රටක සාමකාමී පරිසරයක් උදාවෙනවාය කියන්නේ ජනතාවගේ කුසල් සංස්කාරයන්ගේ ඵලයන් මේවා දෙවියන් කරන දේවල් හෝ දෙවියන්ට වෙනස්කළ හැකි දේවල් නොවේ.

අනාගතයේ දිව්‍යතලවල දෙවියන් අධාර්මික වුනොත් එම හේතුව නිසාම දෙවියන්ගේ අකුසල් පක්ෂය වැඩි වී එම අකුසල් විපාකයන් නිසාම දැනට තව්තිසාවේ වැඩසිටින සෝවාන්ඵල අවබෝධය සාක්ෂාත්කොට ගත්, ශක්‍ර දෙවියන් ව එම තනතුරින් චුතවී අනාගාමී බ්‍රහ්මතලයන්ට එසේත් නැතිනම් නිවන් අවබෝධය ලබා ලෝකයෙන් පිරිනිවීයන්නත් පුළුවන්. සෝවාන්ඵලයට පත් වර්තමාන ශක්‍ර දේවියන්ගේ චුතවීමෙන් හිස්වෙන, තව්තිසාවේ ශක්‍රදෙව් තනතුරට අධාර්මික, කාමයන්ට

ලැදි, අකුසලයන්ට ගැලපෙන අලුත් ශක්‍ර දෙවියෙක් පත්වේවි. මේ සියල්ල සිදුවෙන්නේ සංස්කාරයන්ගේ හේතුඵල ධර්මයන්ට අනුවමය.

පින්වත් ඔබේ රටට සාමකාමී පරිසරයක් අවශ්‍යනම්, අනිවාර්යයෙන්ම රටේ ජනතාව ජාති ආගම් භේදයකින් තොරව, ලෝභ, ද්වේෂ, මෝහ අකුසල් මූලයන්ගෙන් බැහැරව මම කියන දෘෂ්ඨියෙන් මිදී අපි හැටියට සිතමින් සාමූහිකව කටයුතුකළොත්, ධාර්මික ජීවිත ගතකළොත්, එම කුසල් සංස්කාරයන්ට අදාළව සාමකාමී පරිසරයක් සමාජයට උරුමවෙනවා ඇත. මේ සියල්ල සංස්කාරයන්ගේ හේතුඵල ධර්මයන්. සංස්කාරයන්ට අදාළවයි මනුෂ්‍යයාගේ ප්‍රචණ්ඩත්වයට හෝ සාමකාමීබවට අදාළ විශේෂවූ දැනීම් "විඤ්ඤාණය" සකස්වෙන්නේ.

රටක දීර්ඝකාලීන යුධමය ගැටුම් ඇති වී විනාශයන්, මනුෂ්‍ය ඝාතන, ප්‍රචණ්ඩත්වය වැනි ක්‍රියාවන් බහුලවෙනකොට, රටේ ජනතාව මරණබිය නිසාම මමත්වයේ දැඩිභාවය සියුම්කොටගෙන "අපි" කියන, අනුන්ගැන සිතන, පොදු මතයකට එනවා. රටට සෙත්පතා සාමූහිකව පින්කම් කරනවා, ආරක්ෂක හමුදාවන්ට සෙත්පතා පින්කම් කරනවා, ලේ බැංකු ඉදිරියේ දහස්ගණන් පෝලිම් ගැසී ලේ දන්දෙනවා, අනුන් උදෙසා බෝධිපූජා පවත්වනවා, සර්ව රාත්‍රික පිරිත් පින්කම් සිද්ධ කරනවා. ආගම් භේදයකින් තොරව ජනතාව කණ්ඩායමක් වශයෙන් මමත්වය සියුම්කොට ගනිමින් අපි කියන තැනට ඇවිත් කටයුතු කරනවා.

ඒ වගේමයි රටක යුධමය ගැටුම් හේතුවෙන්, මරණබිය නිසාම රටේ සිදුවන දරුණු වියරු ප්‍රචණ්ඩත්වය නිසාම, දේපල විනාශයන් නිසාම, ළමා, තරුණ, මහළු භේදයකින් තොරව සිදුවන හිංසනයන් නිසාම සමාජයේ ජීවත්වන මනුෂ්‍යයින් තුල අනිත්‍ය සංඥාවන් වැඩෙනවා. සිතා ගන්න බැරි මනුෂ්‍ය ඝාතන සිද්ධවෙන කොට, සිතාගන්න බැරි දේපල විනාශයන් සිද්ධවෙනකොට, මරණබිය නිසාම මනුෂ්‍යයා තුල අනිත්‍ය සංඥාවන් මතු වී එනවා. ජනතාව

තුල අමෝහයට අදාළ ධර්මයන් වැඩෙනවා. අනිත්‍ය සංඥාවන් වැඩීම තුල සකස්වෙන අමෝහය නිසා මමය, මගේය කියලා මමත්වයේ දැඩිභාවයෙන් ගන්නා වූ ලෝභ සිත් සියුම් වෙනවා. ඒ නිසාම ද්වේශය හීනවෙනවා. මේ සියල්ල අවබෝධාත්මකව වෙන දේවල් නොවේ, සමාජය තුල ක්‍රියාත්මකවෙන මරණ බිය නිසාම ඇතිවෙන ප්‍රතික්‍රියාවන්. නමුත් බහුතරයක් මනුෂ්‍යයින් තුල අලෝභ, අද්වේශ, අමෝහ ධර්මයන් වැඩෙනවා. යුධමය තත්වයන් නිසා හෝ මරණබිය නිසා හෝ මනුෂ්‍යයා තුල අනිත්‍ය සංඥාවන් වැඩෙනවා කියන්නේ, වර්තමානයට අදාළව ශක්තිමත් කුසලයක්. යුධමය හේතූන් නිසා සකස්වෙන විනාශකාරීත්වයේ ඵලයන් හැටියට, බහුතරයක් ජනතාවගේ සිත් තුල කුසල් පක්ෂය ශක්තිමත් වෙනකොට එම කුසල් සංස්කාරයන්ගේ බලවත්භාවයේ හේතුඵල ධර්මයන් නිසාම, එම යුධමය පරිසරයන්, ගැටුම්කාරී පරිසරයන් අවසන්කොට දැමීමට සුදුසු ශක්තිමත් නායකයින් පහළ වෙනවා. රටක අර්බුදකාරී යුධමය තත්වයන් තාවකාලිකව හෝ විසඳා ගැනීමට සුදුසු නායකයින් රටක පහළ වෙන්නේ, ජනතාව තුල වැඩෙන, කුසල් සංස්කාරයන්ගේ හේතුඵල ධර්මථාවයන් නිසාමයි.

නමුත් දීර්ඝ, අමිහිරි, කටුක, අර්බුදකාරී යුධමය තත්වයන් අවසන් වී සාමකාමී තත්වයත්, පරිසරයත්, සමාජය තුල උදාවුනාට පස්සේ රටේ ඇතිවෙන නිදහස් සාමකාමී පරිසරය නිසා, සමාජයේ මරණබිය, ප්‍රචණ්ඩත්වයේ බිය, පහවයනවා. ජනතාව තුල මරණබිය පහව ගිය විට ජනතාව නැවතත්, "අපි" කියන පොදු කණ්ඩායම් හැඟීමෙන් මිදී "මම" කියන මමත්වයේ දැඩිභාවය වර්ධනය කොටගන්නවා. මරණ බිය පහවී ගිය, සාමකාමී වාතාවරණය යටතේ මනුෂ්‍යයා දැන්, රටට ජනතාවට සෙත්පතා පොදුවේ පින්කම් කරන්නේ නැහැ, ආරක්ෂක හමුදාවන්ට සෙත්පතා පින්කම් සිදුකරන්නේ නැහැ, අනුන් උදෙසා බෝධීන් වහන්සේලා අභියස රැස්වෙමින් බෝධිපූජා පවත්වන්නේ නැහැ. ලේ දන්දෙන්න පරිත්‍යාගශීලීත්වයෙන් දහස්ගණන් පෝලිම් ගැසෙන්නේ නැහැ. අපි කියන පොදු අර්ථයෙන් බැහැර වෙලා,

මම, මගේ පවුල කියන අර්ථයන් ශක්තිමක්කොට ගන්නවා. සෑම පින්වතෙක්ම අනුන් ගැන නොසිතා, නොසොයා, තමාගේම ගොඩ ශක්තිමත් කිරීමේ ව්‍යායාමයක යෙදෙනවා. මනුෂ්‍යයා තුල මමත්වයේ දැඩිභාවය වර්ධනය වෙනවා කියන්නේ, ලෝභීබව වැඩිවෙනවා. ලෝභය නිසාම ද්වේශය වර්ධනය වෙනවා. මරණබිය පහවී ගොස් සමාජය සාමකාමී වෙනකොට ජනයාට මරණබිය, මළකඳන්, ප්‍රචණ්ඩත්වය අත්නොවිඳින නිසා ජනතාව තුල අනිත්‍ය සංඥාවන් දශමයකින්වත් වැඩෙන්නේ නැහැ. වැඩිහිටියන් මුදල් පසුපස හඹායනවා, දරුවන් අධ්‍යාපන ඉලක්කයන් පසුපස හඹායනවා, මුදල් තිබෙන මනුෂ්‍යයින් කාමයන් පසුපස හඹායනවා, මුදල් නැති මනුෂ්‍යයන් අහිංසකයින් ගොදුරුකොට ගැනීමට හඹායනවා, තරුණ පින්වතුන් මෝස්තර පසුපස හඹායනවා. කිසිම මනුෂ්‍යයෙක් තුල අනිත්‍ය සංඥාවන් වැඩෙන්නේ නැහැ. බහුතරයක් ජනතාව නිත්‍ය සංඥාවන් පසුපස යමින් කාමයන්ම වඩමින් සුවසේ ජීවත්වෙනවා. මේ ජනතාව තුල වැඩෙන නිත්‍ය සංඥාවන් නිසා නැවත යුධමය තත්වයන් ගැන ජනතාව සිහිනයක්වත් දකින්නේ නැහැ. සාමකාමී පරිසරයක් තුල මනුෂ්‍යයාගේ ලෝභ, ද්වේශ, මෝහ අකුසලයන් බුර බුරා මෝදු වී එම අකුසලයන්ගේ හේතුඵල ධර්මයන් හැටියට, අනාගතයේ නැවත සමාජ අර්බුදයක් ඇති වී, ජනතාවට නැවත මරණබිය ප්‍රචණ්ඩත්වය හරහා අකුසල් විපාකයන් ලබාදෙනවා. රටේ ජනතාවගේ ක්‍රියාකාරීත්වය හේතුවෙන් සකස්වෙන, කුසල්, අකුසල් සංස්කාරයන්ගේ ඵලයන් හැටියට, තට්ටුමාරු ක්‍රමයට ලෝකයට, රටට යහපත සහ අයහපත, යුද්ධය සහ සාමය උදාකොට දෙනවා. මෙම ක්‍රියාන්විතය ලෝකය හටගත් දා පටන් පැමිණෙන ධර්මථාවයක් වෙනවා.

පින්වත් ඔබ මේ සටහන කියවා ඔබේ හෘද සාක්ෂියට තට්ටු කොට අසන්න, රටේ යුධමය ගැටුම් උග්‍රව පැවැති අවධියේ, ඔබ තුල වැඩුණු, අනිත්‍ය සංඥාවන් දැන් ඔබ තුල වැඩෙනවාද කියලා. එදා "අපි" කියන අරමුණෙන් පින්කම් කරපු අපි, අද "අපි" කියන අරමුණෙන් පින්කම් සිදුකරනවාද කියලා. මරණ බිය

පහව ගිය සමාජයක මෝදුවෙන මමත්වයේ දැඩිභාවය, අකුසල් කඳු නැවත නැවත මෝදු කොට දෙනවා.

පින්වත් ඔබ දක්ෂවෙන්න යුද්ධයත්, සාමයත් යන දෙකම මාරයාට අයත් ධර්මථාවයන් දෙකක් බව හඳුනාගන්න. යුද්ධයත්, සාමයත්, දෙකම හටගන්නේ මනුෂ්‍යයාගේ පංචඋපාදානස්කන්ධ මාරයා තුලින්මයි. පින්වත් ඔබ සාමය ඉදිරියේ සතුටින්, බලාපොරොත්තු සහගතව ජීවත්වුනත් පින්වත් ඔබ නුවණින් තේරුම්ගත යුතුයි සාමය තුලදියි, මාරයා යුද්ධයකට අවශ්‍ය සාධක සකස්කොට ගන්නේ. යුද්ධයකට අවශ්‍ය සාධක තමයි විනාශකාරීත්වයේ ප්‍රචණ්ඩත්වයේ මූල බීජය තමයි, ලෝභ, ද්වේශ, මෝහ අකුසල් මූලයන්. යුද්ධය වගේම උතුම් සම්මාදිට්ඨියේ අර්ථයන්ගෙන් පෝෂණය නොවූ සාමය තුලත් භයානක අනතුරුදායකභාවයක් සැඟවී තිබෙනවා. එම නිසා පින්වත් ඔබ යන්නන් වාලේ, අත්වැල් අල්ලාගෙන, විනාශයකරා නොගොස් තනි තනිව හෝ උතුම් සද්ධර්මයේ අර්ථයන් ජීවිතය තුලට ගොනුකොට ගැනීමට දක්ෂවෙන්න. සාමයට රැවටෙන්නා යුද්ධයට කොටුවෙනවාය කියන කාරණය ධර්මථාවයක්. පින්වත් ඔබ සමාජය තුල ඇති වී තිබෙන්නා වූ සාමයට නොරැවටී මේ මොහොතේ ඔබේ සිතේ ඇවිලෙන මමත්වයේ ලෝභ, ද්වේශ, මෝහ යුධගිනිදැල් අවම කොටගන්න දක්ෂ වෙන්න. මම කියන මමත්වයේ දැඩිභාවයෙන් මිදී අපි කියන සහෝදරත්වයෙන්, කුසල් මූලයන් ශක්තිමත්කොට ගන්න දක්ෂ වෙන්න.

# ජීවිතයත්, ධර්මයත් එකක් බවට පත්කොට ගන්න

පින්වත් ඔබ ජීවත්වන සෑම නිමේෂයකදීම, අකුසල් මූලයන් ජීවිතයට එකතුකොට ගැනීමේ ක්‍රියාන්විතයක නිරතවෙලයි සිටින්නේ. පින්වත් ඔබ දානමය පින්කම් සිදුකළත්, සීලමය පින්කමක් සිදුකළත්, භාවනාමය පින්කමක් සිදුකළත්, පන්සලක බෝධිපූජාවක් සිදුකළත්, ලෝභ සිතක්මයි ඇතිකොට ගන්නේ. මගේ පින්කම, මගේ දානය, මගේ සීලය, මගේ සමාධිය මේ සෑම ක්‍රියාවකදීම මගේ ගොඩමයි වැඩිකොට ගන්නේ. සවසකට ප්‍රධාන විහාරස්ථානයකට ගිහින් බලන්න, බෝධීන්වහන්සේ අභියස, බෝධිපූජා තබන සෑම පින්වතෙක්ම බලාපොරොත්තුවෙන්නේ මෙලොවදී ලැබෙන සැපයන්මයි. විභාගය, රැකියාව, විවාහය, අපලය, අගහිඟකම්වලින් මිදීම, අනාගත සැපය, දරු සම්පත් පින්කම්වල නාමයෙනුත් ලෝභ සිත් නිරතුරුවම වැඩෙනවා. පින්වත් ස්වාමීන්වහන්සේ නමක්, තමන්ගේ දායක මහත්මයෙකුට කියනවා, ඔබලාට අවුරුදු ගණනාවක් ධර්මය කියලා දීලා තිබෙනවා. ඔබලා හොඳින් ජීවත්වෙන්නේ මම ධර්මය කියලා දීපු නිසා, එම නිසා ඔබලා සියළුදෙනා එකතුවෙලා මට ගුරු උපහාර පින්කමක් කරන්නය කියලා. ධර්මයේ නාමයෙන් මමත්වයේ දැඩිභාවයම මෝදුකොට ගන්නවා. අනුනටත්, ඒ ආදර්ශයම ලබාදෙනවා.

පින්වත් ඔබ ඔබේ ජීවිතයේ එදිනෙදා කටයුතු ගැන සිහිපත් කරගන්න. පින්වත් ඔබේ නිවසේ තිබෙන, කණ්නාඩි මේසය සිහියට නගාගන්න. එම කණ්නාඩිමේසය නිසා, ඔබ

මොනතරම් අකුසල් මූලයන් ජීවතයට එකතුකොට ගන්නට ඇති ද? කණ්නාඩි මේසයමත තිබෙන, පවුඩර් පෙට්ටිය නිසා සුවඳ විලවුන් බෝතලය නිසා, හිස පීරන පනාව නිසා, පින්වත් ඔබ රූපය කෙරෙහි මොනතරම් ලෝභ සිත් ඇතිකොටගන්නට ඇති ද? රූපය කෙරෙහි ලෝභ සිතින්, ඔබ මුහුණේ තවරාග ත්නා පවුඩර් ටික, සුවඳවිලවුන් ටික, දහදියට සේදී ගියත් රූපය කෙරෙහි ඔබ ඇතිකොටගන්නාවූ ලෝභ සිත ඔබව භවයට රැගෙන යනවා. පින්වත් ඔබ රසකරමින් අනුභව කරන ආහාරය නිසා, මොනතරම් ලෝභ සිත් ඔබ ඇතිකර ගන්නවාද? රූපය කෙරෙහි තෘෂ්ණාවෙන්, රසය, ගුණය, නිරෝගීභාවය කෙරෙහි තෘෂ්ණාවෙන් ඔබ අනුභව කරන ආහාරය අවසානයේ දී නිවසේ වැසිකිලිවලේ තැන්පත් වුවත් එම ආහාරය නිසා සකස් වූ ලෝභ සිත ඔබව භවයට රැගෙන යනවා. පින්වත් ඔබ ලෝභ සිතින් අල්මාරියේ තැන්පත්කොට තිබෙන, වටිනා ඇඳුම් පැළඳුම් යම් දවසක දිරා අවපැහැගන්වී ගියද, එම ඇඳුම් පැළඳුම් නිසා සකස්කොටගත් ලෝභ සිත, ඔබව භවයට රැගෙන යනවා. අනිත්‍ය වූ රූපය අනිත්‍ය වශයෙන් නොදැකීම නිසාම අනිත්‍ය වූ වේදනාව, සංඥාව, සංස්කාර, විඤ්ඤාණය, අනිත්‍ය වශයෙන් නොදකින නිසාම, රූපය ඇසුරින් ඔබ සකස්කොටගන්නා සෑම සිතුවිල්ලක්ම අකුසල් මූලයන් බවටයි පත්කොටගන්නේ.

පින්වත් ඔබ මේ පිනවීමට උත්සාහ දරණ ඇස, කන, නාසය, දිව, ශරීරය මනස කියන්නේ කුමක්ද? බුදුරජාණන්වහන්සේ පටිච්චසමුප්පාද ධර්මයේදී ආයතන හය සළායතන වශයෙනුයි හඳුන්වන්නේ. සළායතන ඉපදුනේ නාමරූප ධර්මයන් හේතුවෙන්, නාමරූප ධර්මයන් සකස්වුණේ විඤ්ඤාණය හේතුවෙන්, විඤ්ඤාණය සකස්වුනේ සංස්කාර හේතුවෙන්, සංස්කාර සකස්වුණේ අවිද්‍යාව හේතුවෙන්, අවිද්‍යාව කියන්නේ චතුරාර්ය සත්‍යය නොදැනීම, දැන් පින්වත් ඔබ නුවණින් මෙනෙහිකොට බලන්න, ඔබේ ඔය ඇස කියන්නේ, කන කියන්නේ නොදන්නාභාවය නිසා ඉපදුන දෙයක්, අසත්පුරුෂ ආශ්‍රය නිසා, පංචනීවරණ ධර්මයන් නිසා ඉපදුන දෙයක්.

නොදන්නාභාවය ඇසේ ඉපදීමට හේතුවුණා. කාමච්ඡන්ද, ව්‍යාපාද, ථීනමිද්ධ, උද්ධච්ච කුක්කුච්ච, විචිකිච්ඡා කියන ව්‍යාධි ධර්මයන් ඇස ඉපදීමට හේතුවුණා. මේක පවුකාර ඇසක්, පවින් උපන් ඇසක්, කාමච්ඡන්දයට අයිති ඇසක් නිදිමතට අයිති ඇසක් විසිරෙන සිතට හේතු බීජයන් සකස්කොට දෙන ඇසක්, සැකයට හේතු බීජයන් සකස්කොට දෙන ඇසක්, පින්වත් ඔබ ඇස ඉහත ආකාරයට කමටහනක් කොටගෙන ඇස නිසා, රූපය නිසා අකුසල් මූලයන් ඇතිකොටගන්න එපා.

පටිච්චසමුප්පන්නව ඉපදුන අතීත ඇස නිසා අතීත රූපයන් නිසා පින්වත් ඔබ ලක්ෂ වාරයක් හිස්ගැසුම් කන්නට ඇති. ලක්ෂ වාරයක් එල්ලුම්ගස් යන්නට ඇති. ලක්ෂ වාරයක් යුධ කෝලහාලවලට මැදිවී මැරුම් කන්නට ඇති. නොදන්නාභාවය නිසාම, උපන් ඇස, කන, නාසය, දිව, ශරීරය, මනස දුකක්, දුකට හේතුවක්, එම නිසාම පින්වත් ඔබ ඇසෙන් රූපයක් දැකලා එම රූපයට ඇලෙන්න ගැටෙන්න එපා. කනෙන් ශබ්දයක් අසලා එම ශබ්දයට ඇලෙන්න ගැටෙන්න එපා. පින්වත් ඔබ මුලසිට උපේක්ෂාව තුලට ජීවිතය ගන්න. දෙවැනිව රූපයක් ඇසුරෙන් සැප වේදනාවක් දැනෙනකොට අනිත්‍ය කියලා දකින්න. දුක්වේදනාවත් දැනෙනකොට අනිත්‍යයි කියලා දකින්න. පින්වත් ගිහි පින්වතුන්ලා ධර්මයට බියෙන් ජීවිතයෙන් පලායන්න එපා. විඳීම්වල අනිත්‍යභාවය දකිමින් ජීවිතය බුක්තිවිඳින්න. එවිට ජීවිතයත් ධර්මයත් දෙකම එකක් වෙනවා. එසේ නොවුන තැනදී ජීවිතයත් අධර්මයත් එකක් බවටයි පත්වෙන්නේ.

ජීවිතයත්, ධර්මයත් එකක් බවට පත්කරගත්ත පින්වතෙක් භික්ෂුවව මුණගැසුණා. ඔහු ඈත ගමක ජීවත්වෙන වෙදමහත්මයෙක්. තමන් කරන වෙදකමට මුදල් අයකරන්නේ නැහැ. රෝගියා කැමැත්තෙන් දුන්නොත් මුදලක් ගන්නවා. මෙය සටහන් තබන භික්ෂුවගේ සුවවීම ප්‍රමාදවෙමින් පැවැති ඇඟිල්ලක ආබාධයකට ඒ වෙදමහත්මයා කළ ප්‍රතිකාරයෙන් ඇඟිල්ල සුවපත්වුණා. අද උදේ, කුටියේ කැපකරු මහත්මයා,

වෙද මහත්මයා ලබාදුන් බෙහෙත් පත්තුව ඇඟිල්ලේ බඳිනකොට භික්ෂුව එම මහත්මයාගෙන් විමසුවා, කුමකින්ද ඔය බෙහෙත් පත්තුව හැදුවේ කියලා. එවිට කැපකරු කියනවා, උඳු, ගම්බිත්තර සහ මී පැණි එකතුකරලයි පත්තුව හැදුවේ කියලා. භික්ෂුව එතකොටයි දැනගන්නේ සිංහල වෙදකමට ගම් බිත්තරත් ගන්නවාය කියලා. බෙහෙත් පත්තුව ඇඟිල්ලට බඳිනකොට භික්ෂුවට සිතුනා, මේ වෙදමහත්මයා නිර්මාංශ පින්වතෙකුට ගම් බිත්තර පත්තුව බැන්දානම් කුමකින් කුමක් සිදුවේවිද කියලා. ගම්බිත්තර බෙහෙත් පත්තුව තුලත් කුකුළෙක් බිත්තරයක් දැකලා හරිම ජංජාලයක් වෙනවා.

# ඔබ හෙලන සෑම කඳුලක්ම, සංසාරයේ ඔබ අනුනට දුන් කඳුලක්මයි

කුකුළා ගැන සටහන් තබන කොට කැලයේදී නිතරම මුණගැසෙන සතෙක්වන මොනරාව මතකයට පැමිණියා. කුරුලු ලෝකයේ අනිකුත් කුරුල්ලන්ට වඩා, මොනරාගේ ජීවන චර්යාවන් බොහෝමයක් වෙනස් ස්වරූපයන් ගන්නවා. අනෙක් කුරුල්ලන් නිරතුරුවම ජීවත්වෙන්නේ ජෝඩු වශයෙන්. එම කුරුල්ලන් රාත්‍රියට ගසක ලගින්නේ ජෝඩුව වශයෙන්. ආහාර සොයා යන්නේ, කූඩු හදන්නේ, බිත්තර රකින්නේ, කුරුලු පැටවුන් පෝෂණය කරන්නේ කුරුලු ජෝඩුව එකතුවෙලා සහයෝගයෙන්. නමුත් මොනරා සහ සෙබඩගේ ජීවන චර්යාවන් මීට වඩා හුඟක් වෙනස් ස්වරූපයක් ගන්නවා. මොනරා හුඟක් වෙලාවට ජීවත්වෙන්නේ තනිවම. මොනරා කවදාකවත් සෙබඩත් සමග රාත්‍රියට එක ගසක ලගිනවා, භික්ෂුව දැකලා නැහැ. මොනරා සහ සෙබඩ ලිංගිකව හැසිරෙන කාලයට පමණක් දින තුන හතරක් සමීපව හැසිරෙනවා. ලිංගිකව හැසිරෙන කෙටි කාලය තුලත් මොනරා සහ සෙබඩ එක ගසේ, රාත්‍රියට ලගින්නේ නැහැ. එම සතුන්ගේ ශරීරයට, ශරීරය ස්පර්ශ වී ලබන ලිංගික ක්‍රියාවලියක් නොවේ, තිබෙන්නේ. වෙනත් අස්වාභාවික ලිංගික ක්‍රියාවලියක්. මේ සතුන් දෙදෙනා දින දෙක තුනක් දහවල් කාලයට සමීපව හැසිරිලා වෙන්වෙලා යනවා. නැවත සම්බන්ධවීමක් නැහැ. ඊට පසුව සෙබඩ තනිවම කූඩුව හදලා, බිත්තර රැකලා, තනිවම පැටවුන් පෝෂණය කරලා, ලොකු මහත් කරනවා. මොනරාගේ කිසිම ආදරයක්, රැකවරණයක් සහයෝගයක් ලැබෙන්නේ

නැහැ. පැටව් ලොකු වුනාට පස්සේ, සෙබඩ නැවතත් දින දෙක තුනක් මොනරා සමීපයට පැමිණ, බිත්තර ඇති වීමට අවශ්‍ය සාධක සකස්කොටගෙන වෙන්ව යනවා. සෙබඩට කවදාකවත් ස්වාමිපුරුෂයෙකුගේ රැකවරණය, ආදරය, සහයෝගය ලැබීමක් නැහැ. එපමණක් නොවේ. අනෙකුත් සතුන් ශරීරයට, ශරීරය ස්පර්ශ වී ලබන ලිංගික ආශ්වාදයත් අහිමියි.

මේ සෙබඩ කියන්නේ, වෙන කවුරුවත් නොවේ. අතීත භවයක කාන්තා විමුක්තියේ නාමයෙන් පුරුෂාධිපත්‍යයට එරෙහිව සටන්කළ කාන්තාවක්මයි. හේතුඵල ධර්මයන් විසින්ම සෙබඩට පුරුෂයෙකුගේ රැකවරණය සහයෝගය ආදරය අහිමිවෙලා. වර්තමාන සමාජයේ සමහරක් පින්වතියන් සමාජයෙන් ලැබෙන වැරදි ආදර්ශයන් හේතුවෙන් ධර්මානුකූලව කර්මය කර්මඵල විශ්වාසයේ ඇති දුර්වලතාවය හේතුවෙන් නිරතුරුවම, තම ස්වාමිපුරුෂයත් සමග ගැටෙන දිශාවන්ට ස්වාමිපුරුෂයන් ප්‍රතික්ෂේප කරන දිශාවන්ට ගමන් කරනවා. ඔබට ලැබුණ ස්වාමීපුරුෂයා, අකීකරු කෙනෙක් නම්, ඔබට ලැබුණ ස්වාමිපුරුෂයා ආදරය නොහඳුනන කෙනෙක් නම්, එය ස්වාමිපුරුෂයාගේ වරදක් නොවේ. පින්වත් බිරිඳගේම අතීත අකුසල් විපාකයන් බව තේරුම්ගත යුතුයි, අපේ වරදට, අනුනට දොස් පවරලා වැඩක් නැහැ. බිරිඳගේ අතීත අකුසල් විපාකයන්, විපාකයට එනකොට, ඔබ ස්වාමිපුරුෂයා සමග ගැටෙන දිශාවට ගියොත් ස්වාමිපුරුෂයාව ද්වේශයෙන් ප්‍රතික්ෂේප කිරීමේ දිශාවට ගියොත්, ඔබ අතීත අකුසල් හේතුවෙන් වර්තමානයේ තව අකුසල් රැස්කොටගන්නා අවාසනාවන්තියක් වෙනවා.

පින්වත් ඔබගේ යුගදිවිය කඳුළු කථාවක් නම්, එම කඳුළුවලට එරෙහිව පින්වත් ඔබ කවදාකවත් සටන් කරන්න යන්න එපා. ඔබ දක්ෂවෙන්න, ඔබ හෙලන, සෑම කඳුලක්ම ඔබ සංසාරයේ, අනුනට දුන් කඳුලක්ම බව නුවණින් දකින්න. වේගයෙන් සිල් පද දුර්වලකරගන්නා සමාජයක, වේගයෙන් අකුසල් මූලයන් වර්ධනය කොට ගන්නා සමාජයක, සම්මා දිට්ඨියේ අර්ථයන් ජීවිත තුලින් සොදාපාළුවී යන සමාජයක, ආදරය නැමැති

වචනයේ අර්ථය, රාගය විසින් උදුරාගත් සමාජයක, ආදරය නැමති වචනයේ අර්ථය, ද්වේශය විසින් උදුරාගත් සමාජයක, ආදරයේ නාමයෙන් අනාගතයේ නැවත කවදාකවත් ටජ්මහල් ඉදිවෙන්නේ නැහැ. ආදරයේ නාමයෙන් අනාගතයේ ඉදිවුණොත් ඉදිවෙන්නේ කඳුළු ස්මාරකයක් පමණක්මයි. මුදල් මත සියල්ල තීරණය වන සමාජයක ආදරය යනු රාගයට ගොදුරු සොයාදෙන, මරුවැලක් පමණක්මයි. වර්තමාන සමාජයේ ආදරයට හිමි තැන එතැන වුවත්, පින්වත් ඔබ ආදරයෙන් පළායන්න එපා. ආදරය තුලත් කෙටි, සුන්දර ආස්වාදයක් තිබෙනවාය කියලා බුදුරජාණන්වහන්සේ දේශනා කරනවා. නමුත් ආදරයේ කෙටි ආශ්වාදය දීර්ඝ ආදීනවයක් කරා ඔබව රැගෙන යනවා. කුරුලු ලෝකයේ සෙබඩ කියන්නේ, ආදරයේ කෙටි ආශ්වාදය තුලින් ලැබූ, දීර්ඝකාලීන ආදීනවයේ ඵලයක් වෙනවා. ගිහි පින්වත් ඔබ ආදරයට ආදරය කරන්න. හැබැයි ආදරය කියන අර්ථය තුල සැඟවී ඇති කටුක යථාර්ථය ධර්මය තුලින් මතුකොටගන්න දක්ෂවෙන්න.

දෑස් දෙක පියාගෙන පින්වත් ඔබ මොහොතක් ආවර්ජනය කරන්න. මේ ලෝකයේ ජීවත්වෙන සෑම කාන්තාවක්ම, සෑම පිරිමියෙක්ම පින්වත් ඔබට, අතීත සංසාරයේ පෙම්වතෙක් පෙම්වතියක් වෙලා තිබෙනවා, මේ ලෝකයේ ජීවත්වෙන සෑම කාන්තාවක්ම පිරිමියෙක්ම සංසාරයේ ඔබට බිරිඳක් ස්වාමිපුරුෂයෙක් වෙලා තිබෙනවා. අතීතයේ ආදරය කරපු කෙනෙකුට වර්තමානයේ නැවත ආදරය කරන එකේ තේරුමක් නැහැ. අතීතයේ විවාහවෙච්ච කෙනෙක්ම නැවත විවාහකරගෙන තේරුමක් නැහැ. පින්වත් ඔබ ලබන ඔය ධර්මානුකූල දැක්මයි, අවබෝධයෙන්ම ආදරය කියන වචනය තුල සැඟවී ඇති කටුක යථාර්තය මතුකොට ගැනීමට හේතුවෙන්නේ. මෙතැනයි අර්ථවත්ම පුරුෂාධිපත්‍යයට, ස්ත්‍රී ආධිපත්‍යයට එරෙහිව සැබෑම විකල්පය සැඟවිලා තිබෙන්නේ. පින්වත් ඔබ ඔබේ ජීවිතය තුලින් අකුසලයන් විපාක දෙන බව, හඳුනාගත් සැනින්, ඊට එරෙහිව සටන්කරන්න යන්න එපා, එවිට තව තව අකුසල්මයි රැස්වෙන්නේ. අකුසලය ඉදිරියේ, පින්වත් ඔබ නවතින්න,

උපේක්ෂා සහගත වෙන්න. නෙතට නැගෙන කඳුළු ඉදිරියේ සිතට දැනෙන දුක් වේදනා ඉදිරියේ ඔබ මෛත්‍රී චිත්තයක් ඇතිකොට ගැනීමට දක්ෂ නම් අකුසලය තුලින් කුසලයක් මතුකොටගත් සැබෑම දක්ෂයෙක් බවට ඔබ පත්වෙනවා. සංසාරයේ ඔබම කරපු අකුසල් ඔබම උපේක්ෂාවෙන් විඳ දරාගෙන ස්වාමිපුරුෂයා කියන අර්ථය දුකක් නම් බිරිඳ කියන අර්ථය දුකක් නම් මම මේ භව ගමනේ ලබන අවසාන ස්වාමිපුරුෂයායි, අවසාන බිරිඳයි, මේ ලැබුවේ කියන චිත්තයෙන් ආදරය කෙරෙහි තිබෙන තෘෂ්ණාව ධර්මානුකූලව දකිමින් අතහරින්න. අකුසලයේ කඳුළු තුලින්ම සැනසුමේ නිවීම මතුකොට ගන්න දක්ෂවෙන්න. ඔබේම අකුසල් ඔබට විපාක දෙනකොට ඒවාට එරෙහිව සටහන් කිරීමට ගොස් පින්වත් ඔබත් අනාගත භවයේ මොනරෙක්, සෙබඩක් නොවන්න. ආදරය කෙරෙහි ඇති ඇලීමත් අනාදරය කෙරෙහි ඇති ගැටීමත් කෙරෙහි ඇති තෘෂ්ණාව පින්වත් ඔබ අවබෝධයෙන්ම අතහරින තැන නොඇලෙන, නොගැටෙන උපේක්ෂාව කියන අර්ථය තුලට ඔබ එනවා. උපේක්ෂාව කියන ධර්මතාවයන් අනිත්‍යයි කියලා දකින තැන පින්වත් ඔබ පුරුෂාධිපත්‍යයෙනුත් ස්ත්‍රී ආධිපත්‍යයෙනුත් මිදුන නිදහස බුක්ති විඳිනවා. පුරුෂාධිපත්‍යයෙනුත්, ස්ත්‍රී ආධිපත්‍යයෙනුත් මිදුන තැන හරිම නිදහස් සුන්දර තැනක්. එහි ඇලීම්, ගැටීම්, උපේක්ෂා කිසිවක්ම නැහැ. සංස්කාරයෝ අනිත්‍යයි කියන ධර්මථාවය තුල, ඔහුට සමාජයේ ජීවත්වන සෑම පුරුෂයෙක්ම, ස්ත්‍රියක්ම අනිත්‍ය වූ සංස්කාරයක් පමණක්මයි. ඔහු නුවණින් දකිනවා සංසාරයේ ස්ත්‍රීත්වය, පුරුෂත්වය නිසා ඇතිකොටගත් ආදරය නිසා අනාදරය නිසා හෙළු කඳුළු මහ සාගරයේ ජලයට වඩා වැඩිය කියලා. ආදරය කළ සිතින්ම බත් කැවූ අතින්ම හිස ගසා මරා දැමූ අවස්ථාවන් දස දහස් ගණනකට වඩා වැඩිය කියලා. සියළු සංස්කාරයෝ අනිත්‍යයි, සංස්කාරයන් විපාක සලස්වලා අනිත්‍ය වී යන්නේ අනාගතයේ විපාකයට අළුතින් සංස්කාරයක් උපද්දවලා. ඒ නිසාමයි පින්වත් ඔබට නැවත නැවතත් මතක්කොට දෙන්නේ. සැප වේදනාවත් දුක්වේදනාවත් දෙක ඉදිරියේදීම සතිය සිහිය ඇතිකොටගන්නය කියලා.

# උතුම් රහත්ඵලයට පත්වෙනතුරු, තේරුම් නොගත් ජීවිතයේ යථාර්ථය

බුදුරජාණන්වහන්සේ ජීවමානව වැඩසිටින කාලයේ ඉසිදාසි කියලා සිටු දියණියක් සිටියා. තරුණවියට පැමිණි ඇය, දෙමාපියන්ගේ යෝජනාවකින් සුදුසු මනාලයෙකුට සරණපාවා දුන්නා. ඉසිදාසිය ඉතාමත් ගුණවත් කීකරු බිරිඳක්. සැමියාට පමණක් නොව, තම නැන්දනියට පවා, අවශ්‍ය ප්‍රමාණයටත් වඩා හොඳින් යුතුකම් ඉටුකළා. සති කිහිපයක් ගතවෙනකොට ඉසිදාසිගේ ස්වාමිපුරුෂයා, ඉසිදාසිව දැඩිලෙස ප්‍රතික්ෂේප කරන්න පටන්ගත්තා. ඉසිදාසිය කෙරෙහි තිබූ ආදරය අතුරුදහන්වෙලා ගියා, ඉසිදාසිය ගෙදර සිටියොත් තමන් නිවසින් බැහැරව යනවා කියලා ස්වාමිපුරුෂයා තර්ජනය කළා. කරකියාගත හැකි දෙයක් නැති වූ නැන්දනිය ඉසිදාසිව දෙමාපියන්ගේ ගෙදරට ගොස් බාරදුන්නා.

ටික දිනක් නිවසේ ගතකළ ඉසිදාසියට දෙමාපියන් විසින් නැවතත් සුදුසු තරුණයෙක් විවාහකොට දුන්නා. එම කුල ගෙදරදීත් ඉසිදාසිය තම අළුත් ස්වාමිපුරුෂයාට, ඥාතීන්ට අවශ්‍ය ප්‍රමාණයටත් වඩා හොඳින් යුතුකම් ඉටුකළා. සති කිහිපයක් යනකොට දෙවන ස්වාමිපුරුෂයාත් ඉසිදාසියව දැඩිලෙස ප්‍රතික්ෂේප කරන්න, ඇයට අනාදරය කරන්න පටන් ගත්තා. ඉසිදාසිය ගෙදර සිටියොත් තමන් නිවසින් පිටවී යන බවට තර්ජනය කළා. දෙවන වතාවටත් නැන්දනිය විසින් ඉසිදාසියව දෙමාපියන්ගේ නිවසට ගොස් භාරදුන්නා.

විවාහ දෙකකින්ම දික්කසාද වී කළකිරීමෙන් සිටි ඉසිදාසිය, දැන් දෙමාපියන්ටත් හිසරදයක් වෙලා තිබුණේ. ඒ නිසාම දෙමාපියනුත් ඉසිදාසියට චෝදනාකළා, ඔබ හරිම පවුකාරියක්ය කියලා. ඉසිදාසියගේ දෙමාපියන් දැනගෙන සිටියේ නැහැ, මෙය ඉසිදාසියගේ පමණක් අකුසලයක් නොව, තමන්ගේද අකුසල් විපාකයක් බව. විවාහයන් දෙකක්ම බිඳවැටීමට හේතුව ඉසිදාසියගේ වරද කියලයි දෙමාපියන් ඇයට චෝදනා කළේ. අවසානයේ දෙමාපියන් තමන් ළඟ සේවය කරන සේවක මහත්මයෙකුට ඉසිදාසිව විවාහකොට දුන්නා. දෙදෙනාට ජීවත්වීමට අවශ්‍ය තරම් ධනය ඉඩකඩම් පවරාදුන්නා. සති කිහිපයක් එක ගෙදර ගතකළ ඉසිදාසිව තුන්වන මනාලයත් ප්‍රතික්ෂේප කරනවා.

ඉසිදාසිය කල්පනා කළා දෙමාපියන් සිදුකොට දුන්න විවාහයන් තුනක්ම කඩාකප්පල්වුණා. තවදුරටත් මට දෙමාපියන්ට මුහුණ දෙන්න බැහැ. මම නැවත දෙමාපියන්ගේ මුහුණ බලන්න ගෙදර යන්නේ නැහැ. ජීවිතය නැතිකරගන්නවාය කියන අදහසින් ඇඳි වත පිටින්ම මහපාරට බැස්සා.

දවසක් දෙකක් ඉබාගාතයේ ඇවිද්ද ඉසිදාසියට කල්‍යාණමිත්‍රයෙක් මුණගැසෙනවා. රහත් භික්ෂුණීන් වහන්සේ නමක් වන එම කල්‍යාණ මිත්‍රයාට මුණගැසීම ඉසිදාසියගේ අතීත කුසල් සංස්කාරයක ප්‍රතිඵලයක්. විවාහ ජීවිත හරහා, අතීත අකුසල් ඵලව ඵලවා පහරදෙත්දී, ඉසිදාසිය ඇලීම්, ගැටීම්වලට නොයා උපේක්ෂාවෙන්ම ජීවිතය ඉවසීමේ ප්‍රතිඵලයෙක් තමයි, කල්‍යාණමිත්‍ර ආශ්‍රය නැමති කුසල් සංස්කාරය මෝදුවී පැමිණියේ. ඇය ඇයට එරෙහි වූ සැමියන් තුන්දෙනාට එරෙහිව පුරුෂාධිපත්‍යයට එරෙහිව සටන්කිරීමට ගියානම්, ඇයට කල්‍යාණමිත්‍රයෙක් නොවේ, මුණගැහෙන්නේ, අධර්මයේ අසත්පුරුෂ මිත්‍රයෙක්මයි.

වර්තමාන සමාජයේ පින්වතුන් ඉසිදාසිය කුසලය මතුකොටගත් මේ තැන හොඳින් තේරුම්ගන්න ඕනේ. ඔබේ ජීවිතයේ විපාකයට පැමිණෙන අකුසලයට එරෙහිව, ඔබ සටන් කරන්නට ගියොත්, එහි ඵලය ලෙස ඔබට මුණගැසෙන්නේ අසත්පුරුෂ ආශ්‍රයන්මයි. ඔබ ඉදිරියට පැමිණෙන අකුසලය ඔබ ධර්මානුකූලව උපේක්ෂාවෙන් ඉවසීමට දක්ෂ නම් එහි ඵලය හැටියට ඔබට මුණගැසෙන්නේ කල්‍යාණමිත්‍ර ආශ්‍රයක්මයි. පින්වත් ඔබේ ජීවිතයට ගලපලා බලන්න ඉහත කාරණය වැරදිද, නිවැරදිද කියලා.

ඉසිදාසියට මුණගැසුනු රහත් භික්ෂුනීන්වහන්සේගේ කල්‍යාණමිත්‍රභාවය තුලින් සද්ධර්මය ශ්‍රවනයත්, සද්ධර්මය ශ්‍රවනය තුලින් නුවණින් මෙනෙහි කිරීමටත් දක්ෂ වූ ඉසිදාසිය උතුම් පැවිදි උපසම්පදාව ලබා, උතුම් රහත් භික්ෂුනීන්වහන්සේ නමක් වෙනවා. ඇය උතුම් රහත් ඵලයට පත්වුණාට පස්සේ, ඇය පූර්වේනිවාසානුස්සති ඥාණයෙන් ඇයගේ අතීත භවයන් පිළිබඳව උතුම් සමාධියෙන් විමසලා බලනවා. ඇය තම පූර්වේනිවාසානුස්සති ඥාණයෙන් දකිනවා මීට ආත්මභාව හතරකට ඉස්සෙල්ලා ඇය ධනවත් තරුණයෙක්. මුදල්, දේපල, ලස්සන යාළුවෝ, සුන්දර තරුණ ජීවිතයක් ගතකළ මේ තරුණයා, තරුණ මදය නිසාම බලවත් ආකාරයෙන් කාමයේ වරදවා හැසිරීමේ සිල්පදය දුර්වලකොට ගන්නවා. තරුණ වයසේ පමණක් නොවේ. ජීවිතයේ මධ්‍යම වයසේත්, වැඩිහිටි වයසේත් ඔහු කාමයේ වරදවා හැසිරුණා. අනුන් ගැන සිතුවේ නැහැ. තමන්ගේ කාම ආශ්වාදය ගැනමයි ඔහු සිතුවේ, ඇය විවාහක කෙනෙක්ද, ඇයට දරුවන් සිටිනවාද, ඇයගේ විවාහ ජීවිතය බිදීයයිද, සිල්පද බිදීම අකුසලයක් වෙයිද යනදේ ඔහුට අවශ්‍ය වූයේ නැහැ. කාමයේ වරදවා හැසිරීමේ වරද බලවත් ආකාරයෙන් සිදුකොට ඔහු මිය යනවා. පටිච්චසමුප්පන්නව ඔහු උපදින්නේ, වඳුරු පැටවෙක් වෙලා, මේ වඳුරු පැටවා කුඩා කාලයේදීම, වඳුරු රැලේ නායක වඳුරා විසින් මේ වඳුරු පැටවාගේ පුරුෂ ලිංගය කඩාගෙන කෑම නිසා මියයනවා.

පටිච්චසමුප්පන්නව වඳුරු පැටවා නැවත උපදින්නේ නාකි එළදෙනක කුස වස්සෙක් වෙලා. පින්වත් ඔබ නුවණින් දකින්න තරුණ එළදෙනකට උපදින පැටවාගේත්, වයසක එළදෙනකට උපදින පැටවාගේත් සංස්කාරවල විවිධත්වය. වයසක එළදෙනකට පැටවෙක් ඉපදුනානම් එම පැටවාට ලැබෙන රැකවරණය, ආදරය, කිරි ප්‍රමාණය, ආරක්ෂාව අඩුයි. තරුණ එළදෙනකට පැටවෙක් ලැබෙනවානම් ඉහත සාධක උපරිමයෙන් එම පැටවා ලබනවා. වයසක එළදෙනකට දාව ඉපදුන මේ වසු පැටවා තරුණ වයසට පැමිණෙනකොට එම වස්සාව, හරක් හිමිකරුවා වැඩගැනීම සඳහා පුස්සෙක් කරනවා. ඒ කියන්නේ ලිංගිකත්වය අඩපණකොට දමනවා. පෙර ජීවිතයේ කාමයේ වරදවා හැසිරීමේ විපාකයන්, ලිංගික ක්‍රියාවලිය අඩපණ වූ මේ ගොන් වස්සා වයසට ගොස් මිය යනවා. පටිච්චසමුප්පන්නව මේ ගොන් වස්සා වයසක එළිච්චියකට දාව පිරිමි එළු පැටවෙක් වෙලා උපදිනවා. එතනත් වයසක අම්මා කෙනෙකුට දාවයි උපදින්නේ. තරුණ වයසේදීම මේ එළු වස්සාගේ පුරුෂ ලිංගයේ ආසදනයක් හේතුවෙන් පුරුෂලිංගයට පණුවන් ගසා මිය යනවා. මේ එළු වස්සා පටිච්චසමුප්පන්නව පිරිමි දරුවෙක්ව මනුෂ්‍ය කුලයක උපත ලබනවා. හැබැයි නපුංසකයෙක් හැටියට. මේ නපුංසක පුද්ගලයා කළා වූ පින්කම හේතුවෙන් මියගොස් පටිච්චසමුප්පන්නව ඉසිදාසිය නමින් දඹදිව උපත ලබනවා. පින්වත් ඔබ නුවණින් දකින්න ආත්ම භාව පහක ඉසිදාසියගේ අතීත භව කථාව මොනතරම් සංකීර්ණ වූ විවිධත්වයෙන් පිරුණු කථාවක්ද. වයසක අම්මා කෙනෙකුට දරුවෙක් ලැබීමත්, වස්සෙක් වැඩ ගැනීම සඳහා ලිංගිකත්වය අඩපන කිරීමත්, එළු වස්සගේ පුරුෂ ලිංගය පණුවො ගැසීමත්, වඳුරු පැටවාගේ පුරුෂ ලිංගය මහා වඳුරා කඩාගෙන කෑමත් නපුංසකව ඉපදීමත් අහම්බයන් නොවේ, හේතුඵල ධර්මයන්. කාමයේ වරදවා හැසිරීමේ වරදේ ජීවමාන ප්‍රතිබිම්බයක්. අරිහත් ඵල අවබෝධය සාක්ෂාත්කොටගෙන සිටි ඉසිදාසි උත්තමාවිය, නුවණින් දකිනවා, ගිහි ජීවිතයේදී තමන් විවාහ තුනකින්ම දික්කසාද වූයේ, මාගේ සැමියනට මා නීරසවූයේ,

සැමියන් වහකදුරු මෙන් මාව, ප්‍රතික්ෂේප කළේ, ආදරයේ සුන්දර අත්දැකීම් විවාහය තුලින් මා නොලැබුවේ, දෙමාපියන්ගෙන් මා චෝදනාවට ලක්වූයේ අනුන්ගේ වරදක් නිසා නොව, මා විසින්ම සංසාරයේ කරන ලද, කාමයේ වරදවා හැසිරීමේ අකුසල් විපාකයන්ගේ හේතුඵල ධර්මයන් නිසාමය කියලා. ඉසිදාසි රහත් උත්තමාවිය නුවණින් මෙනෙහි කරනවා, පටිච්චසමුප්පන්නව මා සංසාරයේ කළ කාමයේ වරදවා හැසිරීමේ අකුසල් විපාකයන් නිසා, මමත් දුකටම පත්වුණා, ජීවිතය නැතිකරගන්නවාය කියන තැනට අකුසල් විපාකයට පැමිණුනා. මගේ අතීත අකුසල් නිසා, මාව දික්කසාද කළ ස්වාමිපුරුෂයන් තිදෙනෙක් අළුතින් අකුසල් රැස්කොටගත්තා, මට චෝදනා කිරීම නිසාම මගේ දෙමාපියනුත් අළුතින් අකුසල් රැස්කොටගත්තා. කුසල්, අකුසල් ඇස්බැන්ඳුම පංචඋපාදානස්කන්ධ ලෝකය අවුළුවමින් ගිනි පතුරුවද්දී මම නැවතුනා, මම නිවුනා කියලා ඉසිදාසි උත්තමාවිය සිංහසෙයියාවෙන් සිංහනාදකළා.

දික්කසාද නඩුවලින් පිරුණු, වර්තමාන අධිකරණ ශාලාවල, අනුනට වරද පටවමින් තමන් නිර්දෝෂ වීමට තීන්දු සොයන පින්වතුන්ලාට පින්වතියන්ට ඉසිදාසි උත්තමාවිය, තම පූර්වේනිවාසානුස්සති ඥාණය තුලින් මතුකොටගත් ඇත්ත කථාව තිත්ත වුවද තිත්ත කසාය තුල අකුසල් මූලයන් අඩුකොට ගැනීමට හොඳ ගුණාත්මකභාවයක් තිබෙන බව, පින්වත් ඔබ අවබෝධකොටගත යුතු වෙනවා. බුදුරජාණන්වහන්සේ දේශනා කරනවා, සීලය කාන්තාවකට බලයක්ය කියලා. සීලය නැමති බලය, කාන්තාවක් තම ජීවිතයට එකතුකොටගත හොත්, ඇය මෙලොව පරලොව දෙකේදීම ආරක්ෂාවෙනවා. ඒ වගේමයි ඇය, ඇයගේ ජීවිතයට විපකයට පැමිණීමට ඇති, අතීත අකුසල් ද අඩපණකොට දමනවා. පින්වත් ඔබ ආදරයෙන් බැඳුන යුගදිවි ගමනේ දෙපා තබායන, මල් පාවඩ මත කඳුලැලි වැටුණොත් සියල්ලටම ඉස්සරවෙලා නීතිය ඉදිරියට දිවයන්න එපා. මුලින්ම අකුසලය තමන්ගේම බව දැන ධර්මමාර්ගය තුලම, විසඳුම් සොයාගන්න දක්ෂවෙන්න. තෙරුවන් කෙරෙහි ඇති විශ්වාසය,

කර්මය කර්මඵල කෙරෙහි ඇති විශ්වාසය, සංස්කාරයෙන්ගේ අනිත්‍යභාවය ඔස්සේ ඔබ ප්‍රශ්නයට විසඳුම් සොයන්න උත්සාහ කළොත්, පින්වත් ඔබ අකුසලය ඉදිරියේ දික්කසාද තුනක් උපේක්ෂාවෙන් අත්විඳි ඉසිදාසිව ආදර්ශයට ගත්, පින්වතෙක්, පින්වතියක් වෙනවා. පින්වත් ඔබ අතීත සංස්කාරයන්ගේ කටුකභාවය දැක ප්‍රශ්න ජීවිතය ඉදිරියට පැමිණීමට පෙරාතුව සීලයේ බලය ජීවිතයට එකතුකොට ගන්න දක්ෂවෙන්න. බුදුරජාණන්වහන්සේ දේශනා කරනවා මේ ලෝකයේ තිබෙන ශ්‍රේෂ්ඨතම යාගය පළිගැනීමවත්, අධිකරණයට යාමවත් සටන්කිරීමවත් නොව, සිල්පද පහ නිවැරදිව ආරක්ෂාකොට ගැනීමය කියලා.

# හිංසාවෙන් විමුක්තිය සොයන මිනිස්සු, සුගතියෙන් ඈතට යනවා

ලොව්තුරා බුදුරජාණන්වහනසේ දිනක් මහා සංඝරත්නය පිරිවරාගෙන මගධ ජනපදයේ චාරිකාවේ වඩිනවා. මගධ ජනපදයේ බොහෝම මහේශාක්‍ය ලෙස ජීවත්වෙන කූටදන්ත බ්‍රාහ්මණයා මේ දිනවල විශාල යාගයකට සූදානම් වෙමිනුයි සිටියේ. මෙම කූටදන්ත බ්‍රාහ්මණයාට අයත් විශාල උයනේ ලොකු ගවයන් 700ක්, ගොන් නාම්බන් 700ක්, තරුණ වැස්සියන් 700ක්, එළුවන් 700ක්, බැටළුවන් 700ක්, යාගය සඳහා කණුවල ගැටගසා තිබුණා. ඒ කියන්නේ සතුන් 3500ක් යාගය සඳහා සූදානම් කොට තිබුණා. යාගය පවත්වන බ්‍රාහ්මණයන්ගේ ප්‍රභූභාවය මහේශාක්‍යභාවය අනුව යාගයට ගන්නා සතුන් ප්‍රමාණය වැඩිවෙනවා. කූටදන්ත බ්‍රාහ්මණයා කියන්නේ බොහෝම ප්‍රභූ බ්‍රාහ්මණයෙක්. ඒ නිසාමයි යාගය මෙතරම් සරුසාර ලෙස සංවිධානය කොට තිබුණේ. මේ යාගය පැවැත්වීම සඳහා සිව්දිශාවෙන් පැමිණි මිථ්‍යාදෘෂ්ටික බමුණන් 500 දෙනෙක් කූටදන්ත බ්‍රාහ්මණයාගෙන් ආගන්තුක සත්කාර ලබමින් යාගයෙන් අනතුරුව ලැබෙන පඬුරු ලාභසත්කාරවලට ගිජුව උයනේ නැවතී සිටියා. තමන්ගේ සැපය උදෙසා, තමන්ගේ සතුට උදෙසා අහිංසක සතුන්ව අමු අමුවේ මරාදමා එම සතුන්ගේ මරණීය අඳෝනා තුලින් එම සතුන්ගෙන් ගලායන උණුසුම් රුධිරය තුලින් විමුක්තිය සාක්ෂාත්කරගැනීම මේ සැමදෙනාගේම බලාපොරොත්තුව වුණා. මිථ්‍යාදෘෂ්ටික බමුණන්ගේ පැවැත්ම උදෙසාම එදා සමාජයේ වපුරා තිබූ මෙම කුරිරු සත්ව ඝාතන යාගයන් හේතුවෙන් ලක්ෂගණන් සතුන් ඉතාමත් කුරිරු ආකාරයට ජීවිත පූජා කළා.

කූටදන්ත බ්‍රාහ්මණයාගේ අතීත කුසලයක් නිසාදෝ මේ කුරිරු යාගයට පෙරාතුව ලොව්තුරා බුදුරජාණන්වහන්සේ මේ ගමට වැඩම කළා. කූටදන්ත බ්‍රාහ්මණයා, බුදුරජාණන්වහන්සේ බැහැදකින්න දහස්ගණනින් යන ගම්වැසියන් සමඟ ලොව්තුරා බුදුරජාණන් වහන්සේ බැහැදකින්න ගියා. යාගය පැවැත්වීම සඳහා පැමිණ සිටි බමුණන් 500 දෙනාම කෙළහලමින් සිටියේ අහිංසක සතුන් 3500ක් දෙනාගේ බෙලි කඩු, මන්න, පිහියවලින් කපලා ගලායන රුධිරය දැකලා සතුටුවෙන්න, ඒ සතුන් හිංසාවෙන් වේදනා විඳිනවා දැකලා සතුටුවෙන්න, ලැබෙන පඬුරු දැකලා සතුටුවෙන්න. මේ බමුණන්ගේ විරෝධය මැදයි කූටදන්ත බ්‍රාහ්මණයා බුදුරජාණන්වහන්සේ බැහැදකින්න ගියේ එතනදී කූටදන්ත බ්‍රාහ්මණයාට බුදුරජාණන්වහන්සේ දේශනා කරනවා ගිහි පින්වතුන්ලාට මෙලොව පරලොව වශයෙන් යහපත සලසාදෙන උතුම්ම යාගය කුමක්ද කියලා. යම් පින්වතෙක් හදවතින්ම තෙරුවන් සරණ පිහිටලා මහා සංඝරත්නයට සිව්පසයෙන් ඇප උපස්ථාන කරලා පංචසීලය සමාදන් වෙලා ජීවත්වෙනවා නම්, එය තමයි මේ ලෝකයේ ඔබගේ විමුක්තිය උදෙසා ඇති ලොකුම යාගය කියලා. මේ උතුම් යාගය යම් ගිහිපින්වතෙක් සිදුකළොත් සතුන් මැරෙන්නෙ නැහැ. සතුන්ට හිංසාවක් වෙන්නෙ නැහැ. සතුන්ට හිංසාකිරීම නිසා අපාගතවන මිනිසුන් ඇතිවෙන්නේ නැහැ. මේවැනි කුරිරු ආදර්ශයන් සමාජයේ වටිනාකම් බවට පත්වෙන්නේ නැහැ කියලා. ලොව්තුරා බුදුරජාණන්වහන්සේගේ උතුම් ධර්මය ශ්‍රවණය කරලා කූටදන්ත බ්‍රාහ්මණයා උතුම් තෙරුවන් සරණ පිහිටියා. සීලයේ වටිනාකම හොඳින් හඳුනාගත්තා. ඒ මොහොතේම කුරිරු යාගයට සූදානම් කොට තිබූ සතුන් 3500 දෙනාම නිදහස් කොට හැරියා. තෙරුවන් සරණ නිසාම රැස්වීමට තිබූ මහා අකුසල් කන්දක් වැළකී ගියා. යාගය සිදුකිරීමට පැමිණ සිටි බමුණන් 500 දෙනා බුදුරජාණන්වහන්සේට දෝෂාරෝපණය කරමින් විසිරී ගියා. අහිංසක සතුන් 3500 දෙනෙකුගේ මරණීය අඳෝනාවන්ගෙන් එම සතුන්ගේ උණුසුම් රුධිරයෙන් සහ කූටදන්ත බ්‍රාහ්මණයාගේ

පඬුරුවලින් තෘප්තිමත් වීමට බලාපොරොත්තුව සිටි බමුණන් 500 දෙනා මේ මොහොතේ භවයේ කොතනක සිටී ද යන්න හේතුඵල ධර්මයන්ට අනුව පින්වත් ඔබ සිතා බලන්න ඕනේ. වර්තමානයේ යාගයන් සඳහා බෙල්ල කැපෙනා එළුවෙක්, කුකුළෙක් වෙලා මෙම බමුණන් ඉන්න පුළුවන්. කවුරුන් හෝ යාගයක් සිදුකරන්නේ තමන්ගේ පැවැත්ම ආරක්ෂාව සහ විමුක්තිය උදෙසාමයි. යාගයක් කියන්නේ තිරිසන් සතුන් බිලිදීම පමණක්ම වෙන්නෙ නැහැ. මනුෂ්‍යයින් බිලිදීම ද යාගයක් වෙනවා. මනුෂ්‍යයෝ බිලිදෙන යාගයන් ලෝකයේ හැමදාමත් පැවතුනා. ඒවාට අපි යාගය කියලා නොවේ කියන්නේ යුද්ධය කියලා. යාගයේ නාමයෙන් කෙරුණත් යුද්ධයේ නාමයෙන් කෙරුණත් මේවායින් සතර අපායේ උපතකට ඔටුණු පළඳවන විමුක්තියක් විනා එකම සිතුවිල්ලක සැපයක් උදෙසා ඔටුණු පළඳවන විමුක්තියක් නම් මේවායින් ලැබෙන්නේ නැහැ. අපිට මතක ඇති කාලයේ අපේ රටෙත් 1971, 1983, 1989 මෙවැනි යාගයන් කිහිපයක් පැවතියා. උතුරේ ප්‍රශ්නය නමින් දශක ගණනාවක් දිගු වූ යාගයක් පැවතුනා. මෙම යාගයන් හිදී මිනිසුන් දස දහස් ගණනක් මිය ගියා, මරා දැමුණා. ලේ පැහැයට කැමති සීලයෙන් පිරිහුණු මිනිස්සු මෙවැනි යාගයන් තුලින් බලාපොරොත්තු වූයේ විමුක්තියයි. තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාවෙන් සීලයෙන් තොරව පින්වත් ඔබ බලාපොරොත්තු වන විමුක්තිය හුදු මායාවක්ම බව ඉහත සෑම යාගයකදීම හොඳින්ම ඔප්පු වුණා. ඉහත යුද්ධය නැමැති යාගයකදී, යාග භූමියකදී ජීවිතය පූජා කළ සටන්කරුවකුගේ නැවත උපතක් භික්ෂුවක් තම උතුම් සමාධියේදී අරමුණු කොට බලනවා. භික්ෂුවට අරමුණු වෙන්නේ දැවැන්ත සර්පයෙකුගේ කොටසක්. එම සර්පයා භූත සර්පයෙක්. මෙම සර්පයාගේ ශරීරයේ ප්‍රමාණය හොඳින් වැඩුනු කෙසෙල් කඳක ප්‍රමාණයට සමානයි. මෙම සර්පයා මහ පොළොවට බද්ධ වෙලා ගිලිලයි සිටින්නේ. මහ පොළොවෙන් ඉහළට මෙම සර්පයාගේ කඳ කොටස අඩි තුනක් පමණ මතුවී තිබෙනවා. සර්පයාගේ ශරීරයේ අග කොටස මහ පොළොවට

ගිලිලයි තිබෙන්නේ. මේ සර්පයාට තිබෙන්නේ කොටි මුහුණක්. ඒ කියන්නේ කොටියෙකුගේ මුහුණක් සර්ප ඇඟක් සහිත මහ පොළොවට ගිලුණු සත්වයෙක්. මේ අරුමපුදුම භූත සත්වයා පොළොවට බද්ධවෙලයි සිටින්නේ. එයාට එහා මෙහා යන්න බැහැ. තම භූමිය කෙරෙහි දැඩි තෘෂ්ණාවෙන් මහ පොළොවේ අයිතිය උදෙසා මහ පොළොව මගේ යැයි උපාදානය කොටගෙන විනාශකාරී යාගයක් කිරීමේදී රැස්කොටගත් බලවත් අකුසල් හේතුවෙන් සහ මියයන මොහොතේ භූමිය කෙරෙහි ඇතිකරගත් උපාදානය හේතුවෙන් ඔහු තෘෂ්ණාවෙන් බැඳුණ භූමිය තුලටම ගල් වූ භූත සත්වයෙක් ලෙස උපත ලබා තිබෙනවා. දැන් ඔහු පොළොවට බද්ධවෙලා පොළොව මගේ කොටගෙන වෛරයෙන් ජීවත් වෙනවා. ඔන්න විමුක්තියේ නාමයෙන් ඔහු ලැබූ උතුම් විමුක්තියේ තරම. දුස්සීල භාවය තුලින් විමුක්තිය සොයා යන ජාති ආගම් භේදයකින් තොරව කාටවුවද ඉහත කාරණය හොඳ පාඩමක් වෙනවා. සතුන් බිලි දීමෙන් සිදුකරන යාගයකදී වුව ද යුද්ධයේ නාමයෙන් කෙරෙන යාගයකදී වුව ද මේවාට කැමති මේවාට ප්‍රිය මනුෂ්‍යයින් සේම අමනුෂ්‍යයින්ද සිටිනවා. මෙම යාගයන් මෙහෙයවන මනුෂ්‍යයන්ගේ ජීවිත දුස්සීලභාවය නිසාම අමනුෂ්‍යයිනගේ ග්‍රහණයට නතුවෙලයි බොහෝ විට තිබෙන්නේ. මේ අයට නිරතුරුවම ලේ පැහැයට කැමති, ලේ රසයට කැමති අමනුෂ්‍ය කොටස් උපකාර කරනවා. තව තවත් විනාශකාරී තත්ත්වයන්ට ගොස් තව තවත් අකුසල් රැස්කොට සතර අපායේ තම පිරිවර ජනතාවගේ ජයග්‍රහණය, වැඩිකරගැනීමට මෙවැනි විෂම අමනුෂ්‍ය කොටස් තමා වටා නිරතුරුවම සිටියදී එම මිනිසුන්ට ඵස්සය හේතුවෙන් සකස් වෙන සෑම සිතක්ම අකුසල් වැඩෙන දිශාවටමයි සකස්වෙන්නේ. කූටදන්ත බ්‍රාහ්මණයාගේ යාගයට පැමිණ හිස් අතින් හැරී ගිය බමුණන් 500 දෙනාත් ඉහත අර්ථයන්ට අයත් අයමයි. තෙරුවන් සරණයාමෙන් සිල්වත් වීමෙන් තොරව කරන කුමන කටයුත්තකදී වුව ද ඒවායින් සතුටු වන්නේ අකුසලයට කැමති මිත්‍යාදෘෂ්ටික බලවේගයන් පමණක්ම බව හොඳින් සිහිතබාගන්න. එවැනි මිත්‍යාදෘෂ්ටික

බලවේගයන්ගේ ආශීර්වාදය ඔබ බලාපොරොත්තු වන්නේ නම්, තව තවත් අකුසල් රැස්කරගැනීමේ දිශාවට එම ආශිර්වාදයන් ක්‍රියාත්මක වේවි. භික්ෂුවක් උතුම් සමාධියෙන් පසුවෙන කොට, එම භික්ෂුවට රෞද්‍ර ප්‍රේතයෙක් දර්ශනය වෙනවා. මෙම ප්‍රේතයා වයස අවුරුදු 25 ක් පමණ තරුණයකුගේ ස්වරූපයෙන් යුක්ත අයෙක්. කොට කලිසමක් පමණක් ඇඳ සිටි මෙම ප්‍රේතයාගේ ශරීරය නිරාවරණවයි තිබුණේ. මේ ප්‍රේතයා යුද්ධයකදී මැරුම්කාපු සන්නද්ධ තරුණයෙක්. මේ ප්‍රේතයා තම ශරීරය පුරාම හිසේ සිට දෙපතුල දක්වාම රුධිරය තවරගෙනයි සිටියේ. මේ ප්‍රේත තරුණයා රුධිරයට රුධිරයේ පැහැයට සුවඳට බොහෝ කැමැත්තක් දක්වනවා. එය ඔහුගේ පෙර ජීවිතයේ යුද්ධයේදී ඇති කරගත් වෛරය නිසාම ඇතිකරගත් විකෘතිභාවයක්. තම විරුද්ධ පාර්ශවයේ රුධිරය දැකීම සඳහා රුධිරය හැලීම සඳහා ඇතිකරගත් ද්වේශයේ ප්‍රතිඵලයයි ඔහු තුලින් මේ දිස්වෙන්නේ. භික්ෂුවට මේ ප්‍රේතයා දර්ශනය වන විට ඔහු සිටියේ හරක් මස් කඩයක් අසල. එම හරක් මස් කඩයේ එල්ලා තිබූ රතු පැහැති මස් ගාත්වල තැවරී තිබෙන රුධිරය මෙම ප්‍රේතයාගේ අතේ තවරාගෙන තම ශරීරය පුරාම තවරගන්නවා. රුධිරය දැකීමට රුධිරය තවරාගැනීමට දැඩි ආශාවක් මේ ප්‍රේතයාට තිබෙනවා. මොහු මස් කඩ අසල ගැවසෙමින් සතුන් මරණ යාග පොලවල්වල ඇවිදිමින් මිනිසුන් මරණ යාග පොලවල ඇවිදිමින් සතුන්ගේ ගලායන රුධිරයෙන් තම අකුසලයේ විපාකය සංසිඳවාගන්නවා. ඉහත කාරණයෙන් පින්වත් ඔබට හොඳින් වැටහෙනවා ඇති සතුන් මරණ සතුන්ට හිංසා කරන මිනිසුන් මරණ යාගවලදී ඒවාට ප්‍රියකරන ඒවාට ආශිර්වාද කරන ඒවා නිසා සැනසෙන විකෘති අමනුෂ්‍යයින්ගේ සැබෑම ස්වභාවය. මනුෂ්‍යයාගේ දුස්සීලභාවය වැඩිවන්න වැඩිවන්න ලෝකයේ යාගයන්, ඒ කියන්නේ ඝාතනයන් වැඩිවෙනවා. එවැනි ඝාතනයන් වැඩිවෙන කොට ලෝකයේ මෙවැනි විකෘති අමනුෂ්‍යයින්ගේ ග්‍රහණයද සීඝ්‍රයෙන් වැඩිවෙනවා. දුස්සීලභාවය තුලින් පෙර ජීවිතයේදී මේ පින්වත් තරුණයා සොයා ගිය විමුක්තිය රුධිර පිපාසිත ප්‍රේත

ජීවිතයකට පදනම සකස්කොට දී තිබෙනවා. වර්තමානයේදී ජාති ආගම් භේදයකින් තොරව කිනම් තරාතිරමක කෙනෙක් වුවද දුස්සීලභාවයෙන් යුතුව සිදුකරන යාගයන් නිසා ඉහත ආකාරයේ දුක කැකෑරෙන භවයේ උපත් මරණින් මතු සකස්වීම අනිවාර්ය වනු ඇත. ලෝකය, මේ අවිහිංසාව සාමය ගැන කථා කරමින් ගාට ගාට ඉදිරියට යන්නේ මනුෂ්‍යයා තුල මෘග සංඥාව සකස්වෙන පරිසරයක් කරාය. එදාට මේ මුළු ලෝකයම එකම යාග භූමියක් වනු ඇත. මනුෂ්‍යයා දුස්සීලභාවයෙන් තව තවත් ශක්තිමත් වෙන්නේ මේ අනාගත යාග භූමියේ කෲරත්වය තව තවත් තීව්‍ර කරගැනීම සඳහාමය. ඉක්මන් කරගැනීම සඳහාය.

# සීලයෙන් බැහැරවූ මනුෂ්‍යයා රත් පැහැයට හුඟාක් කැමතියි

මනුෂ්‍ය සමාජයේ ජීවත් වන සීලයෙන් බැහැරවූ මිනිස්සු රතු පැහැයට හරි කැමතියි. රුධිරය දකින්න රුධිරය විඳින්න හරි කැමතියි. මරණීය වේදනාවෙන් දඟලන සතෙකුගේ දිහා බලලා සතුටුවෙන්න හරිම කැමතියි. එම සතාගේ මරණීය අඳෝනාව අහල මිහිරක් විඳින්න ඒ මනුෂ්‍යයින් කැමතියි. ඒ අය පදං වෙලා තිබෙන්නේ අකුසලටය කෙනෙක් බොදු ගීතයක්, ආදර ගීතයක් රසවිඳිනවා වගේ මේ අය අහිංසක තිරිසන් සතෙකුගේ මරණීය අඳෝනාව අහල එවැනිම සතුටක් ලබනවා. ෂසීලයෙන් බැහැරවූ මිනිසුන්ගේ සිත ඉල්ලන කුණු රසය ඒ අය අත්විඳින්නේ බොහෝම කැමැත්තෙන්.

භික්ෂුවට මතකයි එක්තරා ගමක මනුෂ්‍යයෙක් සිටියා. මොහු තමයි ඒ ගමේ තිබෙන කුකුළ් ගොවිපලවල කුකුළ්ලු මරන්නේ. මේ පුද්ගලයා මරණ කුකුළන්ට හොඳ ඉල්ලුමක් වෙළෙඳපොලක්, තිබුණා. මොකද මොහු කුකුළ්ලු මරන්නේ බෙල්ල කපලා නොවෙයි. මේ මනුෂ්‍යයා, කුකුළ්ලු දහයක් පමණ පොහොර උරයකට දමලා එහි කට බඳිනවා. දැන් ඔහු එම කුකුළ්ලු සහිත පොහොර උරය පොළොවේ ගසනවා. කුකුළ්ලු මැරෙන්නේ ශරීරයේ මස් තැලිලා හොඳින් රත් පැහැ ගැන්විලා. පිහාටු ගලවලා කුකුලා හොඳින් සුද්ද කළාට පසුව කුකුලාගේ මස හොඳින් තැලුන නිසා කුකුල් මස හොඳින් රතු පැහැය ගන්නවා. රතු පැහැයෙන් යුතු මසට හොඳ ඉල්ලුමක් තිබෙනවා. ඌරෙක් මරපුවහම ඌරගේ රුධිරය අරගෙන හොඳින් රත්පැහැ වෙන්න

මස්වල තවරනවා. රතු පැහැයට දුස්ශීල මිනිසුන්ගේ හොඳ කැමැත්තක් තිබෙනවා. මිනිසුන් මෙවැනි රතු පැහැයෙන් යුත් මස්වලට "නැවුම් මස්" කියලා කියනවා. ඔබට ඒ නැවුම් භාවය ලබලා දෙන්න මියගිය සතා අප්‍රමාණ වූ අමතර දුකක් විඳිනවා. ලෝකය තෘෂ්ණාවෙන් දුස්ශීලභාවයෙන් ඉදිරියට යනකොට ආහාරවල රසය හීනභාවයට පත් වෙනවා. අනාගතයේ යම් දිනයක මේ ලෝකයේ රසවත්ම ආහාරය බවට පත්වෙන්නේ කුරක්කන් වැනි කටුක රසයක් ඇති ආහාරයක් බව ධර්මයේ සඳහන් වෙනවා. වර්තමානයේ පින්වත් ඔබගේ දිව පිනවන රසවත්ම ආහාරය අයිස්ක්‍රීම් වටලප්පන් වගේ එදාට රසවත්ම ආහාරය වන්නේ කුරක්කන්. එදාට ඔබ අයිස්ක්‍රීම් එකක් අනුභව කළත් එහි රසය හරිම කටුකයි. මනුෂ්‍යයාගේ තෘෂ්ණාවේ වැඩිවීම නිසාම ආහාරයේ ඇති ප්‍රණීතභාවය රසවත්භාවය ක්‍රමානුකූලව හීනභාවයට පත්වීගෙන යනවා.

මනුෂ්‍යයාගේ තෘෂ්ණාව නිසාම සිදුකරන පාරිසරික විනාශයන්, වැඩි අස්වනු සඳහා යොදන පොහොර, කෘමිනාශක වස විස හේතුවෙන් මහ පොළොවේ ස්වාභාවික රස ඕජාව මැරී යනවා. රස ඕජාව මැරුණ මහ පොළොව මත උපද්දවන සෑම ආහාරයක්ම රසයෙන් හීනභාවයට පත්වීගෙන යනවා. අනාගතයේදී මේ හේතුවෙන් මහ පොළොව මත උපද්දවන සෑම ආහාරයක්ම රස ගැන්වීමට කෘතිම රසකාරකයන් යෙදීමට ලෝකයාට සිදුවේවි. එය දැනටමත් බහුල වශයෙන් සිදුවෙනවා.

ලොව්තුරා බුදුරජාණන්වහන්සේ අග්ගඤ්ඤ සූත්‍රයේදී දේශනාකරනවා මේ ලෝකය දිගුකලක් ඇවෑමෙන් කිසියම් කාලයක වැනසිලා විනාශවෙලා ගිහිල්ලා ඒ විනාශ වුනාවූ ලෝකය නැවත හටගන්නවා කියලා. මෙසේ හටගන්නා වූ නැවුම් ලෝකයේ මහපොළොව තිවෙන්නාවූ කිරි මත හටගන්නා වූ යොදය පරිද්දෙන් යොදයක් හටගන්නවා. එම යොදය වර්ණවත් රසවත් සුගන්ධවත් යොදයක්. හොඳින් නිපදවනු ලැබූ ගිතෙල් වෙඬරු යම් සේද එම රස පොළොව එවැනි පැහැයක් ගන්නාව කියලා. එම යොදය මී වදයක් සේ මිහිරියි. මුලින්ම

ලොව ඇතිවන සත්වයින් මේ යොදය කුමක් වියහැකිදැයි සිතා ඇඟිල්ලෙන් යොදය දිව ගා බලනවා. ඔහු එම රසයට ප්‍රිය වෙනවා. ඔහුගේ සිතට මෙම රසය පිළිබඳ තෘෂ්ණාව බැසගන්නවා. මුල් අවස්ථාවේ ඇඟිල්ලෙන් ගෙන රසවිඳි මෙම රස පොළොව එහි රසය කෙරෙහි එම සත්වයින් ඇතිකරගත් තෘෂ්ණාව වැඩිවීම නිසා ම එම යොදය සහිත රස පොළොව කැබලි කඩාගෙන කෑමට පටන් ගන්නවා. මේ හේතුවෙන් රස පොළොව අතුරුදහන් වෙලා යනවා. මින් අනතුරුව බිම් පපඩම් නැමැති රසවත්, වර්ණවත්, සුගන්ධවත් හතු විශේෂය මහ පොළොවේ පහළ වෙනවා. ගිතෙල්, වෙඬරු යම් සේ පැහැයක් ගනීද එවැනි පැහැයක් එම හතුවල තිබුණා. එය මීවදයක් සේ රසවත් ආහාරයක්. එම හතු විශේෂයද මනුෂ්‍යයින්ගේ අධි තෘෂ්ණාව නිසාම සකස්කොටගත් ලෝභ, ද්වේශ හේතුවෙන් අතුරුදහන් වී යනවා. ඉන් අනතුරුව බදාලතාව නැමැති පලා විශේෂය මහ පොළොවේ හටගන්නවා. එයද ගිතෙල් පැහැති බොහෝම රසවත් සුගන්ධවත් ආහාරයක්. එම ආහාරයද තෘෂ්ණාවෙන් භුක්තිවිඳීමට යාම නිසාම අතුරුදහන් වී යනවා. මීළඟට කුඩු නැති දහයියා නැති සුවඳවත් ඇල්සහල් විශේෂයක් මහ පොළොවේ පහළ වෙනවා. මෙම ඇල්සහල් විශේෂය උදේ වරුවේ පහළ වී සවස් වරුවේ අස්වනු ලබා දෙනවා. එම සුවඳවත් ඇල්සහල් විශේෂයද තණ්හාවෙන් අයිතිකරගැනීමට යාම නිසා අතිරික්ත තොග රැස්කර ගැනීමට යාම නිසාම මෙම ඇල්සහල්වල අස්වනු ලැබීමේ කාලය ක්‍රමානුකූලව දීර්ඝ වෙනවා. ලෝකය නැවත හටගැනීමේදී රස පොළොවේ ඕජාව නිසාම ස්වාභාවිකව මතුවී පැමිණි මේ සියළුම ආහාර මනුෂ්‍යයාගේ තෘෂ්ණාව නිසාම අතුරුදහන්ව ගියා ය කියලා ලොව්තුරා බුදුරජාණන්වහන්සේ දේශනා කරනවා.

ලොව්තුරා බුදුරජාණන්වහන්සේ දේශනා කොට වදාළ ඉහත ධර්මයට අනුව මනුෂ්‍යයාගේ අධි තෘෂ්ණාව නිසාම වර්තමානයේ ඔබ පය ගසාගෙන සිටින මහ පොළොවේ රස ඕජාව සියයට අනුවකින්ම විනාශ වී ගොස් අවසන්. ඒ නිසා ම පොළොවේ හටගන්නා වූ සෑම භෝගයක්ම ප්‍රණීතභාවයෙන් හීනවී, කටුක

රසයන් බවට පත්වෙනවා. ඒ නිසාමයි කෘතිම රසකාරක ආහාර නිෂ්පාදන ක්ෂේත්‍රයේ දිනෙන් දිනම ජනප්‍රිය වෙන්නේ. මේ සියල්ල මනුෂ්‍යයාගේ තෘෂ්ණාවේ ප්‍රතිඵලයන්. දුස්ශීලභාවය නිසාම මනුෂ්‍යයාගේ ආයුෂ හීනභාවයට පත්වෙන්න ඕනේ. දිනෙන් දින ඉහළ යන මනුෂ්‍ය, සත්ව හිංසාවන් නිසාම මනුෂ්‍යයා රෝගීභාවයන්ට පත්වෙන්න ඕනේ. මේවා හේතුඵලධර්මයන්. මනුෂ්‍යයාගේ තෘෂ්ණාව නිසාම රස පොළොව මරාගෙන ජනප්‍රියවෙන කෘතිම රසකාරකයන් මනුෂ්‍යයා රෝගීන් බවට පත්කරවීමේ කොන්ත්‍රාත්තුව හොඳින් භාරගෙන තිබෙනවා. මේවා මනුෂ්‍යයාගේ අකුසල් විසින්ම මතුකොටදෙන ප්‍රවනතාවයන්ය.

ලෝකයේ දියුණුවට පත්වෙන කෘතිම රසකාරක නිෂ්පාදන, ආහාර ක්ෂේත්‍රයේ දියුණුවක් බවට ලෝකයා උදම් ඇනුවද, ධර්මානුකූලව එය විමසීමේ දී, මනුෂ්‍යයාගේ කර්මය විපාක දීමේ මාරබලයක් බව ඔබට පෙනෙනු ඇත. මනුෂ්‍යයන්ගේ තෘෂ්ණාව නිසාම සිදුවෙන පාරිසරික විනාශයන්, වැඩි අස්වනු සඳහා පොහොර, කෘමිනාශක, කෘතිම වස විස යෙදීම හේතුවෙන් මහ පොළොවේ ස්වාභාවික රස ඕජාව මැරීයනවා. මනුෂ්‍යයා තුල ලෝභ, ද්වේශ, මෝහ, අකුසලයන් වැඩිවෙනකොට ඒවාට විපාක දීමට සුදුසු පරිසරයක් තමයි ඉදිරියට බිහිවෙන්නේ. මේ කෘතීම රසකාරකයන්ගේ භාවිතයේ අධිභාවය නිසාම රෝගීන් බවට, ආයුෂ හීනභාවයට පත්වෙන මනුෂ්‍යයින් ඊට විකල්පයක් වශයෙන් සොයාගෙන යන්නේද තව තවත් අකුසල්ම රැස්වෙන ක්‍රමවේදයන්ය. මහ පොළොවේ රස ඕජාව මනුෂ්‍යයාගේම තෘෂ්ණාව විසින් මරා දමද්දී මනුෂ්‍යයා දිව පිනවීමට උත්සාහ ගන්නේ අහිංසක සතුන්ගේ මස් මාංශවලින්ය. වර්තමානයේ ජාත්‍යන්තර ආහාර ක්ෂේත්‍රයේ වඳුරන්ගේ, හරකුන්ගේ, එළුවන්ගේ අමු රුධිරය සහ එම රුධිරයෙන් නිපදවන ආහාර වර්ගවලට විශේෂ ඉල්ලුමක් ඇතිවෙමින් පවතී. එම තිරිසන් සතා පණපිටින් සිටියදීම, එම සතාගේ ශරීරයේ අවයවයන් කපා ඉවත්කොට "නැවුම් මස්" ආහාරයට ගැනීම, නැවුම් සත්ව

රුධිරය ආහාරයට ගැනීම ලෝකයේ දියුණුවෙමින් පවතින ආහාර රටාවකි. තෘෂ්ණාව නිසාම මහ පොළොවේ රස ඕජාව මනුෂ්‍යයා මරා දැමුවේ යම් සේද අනාගතයේදී මස් මාංශ සඳහා තෘෂ්ණාවෙන් එම මස් මාංශ අධික ලෙස පරිභෝජනයට ගැනීමෙන් ඉල්ලුමට අනුව සැපයීමට අවශ්‍ය නිසා අනාගතයේදී මසට ගැනෙන තිරිසන් සතුන් ද ඉක්මණින් මසට සකස්කොට ගැනීම සඳහා කෘතිම බෙහෙත් වර්ග, එන්සයිම වර්ග ලබාදීම හේතුවෙන් අනාගතයේදී සත්ව මස් මාංශවලද රසය හීනවී යනු ඇත. මනුෂ්‍යයාගේ තෘෂ්ණාව හේතුවෙන් වස විස යොදා මහ පොළොවේ රස ඕජාව මරා දැමුවා සේම මස් මාංශවලට ඇති තෘෂ්ණාව නිසාම මසට හදන සතුන්ට කෘතිම බෙහෙත් වර්ග දීමෙන් එම මස් මාංශවල රසයද මරා දැමූ පසු අනාගතයේදී මනුෂ්‍යයාට ඉතිරි වන්නේ මනුෂ්‍යයාගේම ලේ බොන්නට මිනීමස් කන්නට ඇතිවන ආශාවයි. ලෝකයේ භෝජනාගාරවල බිහිවන අළුත් නැවුම් ආහාර වට්ටෝරුවල රටාව සත්වයාගේ කර්මයන් රැස්කිරීමේත්, කර්මයන් විපාකදීමේත් කැඩපතක්මය.

තිරිසන් සතා ජීවත්ව සිටියදීම පණ පිටින් සිටියදීම, එම සතාගේ ශරීරයෙන්, පෝෂණයෙන් රසයෙන් වැඩි කොටස් උණු උණුවේ කපා ඉවත් කොට ගැනීමේදී, පණ ගැහෙන එම සතාගේ රුධිරය එකතුකොට ගැනීමේදී එම සතා විඳින වේදනාව එම සතා අතීතයේ කළ අකුසලයන් විපාකදීමක්ය. එම සතා පීඩාවට පත්කරන දුස්ශීල මනුෂ්‍යයා විපාකය පිණිස අළුත් අකුසලයක් රැස්කරගනී. සීලයෙන් ප්‍රමාදභාවයට පත්වෙන මනුෂ්‍යයින් තුලින් රුධිරය දකින්න නැවුම් මස් කන්න අමු රුධිරය බොන්න මේ ඇතිවෙමින් පවතින කැමැත්ත මනුෂ්‍යයා තුල අනාගතයේ "මෘග සංඥාව" ඇතිවීමේ අනතුරු හැඟවීමයි. දුස්ශීලභාවය නිසා තිරිසන් සතාගේ නැවුම් මස් කන්න, නැවුම් රුධිරය උණු උණුවේම බොන්න මනුෂ්‍යයා තුල ඇතිවන මේ ආශාව නිසාම සත්ව ඝාතන සහ සත්ව හිංසාවන්ගේ අතිශය බියකරු අකුසල් විපාකයන් නිසාම අනාගතයේදී මනුෂ්‍යයාට මනුෂ්‍යයාගේම ලේ

බොන්නට, මිනීමස් කන්නට ඇති ආශාවන් සකස්කොට දෙනු ඇත. මේවා හේතුඵල ධර්මතාවයන්ය. සතුන් මරණ සතුන්ට හිංසා කරන මනුෂ්‍යයින් ඒ නිසාම අකුසල් රැස්කරගන්නා අතර සතුන් නොමරණ සතුන්ට හිංසා නොකරන යහපත් මනුෂ්‍යයන් ඒවා කරන දුස්ශීල අය කෙරෙහි ද්වේශය, ව්‍යාපාදය ඇතිකරගෙන අකුසල් රැස්කරගනිති. සතුන් මරණ සතුන් නොමරණ සියළු දෙනාම මාරයා ඉතා සියුම් ලෙස අකුසලයේ ග්‍රහණයට නතුකොටගෙන ඇත. ඉහත පාර්ශව දෙකෙන් පින්වත් ඔබ කුමන පාර්ශවයක සිටියද ඔබ තව තවත් අවදානම කරාම යනු ඇත. ලෝකය දිනෙන් දිනම ගමන් කරන්නේ විකෘතිය කරාය. දුස්ශීලභාවයේ ඵලයන් තුලින් මේ මතුවී පැමිණෙන්නේ අබුද්ධෝත්පාද කාලයක ඇරඹුම ආසන්නය කියා හඟවන කසකරුවන්ගේ හඬ බව ඔබ හඳුනාගත යුතුයි.

ලොව්තුරා බුදුරජාණන්වහන්සේ නමක් ලෝකයේ උපත ලබන කොට පස්මහ බැලුම් බලලයි උපත ලබන්නේ. බුදුරජාණන්වහන්සේ උපත ලැබූ "කාලය" නැමති අර්ථය බොහෝම වේගයෙන් විකෘතිභාවයට පත්වේගෙන යනවා. බෝධිසත්වයන් වහන්සේ එදා සුජාතා සිටු දියණියගේ කිරිපිඩු දානය වළඳලා, තම පාත්‍රය ගංගානම් ගඟේ පා කරලා අධිෂ්ඨානයක් ඇති කරගන්නවා. තමා සම්බුද්ධත්වයට පත් වේ නම් "මේ පාත්‍රය උඩුගංබලා යේවා" කියලා. බෝධිසත්වයන් වහන්සේට එම අධිෂ්ඨානය ඉටු වන බවට බලාපොරොත්තුව ඇති කරලා පාත්‍රය උඩුගං බලා ගියා. නමුත් වර්තමානයේ පින්වත් ඔබ කැළණි ගඟේ අඹතලේ කොහිලවත්ත ප්‍රදේශයෙන් උදය කාලයට පාත්‍රයක් පා කර හැරියොත්, අනිවාර්‍යයෙන්ම එම පාත්‍රය උඩුගංබලාමයි යන්නේ. උදේ කාලයට මෝය කටෙන් මුහුදු ජලය ගැලීම නිසා ගංගාවේ ජලය උඩුදිශාවටයි ඇදීයන්නේ. ඉන්දියාවේ වේවා ශ්‍රී ලංකාවේ වේවා කොයි ගංගාවේත් වර්තමාන තත්වය ඔහොමයි. මනුෂ්‍යයාගේ තෘෂ්ණාවේ බලවත්භාවය නිසාම ඇති වූ පාරිසරික විනාශයන් හේතුවෙන්ම ධර්මයේ සන්දිට්ඨික ගුණය දරාගැනීමේ රැකගැනීමේ ශක්තිය "කාලයේ" විකෘතිභාවයන් සමග හීනභාවයට

පත්වීගෙන යනවා. ධර්මයේ අර්ථයන් හීනභාවයට පත්වීමේ හැකියාව මිස, ධර්මයේ අර්ථයන් අර්ථවත් භාවයට පත්වීමේ ශක්තිය මනුෂ්‍යයා තුලින් ක්‍රමානුකූලව ගිලිහීයන බවට වර්තමාන "කාලය" විසින් පින්වත් ඔබට සාධක සහිතව අනතුරුහඟවා තිබෙනවා. මේ අනතුරුදායක බව දැකීමේදී පින්වත් ඔබගේ ජීවිතයට එකතු කරගත හැකි උතුම්ම සම්බුද් වචනය තමයි " අප්‍රමාදීභාවය" කියන වචනය. ඔය එකම වචනයේ අර්ථය තුල ඉහත අනතුර පරාජය කිරීමේ ශක්තිය ගැබ්වෙලා තියෙනවා. ධර්මයේ සන්දිට්ඨික ගුණයේ නාමයෙන් මාරයා පින්වත් ඔබට අත දිගුකොට පෙන්වන "පැෂන්" එකට තෙරුවන් සරණයාමේ, සිල් සමාදන්වීමේ, දන්දීමේ, සද්ධර්මය ශ්‍රවණය කිරීමේ තමා තමාට හෝ තමා අනුනට ලකුණු ලබා දීමේ මනෝභාවයන්ගෙන් මිදී පින්වත් ඔබ ඉදිරියේ ඇති අති භයානක අනතුර නුවණින් දැක අර්ථවත්ව සීල, සමාධි, ප්‍රඥා මාර්ගයේ ගමන් කරන්න අධිෂ්ඨානයන් ඇති කරගන්න.

භික්ෂුව පින්වත් ඔබට මේ සටහන් තබන්නේ ඔබ තුල සංසාර භය සකස්කොට ගැනීම සඳහා පමණක්ම බව සඳහන් කරනවා. මොකද සමහර මනුෂ්‍යයන් කැරපොත්තෙකුට තිබෙන බිය තරම්වත් බයක් සංසාරය කෙරෙහි නැහැ. සංසාරය කෙරෙහි එවැනි බයක් නැති පින්වත් ස්වාමීන්වහන්සේ නමක් වරක් භික්ෂුවට හමුවුණා ආරණ්‍යයකදී. උන්වහන්සේ මැදිවියේ, කඩවසම් වස් වැඩි ජ්‍යෙෂ්ඨ ස්වාමීන්වහන්සේ නමක්. උන්වහන්සේට බොහොම ගෞරවයෙන් වන්දනා කරලා තොරතුරු කථා කළා. උන්වහන්සේ ජාත්‍යන්තර සාමව්‍යාපාරවලට සම්බන්ධ සාමය උදෙසා ලෝකයේ දීර්ඝ පාගමන් වැඩිය ස්වාමීන්වහනසේ නමක්. උන්වහන්සේ ප්‍රකාශ කළා මේ දවස්වල ආරණ්‍යයවලට වඩින්නේ එර්දියෙන් යන්න අවශ්‍ය මාර්ගය දැනගැනීමට කියලා. ඒ පින්වත් ස්වාමීන්වහන්සේ එර්දියෙන් වඩින හැටි සොයමින් යනවා. භික්ෂුව විමසුවා ඔබවහන්සේ ඇයි එර්දියෙන් වඩින හැටි සොයන්නේ කියලා. උන්වහන්සේ කියනවා යුරෝපීය ජාතිකයින්ට

එර්දිය පෙන්වලා මවිතකරන්න පුළුවන් කියලා. ඉල්ලුමට අනුව සැපයුමක් ඉදිරිපත් කරන්නයි මේ පින්වත් ස්වාමීන්වහන්සේ උත්සාහයක නියැලෙන්නේ. ඒත් මේ පින්වත් ස්වාමීන්වහන්සේ දන්නේ නැහැ ඉල්ලන්නේත් සපයන්නේත් දෙකම කරන්නේ මාරයා බව. එර්දියෙන් යන්නේ කෙසේද යන්න සෙවීම කෙසේ වෙතත් පැවිදි උතුමන් උදෙසා ලොව්තුරා බුදුරජාණන්වහන්සේ දේශනා කොට වදාළ උතුම්ම යාගය වන ප්‍රාතිමෝක්ෂ සීලයෙන් පරිපූර්ණභාවයට පත්වී පංචනීවරණ යටපත් වූ සිල්වත් ජීවිතයක සකස්වෙන උතුම් සමාධිමත් සිත ප්‍රයෝජනයට ගෙන පින්වත් ඔබට අවශ්‍යනම් රූපි අරූපි ධ්‍යාන සකස්කොට ගැනීමටත් ධර්මයේ අර්ථවත්ම මාර්ගය වන ධ්‍යානයන්ගේද අනිත්‍ය මෙනෙහි කරමින් විදර්ශනා ඥානය දියුණු කරගැනීමටත් මාර්ගය ලොව්තුරා බුදුරජාණන්වහන්සේ දේශනා කොට තිබෙනවා.

උතුම් පැවිදි ජීවිතයක් කියන්නේ දුර්ලභ දෙයක්. භික්ෂුව දන්න බොහෝම පින්වන්ත මහත්මයෙක් සිටියා. මොහු වයස 70 පමණ විශ්‍රාමික රජයේ නිලධාරියෙක්. ඒ මහත්මයා පැවිදිවීමට අවස්ථාකීපයකදීම උත්සාහ කළ ද අවසාන මොහොතේ පැවිදිවීම මගහැරී ගියා. කෙසේ හෝ අවසානයේ මේ මහත්මයා පැවිදි වෙනවා. නමුත් මාස 3යි. පැවිදි ජීවිතයේ සිටියේ. විදේශගතව සිටි දරුවා සහ බිරිඳ පැමිණ මෙම ස්වාමීන්වහන්සේව නිවසට කැඳවා, උපැවිදි කරනවා. ඔහුත් කැමැත්තෙන්මයි උපැවිදි වෙන්නේ. මෙතරම් වයසට ගිහිල්ලත් විශ්‍රාමික නිදහස් ජීවිතයක් ගත කරලත් උතුම් චීවරයක් දරන්න පින තිබුණේ නැහැ. සංසාරයේ අප විසින් උතුම් පැවිද්ද ලබලා, කළා වූ වැරදිවල විපාකයන් මයි අපි මේ දකින්නේ. ඉහත කාරණයන් තුලින් පින්වත් ස්වාමීන්වහන්සේලා තමා පිළිබඳව තමාම ගෞරවයක් ඇතිකර ගන්න ඕනේ. මේ මොහොතේ උතුම් අරිහත් ධජය දරන්නට තමන් විසින්ම සංසාරයේ මොන තරම් කුසල් ධර්මයන් කරන්න ඇති ද කියලා. අප විසින් ම අතීතයේ රැස්කරගත්තාවූ කුසල් ධර්මයන්, වර්තමානයේ අපි අකුසල් සඳහා ප්‍රයෝජනයට

ගතහොත් ඉන් ඇතිවෙන්නා වූ ඵලය සංස්කාරයන්ගේ බියකරුභාවය පිළිබඳ අපට පාඩමක් උගන්වන කමටහනක්මය. මේ උතුම් මනුෂ්‍ය ජීවිතය ලබලා උතුම් පැවිදි ජීවිතයක් ලබලා යම් පින්වතෙක් සීලයෙන් දුර්වලවෙනකොට භික්ෂුව එය දකින්නේ සංස්කාරයන්ගේම බියකරු අනිත්‍ය ස්වභාවය ලෙසයි. සංස්කාර විසින්ම අපව ඉහළට ඔසවලා තබලා සංස්කාර විසින්ම අපව ප්‍රපාතයට ඇද දමනවා. සංස්කාරයන්ගේ අනිත්‍යභාවයේ ඵලය සුගතිය සහ දුගතිය අතර සත්වයා දෝලනය කිරීමයි.

# පින්වත් ඔබ ලෝකයෙන් හුදකලා වෙන්න. එම හුදකලාව තුල සිටිමින් ලෝකය දකින්න

මනුෂ්‍යයා තුලින් තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාව සහ සීලයේ උතුම් හරයන් ශක්තිමත් වෙනකොට මනුෂ්‍යයා තුල මනුෂ්‍යත්වයේ ඕජාව ලියලා වැඩෙනවා. මනුෂ්‍යත්වයේ ඕජාව කියන්නේ අලෝභ, අද්වේශ, අමෝහ ධර්මයනුයි. මේ ඕජාව මනුෂ්‍යයා තුල වැඩෙනකොට තමා තුලින් පංචනීවරණ තුනීභාවයට පත් වී, තමාත් සාමකාමී වෙනවා. සමාජයත් සාමකාමී වෙනවා. අධික තෘෂ්ණාව නිසාම මනුෂ්‍යයා මනුෂ්‍යත්වයේ ඉපදීමට අවශ්‍ය ඕජාව, සැප සෙවීමට යන ගමනේදී හීනකරගන්නවා. දැන් මනුෂ්‍යයා තුල වැඩෙන්නේ ලෝභ, ද්වේශ, මෝහ කියන අමනුෂ්‍ය ඕජාවන්.

මේ මනුෂ්‍යත්වය පරාජය කොට යන ගමනේදී සමාජය ධර්මයේ සන්දිට්ඨික ගුණයට මාරාන්තික ප්‍රහාරයක් එල්ල කරමිනුයි ඉදිරියට ඇදෙන්නේ. අපි සීලයෙන් දුර්වලවෙනකොට බුදුරජාණන්වහන්සේ දේශනා කොට වදාළ ගිහි පැවිදි උතුම් සීලයන්ගේ අර්ථයන් දියකරහැරීමෙන් එම අර්ථයන්ට නොවටිනා වටිනාකමක් ලබාදීමේ ප්‍රවණතාවයක් සමාජය ඉදිරියේ තිබෙනවා. තෘෂ්ණාව නිසාම මනුෂ්‍යයා මහ පොළොවේ රස ඕජාව විනාශ කොට දැමුවා සේම තෘෂ්ණාව නිසාම මනුෂ්‍යයා අස්ශ්‍රද්ධාවත් දුස්ශීලභාවයත් තුලින් ධර්මයේ සන්දිට්ඨික ගුණය විනාශය කරා රැගෙන යනවා. තෘෂ්ණාවේ දාසභාවය නිසාම අවසානයේදී අපිට සංසාර බිය සකස්කරන සැබෑ ලොව්තුරා ධර්මය වෙනුවට ලෝකයා සුරතල් කරන "රීකන්ඩිෂන්" ධර්මයන් ඇසෙනු ඇත.

බුදුරජාණන්වහන්සේ බොහොම පැහැදිලිවම දේශනා කරනවා තථාගතයන්වහන්සේ සද්ධර්මය ලෝකයාට දේශනා කරන්නේ මනුෂ්‍යයාව සුරතල් කිරීම සඳහා නොව, මනුෂ්‍යයා විශ්මයට පත්කිරීම සඳහා නොව, ලාභ සත්කාර බලාපොරොත්තුවද නොව, තමා මෙසේ යැයි ලෝකයාට හඳුන්වාදීමට නොව සත්වයාගේ මෙලොව පරලොව යහපත සඳහා පමණක්මය කියලා. මනුෂ්‍යයා තුලින් මනුෂ්‍ය ඕජාව හීනවෙනකොට නීච අමනුෂ්‍ය ලෝකයට අදාළ චිත්තයන් තමයි සකස්වෙන්නේ.

භික්ෂුවට මුණගැසුනු එක මහත්මයෙක් ප්‍රකාශ කළේ "හාමුදුරුවනේ සමාජය දකිනකොට හරි බයක් ඇතිවෙනවා" කියලා. මිනිමැරුම්, මංකොල්ලකෑම්, දූෂණ, හොරමැරකම්, අලෝභ, අද්වේශ, අමෝහ මනුෂ්‍ය ඕජාව මැරීයන සමාජයක සැබෑ කැඩපත දැන් පින්වත් ඔබට පෙනෙනවා. මනුෂ්‍යයාගේ තෘෂ්ණාව නිසාම මහ පොළොවේ රස ඕජාව මැරී ගොස් කෘතීම රසකාරකයන් තුලින් මනුෂ්‍යයා දිව පිනවනවා සේම දුස්ශීලභාවය අශ්‍රද්ධාව හේතුවෙන් මනුෂ්‍යත්වයේ ඕජාව මැරීයමින් ඇතිවන, නීරස මනුෂ්‍ය ජීවිතය තෘප්තිමක් කරගැනීමට මිනිමැරුම්, දූෂණය, තාක්ෂණය, හොරමැරකම් නැමැති රසකාරයකයන් ජීවිතයට එකතුකර ගන්නවා. මේ මොහොතේ පින්වත් ඔබ මේ අවදානම නුවණින් දකින්න දක්ෂ වෙන්න. පින්වත් ඔබ ලෝකයේ හුදෙකලා වෙන්න. ඒ හුදෙකලාව තුල සිටිමින් ලෝකය දකින්න. අවංකව ඔබට සිතෙනවා නම් ලෝකය තුල ඔබ අමුත්තෙක්ය කියලා දුකට ඇදී යන ලෝකයාගෙන් දුරස්ව පින්වත් ඔබ ඉහත සසරබිය නුවණින් මෙනෙහි කරන්න. මේ මොහොතේ එය ඔබට කරන්න තියෙන අර්ථවත්ම භාවනාවයි. භික්ෂුව පින්වතුන්ලාට මොනම හේතුවක් නිසාවත් අනාපානසති භාවනාව, අසුභ භාවනාව, සතර සතිපට්ඨාන භාවනාව ගැන කියලා දෙන්න උත්සාහ කරන්නේ නැහැ. ඉහත භාවනාවන් වැඩෙන්න නම් තමා තුල සුදුසු පරිසරයක් සකස්වෙන්න ඕනේ. අන්න ඒ සුදුසු පරිසරය ඔබ තුල සකස්කොට දෙන්නේ සංසාරයේ බියකරුභාවය නුවණින් මෙනෙහි කිරීමෙන්මය. මේ සංසාර බිය නිසාමයි මනුෂ්‍යයා සීලය තුල ශක්තිමත් වෙන්නේ, ඒ ශක්තිමත් සීලයමයි

භාවනාවකට අවශ්‍ය සංසිඳීම ඔබ තුල සකස්කොට දෙන්නේ. හෙට දවසේ, පින්වත් ඔබ මේ සමාජයට දරුවෙක් බිහි කළොත් ඒ දරුවා තව වසර 10 කින් මුහුණදෙන්නේ මොනතරම් බියකරු සමාජයකටද? මනුෂ්‍යයාගේ රුධිරය මනුෂ්‍යයා දකින්න කැමති කරන මෘග සංඥාව මනුෂ්‍යයා තුල සකස්වෙන සමාජයක්. එවැනි සමාජයකට පින්වත් ඔබ හෙට දරුවෙක් බිහි කරනවා කියන්නේ ඔබ ඔබේ ලෙයින් පළිගන්නවා කියන කාරණයයි. දුස්ශීලභාවය නිසාම මනුෂ්‍යයා කරගත් අකුසල් විපාක දීමේදී මනුෂ්‍යයා තමා තමන්ගෙන්ම පළිගැනීමේ තැනට සමාජය පැමිණ තිබෙනවා.

භික්ෂුවක් උතුම් සමාධියෙන් අරමුණුකොට බලනකොට තමා තමන්ගෙන්ම පළිගත් අහිංසක පිරිමි පාසල් දරුවෙක් දැක්කා. දහසය හැවිරිදි මේ පාසල් දරුවා ළමා ප්‍රේම සම්බන්ධයකට දෙමාපියන් ඥාතීන් විරෝධය පළකිරීම නිසා වස බී දිවිනසාගන්නවා. මේ දරුවාට අකීකරුකම විනා මැරෙන්න වෙන කිසිම අවශ්‍යතාවයක් තිබුණේ නැහැ. ලෝභ, ද්වේෂ, මෝහ කියන අකුසල ඕජාවන් ළමා කාලයේදීම ජීවිතය තුල වැඩීම නිසා ජීවිතය රසවිඳින්න රසකාරකයක් ලෙස භාවිතයට ගන්නේ පළිග ැනීම, මරාගැනීම, විනාශකිරීම. එහෙම නොකොළොත් ජීවිතයට රසයක් නැහැ. ජීවිතයේ සැබෑම අහිංසක රසයක් ඇතිකරන ශ්‍රද්ධාව සීලය මැරිලා ගිහින්. තෘෂ්ණාව නිසාම මේ දරුවා ජීවිතය නැති කරගන්නේ ලෝකයටම පාඩමක් උගන්වන්න. අපි හරිම දක්ෂයි, අපි ඉගෙනගෙන නැතුව ලෝකයාට පාඩම් උගන්වන්න. රස ඕජාව මැරුණ පොළොවේ අපි මිහිරිඑල සොයනවා වගේ අපි මනුෂ්‍ය ඕජාව නැතිකරගත් ජීවිතය තුලින් ධර්මයේ අර්ථය සොයනවා. මේ වස බී සිය දිවිනසාගත් අහිංසක දරුවා නැවත උපත සකස් කරගන්නේ බ්‍රොයිලර් කුකුලෙක් වෙලා. ජීවිතයේ වටිනාකම ධර්මය තුලින් නොදකින මේ අහිංසක දරුවා දැන් දින 45ට වරක් ජීවිතය නැති කරගන්නවා බ්‍රොයිලර් කුකුලෙක්ව ඉපදිලා. මේ දරුවාට සංස්කාර විසින් ලබාදුන් තෑග්ග මොන තරම් සාධාරණද? සංස්කාර හේතුවෙන් සකස්වෙන විඤ්ඤාණය

නැමැති මැජික්කරුවා, එක නිමේශයකින් පාසල් දරුවෙක්ව බ්‍රොයිලර් කුකුල් පැටවෙක් කරනවා. කැමැත්තෙන්ම වස බීලා මැරුණු දරුවා දැන් බෙල්ල කපාගෙගන දින 45 කට වරක් මැරෙනවා.

සද්ධර්මය සන්දිට්ඨිකව පවතින මේ උතුම් අවස්ථාවේ ලැබූ උතුම් මනුෂ්‍ය ජීවිතය මෝහ නිසාම යමෙක් මරාදමන්නේ නම් ලෝක ධර්මය විසින් වේගයෙන් ඉපදිලා ඉක්මණට මැරෙන ජීවිතයක් ලබා දෙනවා. මේ මොහොතේ බෞද්ධයා කියන පාට පාට ලේබලයක් අලවලා ධර්මයේ නාමයෙන් සැපයෙන් පිරුණු ලෝකයක් ඔබට පෙන්වන ඔය විඤ්ඤාණය නැමැති මැජික්කරුවා පින්වත් ඔබ, මමය, මගේය කියලාමයි හඳුනාග න්නේ. සංස්කාරයන්ගේ රුව ගුණ හේතුවෙන් සකස් වූ හිස් වේගයක් බව දකින්නේ නැහැ.

රටේ ජීවත්වෙන බොහෝම ප්‍රභූ බෞද්ධ මහත්මයෙක් සිටිනවා. ඒ මහත්මයා තමන්ගේ අතවැසි පිරිසට මෙහෙම කියනවා. "ඔය පොත්වල තිබුණාට අතීතයේ රහතන්වහන්සේලා ඍර්දියෙන් වැඩියාය කියලා ඕවා බොරු. මිනිස්සු කොහොමද උඩින් යන්නේ?" කියලා? මේ ප්‍රභූ මහත්තයා බොහොම විශ්වාසයකින් ප්‍රකාශ කරනවා. මේ සටහනේම ඉහත සඳහන් කළ පින්වත් ස්වාමීන්වහන්සේ යුරෝපීය ජාතිකයන් මවිතයට පත්කිරීමට ඍර්දිය සොයනවා. මේ පින්වත් ප්‍රභූ මහත්මයා ඍර්දි ප්‍රාතිහාර්යය සම්පූර්ණයෙන් ම ප්‍රතික්ෂේප කරනවා. පංචනීවරණ තීව්‍ර භාවයට පත්වෙච්ච මනුෂ්‍යයින්ගේ සිතේ කයේ ගොරෝසුභාවය මනුෂ්‍යයා මොනතරම් මිත්‍යාදෘෂ්ටියකට කොටුකරනවාද? එවැනි කාමච්ඡන්දයන්ගෙන් ගොරහැඩිවෙච්ච මනුෂ්‍යයෝ කෙසේනම් පංචනීවරණ යටපත් වූ කයේ, සිතේ සැහැල්ලුව අත්දකින්නද? විඤ්ඤාණය නැමැති සාහසික හිස් මැජික්කරුවා ඇති දෙය නැතිකොට පෙන්වනවා. නැතිදෙය ඇතිකොට පෙන්වනවා. තෘෂ්ණාවේ නූල් පන්දුව දිග් වෙන්න දිග් වෙන්න මේ මැජික්කරුවා අළුත් අළුත් මැජික් පෙන්වනවා.

ඒ කියන්නේ මතවාද දෘෂ්ටි වපුරනවා. මේ සටහන් තබන භික්ෂුවටත් පින්වත් ඔබටත් ඍද්ධි ප්‍රාතිහාර්ය දක්වන්න නොහැකි බව ඇත්ත. අපට නොහැකිය කියලා අතීතයේ එම ශක්තීන් ගොඩනගාගත් උතුමන්ට අගෞරව කිරීම මිත්‍යාදෘෂ්ටියම වැළඳගැනීමක් වෙනවා.

ලොව්තුරා බුදුරජාණන්වහන්සේ දේශනා කරනවා තථාගත තෙමේ කයත් සිතෙහි නගාද සිතත් කයෙහි නගාද සුඛසංඥාත් ලඝුංසඥාත් කයෙහි බහාතබත්ද එකල්හි කය නිතැතින්ම පොළොවෙන් අහසට නගී කියලා. නන්වැදෑරුම් ඉදු පෙළහර දක්වයි කියලා. උතුම් සමාධියේ ආශ්චර්යවත් ප්‍රාතිහාර්යයන් බුදුරජාණන්වහන්සේ මෙසේ දේශනා කොට තිබියදී පංචනීවරණයන්ගෙන් කයත්, සිතත් ටොන් ගණනින් බරකරගත් මනුෂ්‍යයින් ඒ කාමච්ඡන්දයන්ගේ බරට කෙසේ නම් උඩට එසවෙන්නද? මේ පංචනීවරණයන්ගේ බර නිසා මනුෂ්‍යයා සතර අපාය නැමැති පහළටමයි ඇදිලා යන්නේ. වයස් භේදයකින් තොරව, කාමච්ඡන්දයන්ගේ බර ජීවිතවලට පිරවෙනවා. භික්ෂුව හමුවීමට පැමිණි පින්වත් මහත්මයෙක් මීට මාස හයකට පෙර ප්‍රකාශ කළා, තමාගේ ඥාති පුතා බොහෝම කීකරුයි හොඳින් පින් දහම් කටයුතු කරනවා අධ්‍යාපන කටයුතු කරනවා කියලා. නමුත් ගිය සතියේ දවසක එම මහත්මයා ඇවිත් කියනවා "හාමුදුරුවනේ මගේ ඥාති පුතා දැන් හරිම අකීකරුයි. අධ්‍යාපන, ධර්ම කටයුතුවලට හරිම උදාසීනයි. පැය ගණන් කාමරයේ දොර වසාගෙන අන්තර්ජාලය බලනවා" කියලා. මෙවැනි කාරණයකදී භික්ෂුවක් හැටියට දෙන්න පිළිතුරක් නැහැ. දුක් දෙය සැපයක් කොට ගතහොත් අනිත්‍ය දෙය නිත්‍ය වශයෙන් ගතහොත් අසුභ දෙය සුභ වශයෙන් ගතහොත් අනාත්ම දෙය ආත්මීය වශයෙන් ගතහොත් බලාපොරොත්තු කඩවීම මිස අන් දෙයක් ඉතිරි නොවන බව බුදුරජාණන්වහන්සේ දේශනා කොට තිබෙනවා.

දිනක් බුදුරජාණන්වහන්සේ පූර්වාරාමයේ වැඩසිටින විට විශාඛා උපාසිකාව බොහොම තෙහෙට්ටුවෙන් දහවල්

කාලයේ බුදුරජාණන්වහන්සේ බැහැදකින්න පැමිණියා. බුදුරජාණන්වහන්සේ විශාඛාවගෙන් විමසනවා මේ මහ දවල් කොහේ සිට ද පැමිණියේ කියලා. විශාඛා උපාසිකාව කියනවා, පසේනදි කොසොල් රජතුමා මුණගැසෙන්න ගියා, මට රාජකාරී කටයුත්තක් තිබෙනවා. රජතුමාට කියලා කරව ගන්න. ඒත් එම රාජකාරී කටයුත්ත රජතුමා මට අවශ්‍ය ආකාරයට කරලා දෙන්නේ නැහැ. අදත් මම මේ රස්තියාදු වෙලා සිටුමැඳුරට යනවා කියලා. ඒ වේලාවේ බුදුරජාණන්වහන්සේ දේශනා කරන්නේ "විශාඛාව අපි කැමති දෙය අපි කැමති ආකාරයටම සිදුවේය කියලා බලාපොරොත්තු වුනොත් දුකක්මයි සකස්වෙන්නේ" කියලා බුදුරජාණන්වහන්සේ විශාඛාවට දේශනා කළේ නැහැ. "ඔබ ගිහින් රජතුමාට කියන්න ඔබයි ශාසනයේ අග්‍රදායිකාව. එම නිසා මේ රාජකාරී කටයුත්ත කරලා දෙන්න කියලා. බුදුරජාණන්වහන්සේ මතක් කළාය" කියලා. සම්මා සම්බුද්ධ මුවින් වචනයක් පිටවුණොත්, අර්ථයක් දේශනා වුනොත් එය අනිත්‍ය සංඥාවක් මතුවෙන ප්‍රඥාව වැඩෙන දිශාවයි ඒ වචනය දේශනා කළේ. එම නිසා ශ්‍රාවකයින් වශයෙන් පින්වත් ඔබත් සමාජය තුල වේගයෙන් පැතිරීයන තෙරුවන් කෙරෙහි අශ්‍රද්ධාව සහ දුස්ශීලභාවයේ අනිටු ඵලයන් පින්වත් ඔබට පීඩා කරන කොට ඒවා තුලින් ප්‍රඥාව වැඩෙන, දුකෙන් මිදීමට පාර පෙන්වන අනිත්‍ය සංඥාවක්මයි වැඩීමට දක්ෂවෙන්න ඕනේ. එසේ නොවුනහොත් අනුන් නිසා තමන් අකුසල් රැස් කර ගන්නවා. වැරදි කරන කෙනාගේ වැරැද්ද නිවැරදි කිරීමට උත්සහගන්න ගමන්ම වැරැද්දෙන් පිරුණු ලෝකයෙන් මිදෙන දිශාවට සිතුවිලි සකස්කර ගන්න. සිල්වත් වීමට උත්සාහ ගන්න. දුසිල්වතුන් නිසා දුසිල්වත් වීමේ මාරවෑයම ඔබ නුවණින් මෙනෙහි කරන්න.

අපට හැමෝම සතුටු කරන්න බැහැ. යහපත් දේවල් කරල ලබන සතුට පිනයි, පින ගැන නොදන්න මිනිස්සු සතුටෙන් බැහැරවෙලා දුකට යනවා. තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාව සීලය

දානය නිසාමයි පින නැමැති උල්පත සකස් වෙන්නේ. ඉහත කාරණා තුනෙන් බැහැරවෙන පින්වතා ජීවිතය තෘප්තිමත් කිරීමට කුණු රසයන්මයි සොයන්නේ. සීලයෙන් දුර්වල වෙන මනුෂ්‍යයින් සොයන කුණු රසය බොහෝම ලාභයට ලබාදෙන ක්‍රමවේදයන් ඕනෑතරම් සමාජය තුල තිබෙනවා. දුස්සීලභාවයේ ඵලයන් නිසාම නව ක්‍රමවේදයන් ඇතිවෙනවා. මේ ක්‍රමවේදයන් තුලින් ඔබ ජීවිතය තෘප්තිමත්භාවයට පත්කරගැනීමට ගියහොත් එහි අනිටු විපාකයන් හැටියට මීළඟ ජීවිතයේදී සැබෑම කුණු රසය රසකරමින් තළුමරමින් භුක්ති විඳීමට ඔබට අවස්ථාව ලැබෙනවා.

අතීත දුස්සීලභාවය නිසා තිරිසන් ලෝකයට වැටී සැබෑම දුස්සීලභාවයේ ඵලය වන කුණු රසය භුක්ති විඳින පිරිසක් භික්ෂුවට හමුවුණා. භික්ෂුව ගමක පිණ්ඩපාතයේ වඩිනකොට පාරට මීටර් 25ක් පමණ ඈතින් ලොකු හරකෙක් මැරිලා සිටියා. දෙවන දවසේ පිණ්ඩපාතයේ වඩිනකොට මෙම මියගිය හරකා බෙරයක් වගේ ඉදිමී තිබුණා. තුන්වැනි දිනයේ පිණ්ඩපාතයේ වඩින විට, බල්ලන් වටකරගෙන මැරුණ සතාගේ මස් කඩාගෙන කමින් සිටියා. කොහොමත් සතියක් යන්න ලැබුණේ නැහැ. බල්ලන්, නරියන්, කබරගොයින් විසින් මේ හරක් මළකුණ සම්පූර්ණයෙන් කාල ඉවර කළා. මේ දවස් ටිකේ බල්ලන්ට මගුල් ගෙදරක් වගේ. මගුල් ගෙදර මනාලිය තමයි මැරිච්ච හරක් කුණ. ඒ අය බොහෝම ප්‍රබෝධයෙන් කුණු මස් රසවිඳලා සතුටු වුණා. උදේ පාන්දරම එතැනට පැමිණෙන සුදු කොක්කු හරක් කුණට වැදුන පණුවෝ සහ නිලමැස්සන් සම්පූර්ණයෙන්ම කාලා ඉවර කළා. සතියක් යන කොට එම මළකුණ තිබූ ස්ථානය මැස්සෙක්වත් නැති තරමට සුද්දවෙලා තිබුණා. බලන්න තිරිසන් ලෝකයේ මළකුණකට ඇති වටිනාකම. පින්වත් ඔබ මනුෂ්‍ය ජීවිතයේදී තාක්ෂණය තුලින් කුණු කාම රසයන් සොයාගොස් දුස්සීලභාවයට පත්වුවහොත් එහි හේතුඵල ධර්මයන් වශයෙන් ලබන ජීවිතයේදී තිරිසන් ලෝකයේ ඉපිද බොහෝම කැමැත්තෙන් මළකුණු රසවිඳීමට අවස්ථාව ලැබේවි. පින්වත් ඔබ තාක්ෂණික

මෙවලම් ඉදිරියේ වාඩිවෙලා යම්සේද ඇසට, මනසට කාම රසය ලබා දෙන්නේ එසේමයි තිරිසන් සතුන් මළකුණට වහවැටිලා මළකුණ ළඟ පැලපදියම්වෙලා මළකුණ රස විඳින්නේ. මේ මළකුණ කන තිරිසන් සතුන් දිහා බලනකොට සංසාර බිය පිළිබඳ මොන තරම් ගැඹුරු කමටහනක් එහි තිබෙනවාද? එම මළකුණ වටකරගෙන කන සතුන් දකිනකොට භික්ෂුවට මතකයට එන්නේ අරක්කු බෝතලයක්, හරක්මස් කටගැස්මක් මේසයක් මත තබා එය පාවිච්චි කරන මිනිසුන් පිරිසක්මයි. අරක්කු වෙනුවට කුණු ලේ රසයත් කටගැස්ම වෙනුවට කුණු මසත්, හේතුඵල ධර්මයන්ට අනුව සංස්කාර විසින් ලබාදීලා තිබෙනවා.

භික්ෂුව ඈත ගමක කුටියක වැඩසිටියා. එම ගමේ එළවළු වගාවෙන් ජීවත්වන පින්වතුන් සිටියේ. භික්ෂුව එම ගමේ ගෙපිළිවෙලින් පිණ්ඩපාතයේ වැඩියා. එක නිවසකට වැඩමකොට සිටියදී එම නිවසේ පින්වත් මවක් පීරිසියක තබාගත් කිරිබත් කැබලි දෙකක් භික්ෂුවට පූජා කිරීමට රැගෙන පැමිණියා. ඇය එක කිරිබත් කැබැල්ලක් පූජාකළ පසු භික්ෂුව "ප්‍රමාණවත් මැණියෝ" කියලා අත වැසුවා. ඒ වෙලාවේ මේ මැණියන් කියනවා "යක්ෂයාට වෙන්කරපු දෙය අපි නැවත ගන්නේ නැහැ" කියලා. එහෙම කියන කොටම භික්ෂුව දැනගත්තා ඇය අන්‍ය ආගමික මවක්ය කියලා. ඒ වෙලාවේ භික්ෂුව බොහෝම කැමැත්තෙන් දෙවැනි කිරිබත් කැබැල්ලත් පිළිගත්තා. එම මව දරණ ආගමික වටිනාකම තුල ඇය භික්ෂුව දැක්කේ යක්ෂයා හැටියට. යක්ෂයාටයි ඇය කිරිබත් කැබලි දෙක වෙන් කළේ. ඒකයි යක්ෂයාට වෙන් කළ දෙය නැවත ගන්නේ නැහැ කියලා කිව්වේ. ඒ වෙලාවේ භික්ෂුව පාත්තරයේ පියන වහලා ඇයට පිං දෙන්න. "අභිවාදන සීලිස්ස" කියන වචන දෙක පිටකෙරුවා පමණයි. එම මව කීවා "අපිට පින් එපාය" කියලා. භික්ෂුව ඒ වෙලාවේ ඇයට කිව්වා "දෙවියන්ගේ පිහිටයි" කියලා. එහෙම කියන කොට ඇය සතුටු වුණා. සිනාසුණා. භික්ෂුවට අවශ්‍ය වුණේ කෙසේ හෝ එම මැණියන්ව සතුටු කරන්න. භික්ෂුව ඒ දෙය කළා. භික්ෂුව දෙවි

පිහිටයි කිව්වා කියලා භික්ෂුවගේ භික්ෂුත්වයට කිසිම හානියක් වුණේ නැහැ. ඇය භික්ෂුව කෙරෙහි වෛරයක් කේන්තියක් සකස්කොට ගත්තානම් භික්ෂුව දන්නවා ඇයට ඉන් අත්වන අකුසලයේ තරම. ඒ නිසාමයි භික්ෂුව ඇයට උපකාරවූයේ. ඇයව සතුටුකොට පිටත් වූයේ. උතුම් සිල්වත්භාවය ඔබව අවදානමෙන් මුදවනවා වගේම අන්‍යයන්ද අවදානමෙන් මුදවනවා. නමුත් ඉන් පසුව භික්ෂුව ඇයගේ නිවසට වැඩියේ නැහැ. අන්‍ය ආගමික පින්වතුන්ලා ගොඩාක් කැමැත්තෙන් භික්ෂුවට පිණ්ඩපාතය පූජා කරලා තිබෙනවා වෙනත් ගම්මානවලදී.

# දානය වැරදිලාවත් අපේ ගෙදරට ආවොත් බල්ලා ලිහනවා

**(දුස්සීල භාවය නිසා සකස් වෙන ද්වේශය හරිම භයානකයි.)**

තවත් වරක් භික්ෂුව ගම්මානයක ජීවත්වෙනකොට එම ගමේ අතීතයේ සිට සකස්කොට තිබූ දානය ලබාගැනීමේ ක්‍රමයේදී ගමේ හැමෝටම දානය දීමේ අවස්තාව ලැබී තිබුණේ නැහැ. එම නිසාම දානය නොමැති පින්වතුන්ලා අමනාපයෙන් සිටියේ. ගම්වල පැවතෙන සම්ප්‍රදාය වෙනස් කරන්න අපි යන්නේ නැහැ. තිබෙන ක්‍රමය තුල හැකිනම් ගමේ ඉන්නවා. එම ක්‍රමය ගැටළු සහගත නම් ගමෙන් පිටවී යනවා. දවසක් එම ගමේ පිණ්ඩපාතයේ වඩිනකොට බෞද්ධ කාන්තාවන් දෙදෙනෙක් භික්ෂුව වඩින පාරේ අනෙක් පැත්තෙන් වැවට දිය නෑමට යනවා. භික්ෂුව බිම බලාගෙනයි වැඩියේ. ඉන් එක කාන්තාවක් අනෙක් කාන්තාවට කියනවා "දානය වැරදිලාවත් අපේ ගෙදරට ආවොත් බල්ලා ලිහනවා" කියලා. භික්ෂුව ඒ වේලාවේ තේරුම් ගත්තා මේ කාන්තාව හුගාක් කෙන්තියෙන් ඉන්නේ කියලා. නමුත් භික්ෂුව ගමෙන් පිටවෙන්න පෙරාතුව එම කාන්තාවගේ නිවසට පිණ්ඩපාතය ලබාගැනීම සඳහා වැඩියා. ඇය නිවස තුලට ගොස් බත් ගෙනත් පූජා කළා. භික්ෂුව ඇයට පින් අනුමෝදන් කළා. එහෙත් ඇය අත්දෙක එක්කොට වැඳගෙන සිටියේවත් නැහැ. ඇය භික්ෂුව හාස්‍යයට ගත්තා කියලා භික්ෂුවට සිතුනා. භික්ෂුව බොහෝම කරුණාවෙන් පිං අනුමෝදන් කරලා ගෙදර කඩුල්ලෙන් පිටවුණා. ඒ ගෙදර හිටපු ඇතිකරන බල්ලා එදා බැඳලා සිටියේ නැහැ. නිදැල්ලේ ආලින්දයේ සිටියා. ඒත් ඒ බල්ලා භික්ෂුවට

බිරුවේවත් නැහැ. ඒ වේලාවේ භික්ෂුවට සිතුනා ගෙදර පින්වත් නෝනා තරම් ගෙදර හදන බල්ලා සැර නැහැය කියලා. භික්ෂුව ඇයගේ දෙපා අසලටම වැඩියත් ඇයගේ ද්වේශ සහගත සිතිවිළි නිසාම ඇයට ලැබුනු අවස්ථාවෙන් ප්‍රයෝජනයක් ගත්තේ නැහැ. එහෙත් භික්ෂුව තමන්ට ලැබුණ අවස්ථාවෙන් ප්‍රයෝජන ගත්තා. ගෙදර ආවොත් බල්ලා ලෙහනවා කියලා අදාළ කාන්තාව කියනවා ඇසිලාත්, ඇයට මෛත්‍රිය කළා. පින්වත් ඔබ පරිස්සම් වෙන්න. දුස්සීලභාවය නිසාම, සකස්වෙන ද්වේශය හරිම භයානකයි. අපට ලැබෙන වටිනා අවස්ථාවන් අපට අහිමිකරනවා.

ද්වේශය සකස්වෙන්නේම සක්කාය දිට්ඨිය නිසාමයි. ලෝකයාගෙන් ප්‍රතිචාර ප්‍රශංසා වැඩිවෙන්න වැඩිවෙන්න අපේ ජීවිතවලට වේගයෙන් සක්කාය දිට්ඨිය කාන්දුවෙනවා. මේ අවදානම නිරතුරුවම මනුෂ්‍යයාව ධර්මානුකූලව ජීවිතය දෙස බැලීමේ අවස්ථාව අතපසුකොට දමනවා. එම නිසා අපි නිරතුරුවම දක්ෂ වෙන්න ඕනේ අපිට ලැබුන අවස්ථාවෙන් උපරිම ධර්මානුකූල ප්‍රයෝජනය ගන්න. එසේ නොවුනහොත් ජීවිතයේ අනිත්‍යභාවය නිසා එවැනි අවස්ථාවක් ඔබට නැවත නොලැබෙන්න පුළුවන්.

බුදුරජාණන්වහන්සේ භික්ෂූන් වහන්සේලාට දේශනා කරනවා ගමක පිණ්ඩපාතයේ හැසිරෙනකොට, ගිහි පින්වතුන්ලා සමඟ කටයුතු කරන කොට හඳ වගේ හැසිරෙන්න කියලා. හඳ කවදාවත් එකම තැනක නැවතිලා සිටින්නේ නැහැ. හඳ හැමදාමත් හවසට නැගෙනහිරින් මතුවෙලා බටහිරින් බැසයනවා. එම ගමන තුල හඳ කොතනකවත් තවතින්නේ නැහැ. බුදුරජාණන්වහන්සේ භික්ෂූන් වහන්සේලාටත් ඔබලා හඳ වගේ වෙන්න කියන්නේ ඒ අර්ථයෙන්. හඳ කිසිම තැනක නැවතිලා ඇලිලා ප්‍රමාදවෙලා ඉන්නේ නැහැ. නැවතත් බුදුරජාණන්වහන්සේ දේශනා කරනවා. ගැඹුරු ප්‍රපාතයක් දෙස බලන කෙනෙක් එම ප්‍රපාතය දෙස බලන්නේ යම් සේද කය ප්‍රපාතයෙන් මෑත් කරගෙනමයි හිස පමණක් යොමුකොට ප්‍රපාතය බලන්නේ. ප්‍රපාතය ඒ තරමටම

අවදානම් සහිතයි. ගැඹුරු ප්‍රපාතයක් දෙස බලන ආකාරයටමයි ගිහි බැඳීම් දෙස බැලිය යුත්තේ. සීමාව ඉක්මවා ගියා වූ ගිහි බැඳීම් භික්ෂුත්වයේ අර්ථයන්ට මාරාන්තික හානි පමුණුවනවා. බුදුරජාණන්වහන්සේ දේශනා කරනවා තමාගේ අම්මා තාත්තා නිසාවත් බොරුවක් නොකී භික්ෂූන්වහන්සේලා ගිහි පින්වතුන්ගේ ලාභසත්කාර නිසා බොරු කියනවා කියලා. ඒ නිසාමයි බුදුරජාණන්වහන්සේ නිරතුරුවම දේශනා කරන්නේ ආමිසයට දායාද නොවී නිතරම ධර්මයට දායාද වෙන්න කියලා. ඔබලා ආමිසයට දායාද වුණොත් ඔබලාට පමණක් නොවේ ඔබලාගේ ශාස්තෘන්වහන්සේ කෙරෙහිත් ගිහි පින්වතුන් කලකිරේවි, ගරහාවි කියලා.

මෙය සටහන් තබන භික්ෂුව සෑම මොහොතකම සිතන්නේ තමා කරන ක්‍රියාවන් තුලින්, තමා සිතන සිතුවිලි තුලින් ලොව්තුරා බුදුරජාණන්වහන්සේට අගෞරවයක් වේවි ද කියලා. අපි අපේ උතුම් ශාස්තෘන්වහන්සේගේ ගෞරවය නිරතුරුවම ආරක්ෂා කරන්න ඕනේ. එය තමයි අපේ ශාස්තෘන්වහන්සේට දක්වන කෘතවේදිත්වය.

ඊයේ උදේ වරුවේ උන්වහන්සේගේම උත්සාහයෙන් පාර සොයාගෙන තරුණ 30 වියැති සාමණේර ස්වාමීන්වහන්සේ නමක් වැඩමකළා. උන්වහන්සේ බොහෝ ප්‍රියමනාප ස්වාමීන්වහන්සේ නමක්. ගොඩාක් ඈත ප්‍රදේශයක පන්සලක සිටයි වැඩම කළේ. උන්වහන්සේ කියනවා තමා කැලයට ගොස් භාවනා කරන්න කැමතියි කියලා. භික්ෂුව උන්වහන්සේගෙන් ඇසුවා ඔබ වහන්සේ දැන් ගත කරන පන්සල් ජීවිතය හොඳින් ධර්මානුකූලව ගතකරනවාද කියලා. ඒ පින්වත් ස්වාමීන්වහන්සේ කියනවා පන්සලේ දහම් පාසල්, දායක පින්වතුන්ගේ පින්කම් වැනි දේවල්වලට මැදිවී, ඇලීම් ගැටීම් මැදයි ජීවත්වෙන්නේ කියලා. මේ පින්වත් ස්වාමීන්වහන්සේ තමාගේ නායක ස්වාමීන්වහන්සේලාටත් බොහෝම ගරු කරන කෙනෙක්. තමන් වහන්සේලා දෙනම පමණක්ලු පන්සලේ වැඩසිටින්නේත්. ඒ

වෙලාවේ එම තරුණ ස්වාමීන්වහන්සේගේ සත්පුරුෂභාවය නිසාම උන්වහන්සේට භික්ෂුව අවවාද කළේ, ඔබ වහන්සේ මුලින්ම හොඳ පන්සල් ස්වාමීන්වහන්සේ නමක් වෙන්න. බුදුරජාණන්වහන්සේ කෙරෙහි ධර්මරත්නය, සංඝරත්නය කෙරෙහි හොඳින් ශ්‍රද්ධාව ඇතිකරගන්න. හොඳින් සිල්පද ආරක්ෂා කරගන්න. එවිට ඔබ හොඳ පන්සල් හාමුදුරුනමක් වේවි. දහම් පාසල් කටයුතු, දායක පින්වතුන්ලාගේ කටයුතු ඇලීමේ ගැටීමේ ස්වභාවයෙන් තොරව සිදු කරන්න. වයෝවෘධ නායක ස්වාමීන් වහන්සේටත් හොඳින් ගරු කරන්න. ගිහි පින්වතුන්ලා සැවොම ඔබවහන්සේගේ සිල්වත් භාවය දැකලා ඒ තුලින් සකස්වෙන හැසිරීම දැකලා දැන් අපේ පොඩි හාමුදුරුවෝ හරිම හොඳයි කියන තැනට මුලින්ම එන්න. ඔබවහන්සේට ප්‍රිය උපදවන සෑම රූපයක්ම අනිත්‍ය වශයෙන් දැකීමට උත්සාහ ගන්න. සෑම රූපයක්ම විනිවිද දකිමින් සංසාරබිය සකස්කොට ගැනීමට දක්ෂවෙන්න. එවිට පින්වත් ඔබවහන්සේට පුළුවන් ඔබවහන්සේ දක්ෂනම් පන්සලම ආරණ්‍යයක් බවට පත්කොට ගන්නට. පන්සලක වැඩසිටින තරුණ සාමණේර ස්වාමීන්වහන්සේ නමකට පන්සල තුලින් ශක්තිමත් වී කැලයට යන මාර්ගයයි මෙහි සටහන් තැබුවේ. පන්සලේ වැඩසිටිමින් සීලයටමයි ජීවිතයෙන් මුල්තැන දියයුත්තේ. සීලයෙන් පරිපූර්ණභාවයමයි කැලයට ගොස් අර්ථවත්ව සමාධිය වැඩීමට උපකාරීවන්නේ. හැම වෙලාවෙම කය මෑත් කරගෙන ප්‍රපාතය දෙස බලනවා වගේ ගිහි පින්වතුන්ලා සමග කටයුතු කරන්න. කැලයේවත් පන්සලේවත් නොවේ නිවීමේ අර්ථය තිබෙන්නේ. ඒවා කෙරෙහි ඇතිකරගන්නා ඇලීමේ ගැටීමේ උපේක්ෂාවේ නිරෝධය තුලමය. මේ අවබෝධය ලබන්න කැලයේ හුදෙකලාභාවය හුගක්ම ප්‍රයෝජනවත් වෙනවා.

ලොවුතුරා බුදුරජාණන්වහන්සේ ස්වාමීන්වහන්සේලා තුලින් සිදුවූ වැරැද්දෙන් වැරැද්ද හඳුනාගෙන එම වැරදි නැවත සිදුනොවීමට විනය කාරණා එකින් එක පණවන්නේ ධර්මයේ

සන්දිට්ඨික ගුණය වැඩිපුර එකම දවසක් හෝ ලෝකය තුල පවතින්න. මේ මොහොතේ ඔබ අපි ලබන මේ සද්ධර්මයේ රැකවරණය බුදුරජාණන්වහන්සේ විනය කාරණා පැණවීම තුලම ඇතිවූ සුරක්ෂිතභාවයමයි. එම නිසා ප්‍රාතිමෝක්ෂ සීලය ආරක්ෂාකොටගෙන ජීවත්වෙන සෑම ස්වාමීන්වහන්සේ නමකටම එම උතුම් සීලය රැකගැනීම උදෙසා වීර්යය වඩන ස්වාමීන්වහන්සේලා සෑම දෙනෙක්ටම ධර්මයේ සන්දිට්ඨික ගුණය මේ දක්වා ආරක්ෂාවීමට අපිත් දායක වුනාය කියලා සතුටුවෙන්න පුළුවන්.

මේ හේතුව නිසාම සද්ධර්මයේ සන්දිට්ඨික ගුණය ජීවමානව තිබෙන සෑම මොහොතකම එය මෙතෙක් රැකගැනීමේ ගෞරවය හිමිවන්නේ පින්වත් ස්වාමීන්වහන්සේලාටමයි. දිනකට ගිහි පින්වතුන්ලා ලක්ෂ ගණනක් "ස්වාක්ඛාතෝ භගවතා ධම්මෝ සන්දිට්ඨිකෝ" කියලා ධර්මයේ ගුණයන් වන්දනා කරන මොහොතක් පාසාම සද්ධර්මයේ සන්දිට්ඨික ගුණය ආරක්ෂාකොට ගෙන සිටින ප්‍රාතිමෝක්ෂ සීලයෙන් පරිපූර්ණ, එම ශීලයේ පරිපූර්ණභාවයට පත්වීමට වීර්යයවඩන පින්වත් ස්වාමීන්වහන්සේලාට මුළු බෞද්ධ ලෝකයාගේම ආශීර්වාදය ලැබෙනවා. සද්ධර්මයේ සන්දිට්ඨික ගුණය ආරක්ෂා කරගැනීමේ මුරදේවතාවුන් වහන්සේලා මහාසංඝරත්නයමයි.

සිංහල ජාතිය පැවතුනොත් ශාසනය සුරක්ෂිතවෙනවාය කියන කාරණය අර්ථවිරහිත කාරණයකි. තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාවත් සීලයත් සිංහල මනුෂ්‍යයා තුලින් අර්ථවත්වුවහොත් පමණක් සිංහල ජාතියද පවතීවි යැයි එම අර්ථය අපි නිවැරදි කරගතයුතුය. සිංහල ජාතිය නිසා සම්බුද්ධ ශාසනය ආරක්ෂාවෙනවා නොව තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාවත් සීලයත් ආරක්ෂාකර ගන්නා තරමට සිංහල ජාතිය ආරක්ෂා වන බව අප සිහිකොට ගත යුතුය. යම් හෙයකින් සිංහල ජනතාව තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාවෙන් සීලයෙන් පිරිහීමට පත්වුවහොත් ජාතිය ආරක්ෂිත නොවන බවත් පිරිහීමට පත්වන බවත් වර්තමාන සාධක තුලින්ම

අපි තේරුම්ගත යුතුයි. හේතුඵල ධර්මයන් තුලින් සකස්වන නිරතුරුව අනිත්‍යතා ධර්මතාවයන් සිහිනුවණින් දකින්න නම් තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාවත් සීලයත් අත්‍යවශ්‍යවෙනවා.

ලොව්තුරා බුදුරජාණන්වහන්සේගේ මහා කරුණා ගුණය නිසාම මේසා පරිපූර්ණව දේශනාකොට ඇති ධර්ම විනය යම් දවසක තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාවත් සීලයෙන් දුර්වලතාවයටත් පත්වීමත් නිසාම අනතුරුදහන් වී යනබව බොහෝම පැහැදිලිව බුදුරජාණන්වහන්සේ දේශනා කරනවා. හේතුඵල ධර්මයන් නිසාම අතුරුදහන්වී යන උතුම් සද්ධර්මය එකම දිනක් හෝ වැඩිපුර ආරක්ෂාවීමට ගිහි පැවිදි භේදයකින් තොරව ශ්‍රද්ධාවෙන් සීලයෙන් පරිපූර්ණව ජීවත්වීම මේ මොහොතේ බුදුරජාණන්වහන්සේ උදෙසා පින්වත් ඔබ කරන ශ්‍රේෂ්ඨම පූජාව වෙනවා. ශාස්තෲන්වහන්සේ උදෙසා එම යුතුකම ඉටුකරන සෑම පින්වතෙක්ම එහි ආනිසංස හේතුවෙන්ම ධර්මාවබෝධය දිශාවටයි ගමන් කරන්නේ. බුදුරජාණන්වහන්සේගේ මහා කරුණා ගුණයේ උණුසුම තුලටමයි ගමන්කරන්නේ. සද්ධර්මයේ සන්දිට්ඨික ගුණයේ අර්ථය ගිහි වේවා පැවිදි වේවා අපේ ජීවිතයට එකතුවෙන්නේ තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාවත් සිල්වත් ජීවිතයත් තුලින්මයි.

ලොව්තුරා බුදුරජාණන්වහන්සේ සාරාසංඛ්‍යය කල්ප ලක්ෂ ගණනාවක් දස පාරමීධර්මයන් පරිපූර්ණ කොට අවබෝධකොට වදාළ උතුම් සම්මාසම්බුද්ධ ගුණයට පින්වත් ඔබේ කෘතවේදීභාවය ශ්‍රද්ධාවත් සීලයත් ජීවිතයට එකතුකරගැනීම තුලින්ම දක්වන්න. මනුෂ්‍යයා ශ්‍රද්ධාවෙනුත් සීලයෙනුත් ඈත්වෙනකොට මනුෂ්‍යයාගේ බර වැඩිවෙනවා. මෙතනදී බර කියලා කියන්නේ සිතේ බරගතිය. මේ බර සකස්කරන්නේ පංචනීවරණයන්මයි. පංචනීවරණයන්ගේ බර වැඩිවෙන්න වැඩිවෙන්න පංචඋපාදානස්කන්ධයට තෘෂ්ණාවෙන් බැඳෙනවාය කියන කාරණයයි පැහැදිලි වෙන්නේ. සීලය තුලින් මනුෂ්‍යයා සකස්කර ගන්නා සමාධිමත්භාවයේදී පංචනීවරණ සැහැල්ලුභාවයට පත්වෙනවා. ඒ නිසා මනුෂ්‍යයාගේ

කයේ බර සැහැල්ලුවෙනවා. සමාධිමත්භාවය තුල පින්වත් ඔබ ලබන සැහැල්ලුභාවයේදීත් ඔබ බැඳීයන්නේ පංචඋපාදානස්කන්ධයටමයි. ඒ කියන්නේ දෙවැනි වටයේදී ධ්‍යාන සැපය විඳීමේ සැපයට ඔබ බැඳීයනවා. මේ සමාධිය තුලදී සකස්වෙන විඳීමේ සැපය වේදනාවේ ආශ්වාදයයි කියලා බුදුරජාණන්වහන්සේ දේශනා කරනවා. ආශ්වාදයක් ඇති තැන ආදීනවයක් තිබෙනවා. ආශ්වාදයත් ආදීනවයත් හඳුනාගත් තැනැත්තා නිස්සරණය සොයාගෙන යනවා. සීලය තුලින් සකස්කොටගත් සමාධි සැපය විදර්ශනාවට යොමුකරලා සමාධි සැපයත් පංචඋපාදානස්කන්ධයක් බව දැකලා සමාධි සැපයේ අනිත්‍යතාවය දකිමින් විදර්ශනා නුවණ වඩවාගන්නවා.

භව නිරෝධය දක්වාම ගමන්කරන වැඩපිළිවෙල තමා තුලින්මයි අවබෝධකොටගත යුත්තේ. තැන් තැන්වල සොයන්න අවශ්‍ය නැහැ. වටපිට බලන්න අවශ්‍ය නැහැ. දුක කියන කාරණය තමා තුලමයි තිබෙන්නේ. පංචඋපාදානස්කන්ධය කියන කාරණය තමා තුලමයි සකස් වන්නේ. දුකට බැඳීයන පංචඋපාදානස්කන්ධය ඔබ තුලින්මයි ඔබ අවබෝධකොටගත යුත්තේ. තමා තුලින් පංචඋපාදානස්කන්ධයේ අනිත්‍යතාවය අවබෝධකරගැනීමට නම් මුලින්ම පින්වත් ඔබ සමාධි සැපයේ විඳීම අනිත්‍යබව නුවණින් මෙනෙහි කළ යුතුමයි.

භික්ෂුව හමුවීමට පැමිණි මහත්මයෙක් භික්ෂුවට ප්‍රකාශ කළේ, තමා දීර්ඝකාලයක පටන් භාවනාකරන බවත් තමා වැඩියෙන්ම යෙදෙන්නේ සක්මන් භාවනාවේ බවත්ය. දිනක් තමා සක්මන් භාවනාවේ යෙදී සිටින විට සිත හොඳින් සමාධිමත්ව ඇති අවස්ථාවක සක්මන තුල සිටියදීම තමාගේ ශරීරය ඇතිවෙමින් නැතිවී යන ආකාරය ඉතාමත් හොඳින් අරමුණු වූ බවත් ඒ මොහොතේම තමාගේ ඇස් දෙක කඳුලින් බරව තමා හඬාවැටුන බවත් ප්‍රකාශ කළා. මෙවැනි අවස්ථාවකදී අපි දකින්නේ විදර්ශනාමය අවබෝධයක් නොවේ. එම මහත්මයා විදර්ශනාමය අවබෝධයක් ලැබුවා නම් කඳුළු සලමින් හඬන්නේ

නැහැ. මෙතනදී ඒ මහත්මයා ලබන්නේ සමාධියේ විඳීමේ සැපය. මෙය ආශ්වාදයක්. සංකීර්ණ වූ ජීවිත ගත කරන ගිහි පින්වතුන් පංචනීවරණයන් යටපත් කොට ලබන සමාධියේ මේ සැහැල්ලුවට නිරතුරුවම රැවටෙනවා. ඔබ දක්ෂවෙන්න ඕනේ සමාධියේ ආශ්වාදය උදෙසා සකස්වෙන සැම සිතක්ම විදර්ශනාවට ලක්කොට එම සිතේ අනිත්‍ය දකින්නට.

සමාධියේ සැබෑම ආශ්චර්‍යය තම ජීවිත තුලට අර්ථවත්වම එකතුකොට ගන්නේ සම්මා සම්බුද්ධ ශාසනයකදී ලොව්තුරා බුදුරජාණන්වහන්සේ හැරුණුකොට එකම උත්තමයයි. ඒ තමයි උභතෝභාගවිමුක්ත රහතන් වහන්සේ. සම්මා සම්බුද්ධ ශාසනයක රහතන් වහන්සේලා දෙදෙනෙක් සිටිනවා. ඉන් ආශ්චර්‍යමත්ම මහරහතන්වහන්සේ තමයි උභතෝභාගවිමුක්ත රහතන් වහන්සේ. අනෙක් රහතන්වහන්සේ තමයි ප්‍රඥාවිමුක්ත මහරහතන් වහන්සේ. උභතෝභාගවිමුක්ත රහතන් වහන්සේගේ ස්වභාවය බුදුරජාණන්වහන්සේ මෙසේ දේශනා කරනවා. උභතෝභාගවිමුක්ත රහතන්වහන්සේ රූපසමාපත්තීන් ඉක්මවා ආරුප්‍ය වූ යම් ශාන්තවිමෝක්ෂ කෙනෙක් වෙත්නම් ඒ විමෝක්ෂයන් නාම කයින් ස්පර්ශ කොට වෙසෙයි. ඔහු විසින් චතුරාර්‍යසත්‍යය ප්‍රඥාවෙන් දැක අවබෝධකොට ආශ්‍රවයේ ක්ෂය කරන ලද වෙති. මෙයින් පැහැදිලිවෙන්නේ උභතෝභාගවිමුක්ත රහතන් වහන්සේ යනු රූපාවචර අරූපාවචර ධ්‍යානයන් සහිතව චතුරාර්‍යයසත්‍යය අවබෝධකොටගත් උත්තමයා උභතෝභාග විමුක්ත රහතන්වහන්සේ බවයි. රූපාවචර අරූපාවචර ශාන්ත විමෝක්ෂයන් නාම කයින් ස්පර්ශ කිරීම හේතුවෙන් උන්වහන්සේට ඍද්ධි ප්‍රාතිහාර්‍යය පෑමේ ශක්තිය වගේම, අනෙකුත් මිනිස් දැක්ම ඉක්මවාගිය දිවැස් නුවණින් ලෝකය දැකීමේ ශක්තිය ලැබෙනවා. වර්තමාන සමාජයේ අපි කවුරුත් රහතන්වහන්සේ යැයි කියූ පමණින් මනසින් දකින්නේ ඍද්ධි ප්‍රාතිහාර්යය සහිත දිවැස් නුවණ සහිත උභතෝභාගවිමුක්ත රහතන්වහන්සේමයි.

සම්මා සම්බුද්ධ ශානසනයක සිටින දෙවැනි රහතන්වහන්සේ තමයි ප්‍රඥාවිමුක්ත රහතන්වහන්සේ.

ප්‍රඥාවිමුක්ත රහතන්වහන්සේගේ ස්වභාවය ගැන ලොව්තුරා බුදුරජාණන්වහන්සේ මෙසේ දේශනාකරනවා. මේ ශාසනයේ ඇතැම් පුද්ගලයෙක් රූපසමාපත්තීන් ඉක්මවා අරූපවූ යම් ශාන්තවිමෝක්ෂ කෙනෙක් වෙත්ද ඒ සමාපත්තීන් නාම කයින් ස්පර්ශ කොට නොවෙසෙයි. එහෙත් ඔහු ප්‍රඥාවෙන් චතුරාර්‍යසත්‍යය අවබෝධකොට ආස්‍රවයෝ ක්ෂය කරන ලද වෙයි. මේ පුද්ගලයා ප්‍රඥා විමුක්ත රහතන් වහන්සේ යැයි කියමි. ප්‍රඥා විමුක්ත රහතන් වහන්සේ යනු චතුරාර්‍යසත්‍යය අවබෝධකොටගත් රූපවචර අරූපාවචර සමාපත්තීන්වලට සමවැදීමට නොහැකි රහතන් වහන්සේයි අරූපාවචර පත්තීන්වලට සමවැදීමට නිසාම උන්වහන්සේට එර්දි ප්‍රාතිහාර්‍යයපෑමේ සහ මිනිස් ඇස ඉක්මවා ගියා වූ දිවැස් නුවණ ඇතිකරගැනීමේ හැකියාවක් නොමැති බව සුසීම සූත්‍රයේදී බුදුරජාණන්වහන්සේ පැහැදිලිව දේශනා කොට ඇත. උභතෝභාගවිමුක්ත රහතන්වහනසේත් ප්‍රඥාවිමුක්ත රහතන්වහන්සේත් දෙදෙනාම චතුරාර්‍ය සත්‍ය අවබෝධකොටගත් රහතන්වහන්සේලාමය.

# උභතෝභාගවිමුක්ත රහතන්වහන්සේලා ලෝකයේ වැඩ සිටිනවාද?

භික්ෂුවට මුණගැසුන මහත්මයෙක් ප්‍රකාශ කළා "හාමුදුරුවනේ ධර්මය සන්දිට්ඨිකව පවතින වර්තමානයේ ඍද්ධි ප්‍රාතිහාර්‍යය සහිත මහරහතන්වහන්සේලා ලෝකයේ වැඩ ඉන්නවද" කියලා. මේ මහත්මයා අහන්නේ උභතෝභාගවිමුක්ත රහතන්වහන්සේලා ලෝකයේ මේ මොහොතේ වැඩ සිටිනවාද කියලා. උපසම්පදා ස්වාමීන්වහන්සේලා ප්‍රාතිමෝක්ෂ සීලය දිවිහිමියෙන් ආරක්ෂාකොට ගෙන සද්ධර්මයේ සන්දිට්ඨික ගුණය ආරක්ෂාකොට ගෙන තිබෙනතාක් රහතන්වහන්සේලාගෙන් මාර්ගඵලලාභී උතුමන්ගෙන් ලෝකය හිස් නොවේය කියලා ලොව්තුරා බුදුරජාණන්වහන්සේ දේශනා කරනවා. එහෙම නම් රහතන්වහන්සේලා ලෝකයේ නැහැයි කියලා කාටවත්ම ප්‍රකාශකරන්න බැහැ. එහෙම ප්‍රකාශකරන මොහොතේම ධර්මයේ සන්දිට්ඨිකගුණය අභියෝගයට ලක්වෙනවා. නමුත් හේතුඵල ධර්මයන්ට අනුව ගලපා බලනකොට වර්තමානයෙත් අනාගතයේදීත් ගෞතම සම්මාසම්බුද්ධ ශාසනය තුලදී උභතෝභාගවිමුක්ත රහතන්වහන්සේලා පහළ නොවන බවයි භික්ෂුව දකින්නේ. එය භික්ෂුවගේ අදහස පමණයි. ඕනෑම පින්වතෙකුට එම අදහසට වෙනස් අදහසක් ප්‍රකාශ කරන්න පුළුවන්.

ඍද්ධිය කියන්නේ හැමෝටම වඩා ඉහළින් ඉදිරියෙන් සිටිනවාය කියන අර්ථයයි. මේ අර්ථය තුලම තිබෙනවා ඍද්ධිය තිබෙන කෙනාට අනෙක් අයට වඩා අතීත කුසල් ශක්තිය වැඩිය කියන

කාරණය. අනෙක් අයට වඩා කුසල් ශක්තිය වැඩි නිසායි ඔහු සියල්ලන්ටම වඩා උඩින් සිටින්නේ. ඉදිරියෙන් සිටින්නේ. එහෙම නම් අපි පිළිගන්න අවශ්‍යයයි ප්‍රඥාවිමුක්ත රහතන්වහන්සේට වඩා උභතෝභාගවිමුක්ත රහතන්වහන්සේට අතීත සංසාරික කුසල් ශක්තිය වැඩිබව. සම්මා සම්බුද්ධ ශාසනයක් තුලදී යමෙක් අරහත්භාවයට පත්වෙන්නේ අතීත සංසාරයේ ඈත දුරක සිට තමා අනාගත සම්මා සම්බුද්ධ ශාසනයකදී රහතන්වහන්සේ නමක් වෙනවාය කියලා ඇතිකරගත් කැමැත්ත නිසාමයි. අතීත සම්මා සම්බුද්ධ ශාසනවලදී එර්දියෙන් වඩින උභතෝභාග විමුක්ත රහතන්වහන්සේලා දැසින් දැකලා උන්වහන්සේලාට සිව්පසයෙන් ඇප උපස්ථාන කරලා කෙනෙක් ප්‍රාර්ථනා කරනවා. "මමත් සම්මා සම්බුද්ධ ශාසනයකදී උභතෝභාග විමුක්ත රහතන්වහන්සේ නමක් වෙනවාය" කියලා. ඒ උතුම් අරමුණ උදෙසාම අවශ්‍ය කුසල් ධර්මයන් දියුණුකොට ගන්නවා. සංසාරයේ ඈත දුරක පටන් කුසල් ධර්මයන් දියුණුකොටගෙන පැමිණි නිසාම බුදුරජාණන්වහන්සේ නමක් මුණගැසුණු මොහොතක සම්මා සම්බුද්ධ ශාසනයක් මුණගැසුණු මොහොතක සකස්කොටගත් අතීත කුසල් ධර්මයන්ගේ බලවත් භාවය නිසාම චතුරාර්ය සත්‍යය අවබෝධකොටගන්නේ උභතෝභාග විමුක්ත රහතන්වහන්සේ නමකගේ ගුණයන් සහිතවමයි. එහෙම වෙන්නේ උන්වහන්සේගේ කුසල් ශක්තිය වැඩියි.

ලොව්තුරා බුදුරජාණන්වහනසේ සාරිපුත්ත මහරහතන්වහනසේට අග්‍රශ්‍රාවක තනතුර පිරිනමපු අවස්ථාවේ එහි වැඩසිටිය පෘතග්ජන ස්වාමීන්වහන්සේලා අතර කථාබහක් ඇතිවුණා බුදුරජාණන්වහන්සේ මුහුණ බලලා තනතුරු දෙනවාය කියලා. කොණ්ඩඤ්ඤ මහරහතන්වහන්සේටයි අග්‍රශ්‍රාවක තනතුරු දිය යුත්තේ. උන්වහන්සේයි මුල්ම ආර්යශ්‍රාවකයා බවට පත්වුණේ කියලා. බුදුරජාණන්වහන්සේ මෙම ස්වාමීන්වහන්සේලාගේ සිතුවිල්ල නුවණින් දැකලා දේශනා කරනවා කොණ්ඩඤ්ඤ මහරහතන්වහන්සේ අතීත සම්මා සම්බුද්ධ ශාසනයකදී එම බුදුරජාණන්වහන්සේ හමුවෙහි ප්‍රථමයෙන් චතුරාර්ය සත්‍ය

ධර්මය අවබෝධ කොටගත් ස්වාමීන්වහන්සේව දැකලා "මමත් අනාගත සම්මා සම්බුද්ධ ශාසනයකදී බුදුරජාණන්වහන්සේ නමක් හමුවේ මුල්ම ආර්ය ශ්‍රාවකයා වෙනවා"ය කියන කැමැත්ත ඇතිකරගෙන ඊට අදාළ කුසල් ධර්මයන් දියුණුකොටගෙනයි පැමිණියේ. ඒ නිසයි මගේ ශාසනයේ මුල්ම ආර්ය ශ්‍රාවකයා කොණ්ඩඤ්ඤ මහරහතන්වහන්සේ බවට පත්වුණේ. එය හේතුඵල ධර්මයක්. ශාරිපුත්ත මහරහතන්වහන්සේ අතීත සම්මා සම්බුද්ධ ශාසනයකදී පියුමතුරා බුදුරජාණන්වහන්සේ උන්වහන්සේගේ අග්‍රශ්‍රාවකයාණන් වහන්සේලා දෙනම ඇතුළු පන්සියයක් මහරහතන්වහන්සේලාට සතියක් පුරාවට සුවඳ මලින් සුවඳ දුමින් ඵලවැලින් උපස්ථානයන් පවත්වා එම බුදුරජාණන්වහන්සේගේ අග්‍රශ්‍රාවකයන් වහන්සේගේ ආශ්චර්යයන් දැක අනාගත සම්මා සම්බුද්ධ ශාසනයකදී සම්මා සම්බුදුවරයෙකුගේ අග්‍රශ්‍රාවක වෙමියි ඇති කරගත් අධිෂ්ඨානයට අදාළව කුසල් ධර්මයන් පිරීම නිසයි සාරිපුත්ත මහරහතන්වහන්සේ මගේ අග්‍රශ්‍රාවක තනතුර ලැබුවේ. එසේ නොමැතිව බුදුරජාණන්වහන්සේ මුහුණ බලලා හිතවත්කම් බලලා තනතුරු දෙනවා නොවේය කියලා දේශනා කළා.

උභතෝභාගවිමුක්ත රහතන්වහන්සේගේ හැකියාවන් ප්‍රඥාවිමුක්ත රහතන්වහන්සේට වඩා ඉදිරියෙන් ඉහළින් සිටින්නේ අතීත කුසල් ධර්මයන්ගේ සහ අධිෂ්ඨානයන්ගේ වැඩිභාවය නිසාමයි. ප්‍රඥාවිමුක්ත රහතුන් වහන්සේව ශුෂ්ක විදර්ශක වශයෙනුත් හඳුන්වනවා. ශුෂ්ක විදර්ශක කියන වචනයේ අර්ථය තුලම තිබෙනවා කටුක බවක්. එතනින්ම පැහැදිලි වෙනවා. උභතෝභාගවිමුක්ත රහතන්වහන්සේට ප්‍රඥාවිමුක්ත රහතන්වහන්සේට සාපේක්ෂව කුසල් ශක්තිය වැඩිබව. නමුත් මේ රහතන්වහන්සේලා දෙදෙනාම චතුරාර්ය සත්‍යය ධර්මයන් අවබෝධකොට ගැනීම සඳහා අවශ්‍ය කුසලයෙන් පරිපූර්ණවයි සිටින්නේ.

ලොව්තුරා බුදුරජාණන්වහන්සේ වැඩසිටිය කාලයේ වැඩසිටියා චක්ඛුපාල මහරහතන්වහන්සේ කියලා ප්‍රඥාවිමුක්ත

රහතන්වහන්සේ නමක්. උන්වහන්සේ බුදුරජාණන්වහන්සේ කෙරෙහි ශ්‍රද්ධාව සකස්කොට ගෙන තම වීර්යයෙන්ම ධර්මාවබෝධය උදෙසාම ජීවිතය මරණයට දමනවා. ජීවිතය මරණයට දමලයි ධර්මාවබෝධය සාක්ෂාත්කොටගන්නේ. උන්වහන්සේ ජීවිතය මරණයට දැම්මත් අතීත කුසල් සංස්කාරයන්ගේ බලවත්භාවය නිසාම උන්වහන්සේට ජීවිතයත් ධර්මාවබෝධයත් දෙකම ලැබෙනවා. ධර්මාවබෝධය ලැබෙන මොහොතේම උන්වහන්සේගේ ඇස් දෙක අන්ධවෙනවා. මෙවැනි වීර්යවන්ත ස්වාමීන්වහන්සේලාගේ පාරිශුද්ධ භික්ෂු ජීවිතය දැකලා දිව්‍යතලයන්ට අධිපති ශක්‍ර දෙවියා පවා වරක් උන්වහන්සේට උපකාර පිණිස මනුෂ්‍ය වේශයක් මවාගෙන පැමිණ උපකාරවෙනවා. මෙවැනි ස්වාමීන්වහන්සේලා කෙරෙහි පහදින ගිහි පින්වතුන් තමන් අධිෂ්ඨානයක් ඇති කරගන්නවා. "මමත් කවදාහරි දවසක ප්‍රඥාවිමුක්ත රහතන්වහන්සේ නමක් වෙනවා"ය කියලා. චක්ඛුපාල මහරහතන්වහන්සේ වගේ. ඒ උදෙසා කුසල් ධර්මයන් දියුණුකොට ගන්නවා. එවැනි අධිෂ්ඨානයක් ඇතිකරගත් අය එම කුසල් ශක්තිමත් වී සම්මාසම්බුද්ධ ශාසනයක් මුණගැසුණු විට ප්‍රඥාවිමුක්ත රහතන්වහන්සේ නමක් බවටයි පත්වෙන්නේ. එය එසේ වන්නේ ඔහු ප්‍රාර්ථනාකරගෙන පැමිණි උපාදානය නිසාමයි.

ඉහත කාරණාවන් නුවණින් මෙනෙහි කිරීමේ දී පින්වත් ඔබ තේරුම්ගන්න දක්ෂවෙන්න අවශ්‍යයයි ඔබලාට අතීත සංසාර ගමන පුරාවට මුණගැසුණ සම්මා සම්බුද්ධ ශාසන ලක්ෂ ගණනකදී පින්වත් ඔබලාත් මමත් උභතෝභාගවිමුක්ත ප්‍රඥාවිමුක්ත රහතන්වහන්සේ නමක් වෙමියි කොතරම් නම් අධිෂ්ඨානයන් ඇතිකරගෙන ඇති ද කියලා. ඒ උදෙසා මොනතරම් නම් කුසල් ධර්මයන් දියුණුකොටගෙන පැමිණෙන්න ඇති ද කියලා. පින්වත් ඔබ දක්ෂවෙන්න ඒ අතීත ඉලක්කය සියුම්ව මතුකොටගන්න. පින්වත් ඔබට නිරතුරුවම රහතන්වහන්සේ ගැන සිතනවා නම් උන්වහන්සේලාගේ ගුණයන් ගැන දැනෙනවා නම් රහතන්වහන්සේ කියන වචනයේ අර්ථයට කැමැත්තක්

ඇතිවෙනවා නම් නියත වශයෙන්ම අතීතයේ අනිත්‍ය වී ගිය විඤ්ඤාණයන් තුල රහතන්වහන්සේ නමක් වෙමියි කියන ඡන්දය ඔබ තුල සකස් වී තිබුණාමය. ඔබ විචිකිච්ඡාවට පත්වෙන්න එපා. විවෘත වන්න හේතුඵල ධර්මයන්ට. පින්වත් ඔබ අතීතයේ නැවතුන තැන ශ්‍රද්ධාව, වීර්යය හිරිඔතප් ධර්මයන් තුලින් මතුකොටගන්නා ඒ තැන බොහොම ශක්තිමත් තැනක්. නමුත් උපාදානය හේතුවෙන් භවය සකස්වෙනවාය කියන ධර්මතාවය නිසා අතීත භවයන්හිදී අපි මිත්‍යාදෘෂ්ටික භාවයන්ට පත්වීම නිසා සතර අපායන්ට වැටීම නිසායි අතීත ඉලක්කයන් අප තුලින් මැකීගොස් තිබෙන්නේ. සමහර පින්වතුන් රහතන්වහන්සේ කියන වචනය ඇසෙන කොටත් එහි අර්ථයන්ට විරුද්ධවෙන්නේ පින්වත් ඔබ තුල හේතුඵල ධර්මයන් නිසාම සකස්වෙන මෙවැනි විෂම අදහස් නිසයි. එම අදහස් විරේක කොට දැමීමට හොඳම කමටහන ශ්‍රද්ධා, වීර්යය, හිරිඔතප් කියන කාරණාවන් ජීවිතයට එකතුකොට ගැනීම වෙනවා.

# ලෝකය ගමන්කරන්නේ මනුෂ්‍යයා තුල මෘගසංඥාව සකස්වෙන දිශාවටයි.

භික්ෂුව ඉහත සටහනේ සටහන් කළා වර්තමානයේ හෝ අනාගතයේ නැවත මේ ගෞතම සම්මා සම්බුද්ධ ශාසනය තුල උභතෝභාගවිමුක්ත රහතන්වහන්සේලා පහළවීමට ඉඩකඩ හේතුඵලධර්මයන්ට අනුව නැතිය කියලා. බුදුරජාණන්වහන්සේ දේශනාකොට වදාළ ධර්මයේ අනිත්‍යයි කියන අර්ථයෙහි පිහිටලා ඉහත කාරණය නුවණින් හේතුඵල ධර්මයන්ට අනුව මෙනෙහි කරන්න දක්ෂවෙන්න ඕනේ. දැන් මේ පවතින්නේ ශාසනයේ අර්ථයන් ගිලිහෙමින් යන කාලය. ශාසනයේ අර්ථයන් ගිලිහී යන නිසාම මනුෂ්‍යයා ගමන් කරන්නේ අකුසලය දෙසට. ධර්මයට දායාදවීම පසෙක තබා මනුෂ්‍යයා ආමිසයම දායාද කොටගත් කාලය ලෝකයේ මෙවැනි විකෘතීන් සකස්වෙන්නේ උභතෝභාගවිමුක්ත රහතන්වහන්සේලා නැවත මේ ශාසනයේ පහළ නොවෙන බව අපට දැනුම් දෙන්න.

ගෞතම සම්මා සම්බුද්ධ ශාසනයේ උභතෝභාගවිමුක්ත රහතන්වහන්සේ නමක් වෙන්න ප්‍රාර්ථනා කරගෙන පැමිණි කෙනෙක් සිටියා නම් ඒ අය දැන් පහළ වී අවසන්. දැන් ලෝකය අයිති ප්‍රඥාවිමුක්ත රහතන්වහන්සේලාට. මේ මොහොතේ ලෝකයේ ථේරවාදී බුදුදහම පවතින රටක උභතෝභාග විමුක්ත රහතන්වහන්සේ නමක් වැඩසිටිනවා නම් උන්වහන්සේ කවදාකවත් තමන්ගේ ඍද්ධිමත්භාවය ලෝකයාට සඟවාගෙන සිටින්නේ නැහැ. ලොව්තුරා බුදුරජාණන්වහන්සේලාට පමණක් සීමා වූ මහා කරුණා ගුණය ඊට දෙවැනිව පිහිටන්නේ රහතන්වහන්සේලාටයි. එම කරුණා ගුණය රහතන්වහන්සේට

පිහිටන්නේ තමා මේ ඝෝර කටුක භයානක සංසාරයෙන් එතෙර වුණා කියන "නිදහස" තුල සිටිමින් දුකෙන් නොමිදුනාවූ සත්වයා කෙරෙහි ඇතිවෙන කරුණාවකින්මයි. ලෝභ, ද්වේශ, මෝහ අකුසලයන් ජීවිතය කොටගත් සත්වයා කෙරෙහි අනුකම්පාවෙන් යුතුවයි ලෝකය කෙරෙහි රහතන්වහන්සේගේ කරුණාව සකස්වෙන්නේ. අපි විශ්වාස කරනවා රහතන්වහන්සේගේ මනෝභාවය එසේ නම් වර්තමානයේ ඍර්ද්ධි ප්‍රාතිහාර්යය සහිත උභතෝභාගවිමුක්ත රහතන්වහන්සේ නමක් ලෝකයේ වැඩසිටිනවා නම් කවදාවත් ලෝකයාගේ හිත සුව පිණිස තම ඍර්ද්ධි ප්‍රාතිහාර්යය ශක්තිය ලෝකයාට වසංකොට ගෙන සිටින්නේ නැහැ. මෙතනදී පින්වත් ඔබ වැරදි අර්ථයක් ගන්න එපා ඍර්ද්ධි ප්‍රාතිහාර්යය සහිත රහතන්වහන්සේ තමන්ගේ නම, තමන් කවුද කියලා පෙන්වන්න නොවේ. ඍර්ද්ධියෙන් වඩින්නේ. කුමන ලාභ සත්කාර හමුවේවත් උන්වහන්සේ ලෝකයාට නොඇලෙන බවට විශ්වාසය උන්වහන්සේ තුල තිබෙනවා. එම නිසා උන්වහන්සේ ඍර්ද්ධියෙන් වඩින්නේ සද්ධර්මයේ සන්දිට්ඨික ගුණයේ ආශ්චර්යය ලෝකයට පෙන්වන්නයි.

උන්වහන්සේ කොහේ හෝ කැලයකින් අහසට පැන නැගිලා ලෝකයටම ධර්මයේ සන්දිට්ඨික ගුණයේ අසිරිය දැනගන්නට ඍර්ද්ධියෙන් ගමන්කරලා තවත් කැලයකට බැසලා නොපෙනී යනවා. කවුද මේ උභතෝභාගවිමුක්ත රහතන්වහන්සේ කියලා ලෝකයාට හෙළිවෙන්නේ නැහැ. නමුත් උතුම් ශ්‍රී සම්බුද්ධ ධර්මයේ සන්දිට්ඨික ගුණය මුළු තුන් ලෝකයම දෑසින් දකිනවා. එම ආශ්චර්යමත් දැකීම ලෝකයේම සම්බුද්ධ ධර්මයේ බැබැලීමක් වේවි. ඍර්ද්ධියෙන් වඩින රහතන්වහන්සේ දැක බෞද්ධ ලෝකයම පිබිදේවි. මනුෂ්‍යයා තව තවත් සද්ධර්මයේ අර්ථයෙන් සන්නද්ධ වේවි. උභතෝභාගවිමුක්ත රහතන්වහන්සේ නමක් මේ ලෝකයේ මේ මොහොතේ වැඩසිටිනවා නම් ඒ උතුම් ධර්ම ශක්තිය අසරණ ලෝකයාට කරුණාවෙන් ලබාදීමට මැලි වෙන්නේ නැහැ. එය රහතන්වහන්සේලාගේ කරුණා ගුණයේ ධර්මතාවයක්.

එයින් පැහැදිලිවන්නේ මේ මොහොතේ උභතෝභාගවිමුක්ත රහතන්වහන්සේලා ලෝකයේ වැඩ නොසිටින බවයි.

සමාජයෙන් යම් යම් අවස්ථාවලදී ඇසෙන්න ලැබෙනවා, අහවල් තැන හාමුදුරු කෙනෙක් සිටියා, අතුරුදහන්වුණාය කියලා. පින්වතුන්ලා බොහෝම පැහැදිලිව දැනගන්න ඕනේ රහතන්වහන්සේලා කියන්නේ, මනුෂ්‍යයාව ප්‍රශ්නාර්ථ තුලට ගොනුකරමින් විශ්මයට පත් කරන කෙනෙක් නොවන බව. රහතන්වහන්සේ කියන්නේ විවෘත චරිතයක්. එම විවෘත චරිතය ලෝකයාව විශ්මයට පත් නොකරන උතුමෙක් බව බුද්ධිමත්ව තේරුම්ගන්න ඕනේ. යමෙක් විශ්මයට පත් කරන්නේ නම් ඔහු කෙලෙස් සහිත පුද්ගලයෙක්මය. රහතන්වහන්සේ යනු ලෝකයා විශ්මයට පත්කරන කෙනෙක් නොව ලෝකයාට සත්‍යාවබෝධය උදෙසාම නිර්ව්‍යාජව කටයුතු කරන උතුමෙකි.

උභතෝභාගවිමුක්ත රහතන්වහන්සේලා වර්තමානයේ පහළ නොවීමට හේතු දෙකක් දැක්විය හැකිය. පළවෙනි කාරණය තමයි එවැනි අධික ප්‍රාර්ථනා සහිත කුසල් ශක්තියෙන් වැඩි උතුමන් ගෞතම සම්මා සම්බුද්ධ ශාසනය තුල පහළ වී අවසන්. දෙවැනි කාරණය තමයි එර්දියෙන් වඩින රහතන්වහන්සේ නමක් දැකීමට වර්තමාන ලෝකයා තුල කුසල් ශක්තිය නැහැ. නැවත එවැනි ආශ්චර්යමත් දර්ශනයක් දැකලා අර්ථවත් ශාසනික පිබිදීමක් ඇතිවීමට "අනිත්‍යයි" කියන අර්ථය තුල සිදුවෙන්න අවස්ථාවක් නැහැ.

ලොව්තුරා බුදුරජාණන්වහන්සේ දේශනාකොට වදාළ ධර්මයට අනුව ලෝකය දැන් ගමන් කරන්නේ මනුෂ්‍යයාට පරමායුෂ අවුරුදු 10 ක් වන මනුෂ්‍යයා තුල දුස්සීලභාවය නිසාම මෘගසංඥාව සකස්වෙන දිශාවටය. දුස්සීලභාවය බොහෝම හොඳින් මාර්ගය සුද්ධ පවිත්‍ර කරනවා ගමනාන්තයට ඉක්මණින් ළඟාවීමට. කුණුවෙන නරක්වෙන සිව්පසය ගොඩග සාගෙන දිරායන යකඩගොඩවල් මගේ කොටගෙන ගරාවැටෙන කොන්ක්‍රීට් ගොඩවල් සිහින මාළිගාකොටගෙන අපි යන මේ ඉදිරි

ගමන තුල සද්ධර්මයේ අර්ථයන් ශක්තිමත් වෙන එවැනි උතුම් දසුන් අපිට නැවත මුණගැසෙන්නේ නැහැ. අසන්න දකින්න ලැබෙන්නේ ධර්මයේ අර්ථයන් හීන වන මැජික් දර්ශනයන්මයි. නමුත් පින්වත් ඔබ තවමත් කුසල් පූරණයකොට තිබෙනවා ප්‍රඥාවිමුක්ත රහතන්වහන්සේ නමක් වෙන්න. තව බොහෝම කෙටි කාලයකදී ලෝකයෙන් එම ශක්තියත් අතුරුදහන්ව යාවී. එම නිසා බුදුරජාණන්වහන්සේ දේශනාකොට වදාළ "අප්‍රමාදවීම" කියන වචනයේ සැබෑම අර්ථයේ වටිනාකම වර්තමානයේ ජීවත්වන ගිහි පැවිදි පින්වත් ඔබටමයි, බුදුරජාණන්වහන්සේ දේශනාකොට ඇත්තේ.

උභතෝභාගවිමුක්ත රහතන්වහන්සේ නමක් වීමට දැන් පින්වත් ඔබ ප්‍රමාදයි. අප්‍රමාදීව ප්‍රඥාවිමුක්ත රහතන්වහන්සේ නමක් වෙන්න වීර්යය වඩන්න. හේතුඵල ධර්මයන්ට අනුව ගලපලයි භික්ෂුව ඉහත සටහන තැබුවේ. කැමති පින්වතෙකුට එම අදහස පිළිගන්නත් පුළුවන් කැමති පින්වතෙකුට නොපිළිග න්නත් පුළුවන්. ඉහත කාරණය යම් පින්වතෙක් පිළිගත්තාය කියන්නේ එම පින්වතා වහවහා අප්‍රමාදීභාවයට පත්වී ධර්මයේ සන්දිට්ඨික ගුණයෙන් උපරිම ප්‍රයෝජන ගැනීමයි. එය මේ මොහොතේ අප ඉදිරියේ ඇති අනතුර නිවැරදිව හඳුනාගැනීමක් වෙනවා. යම් පින්වතෙක් ඉහත කාරණය පිළිගැනීමෙන් තොරව අනාගතයේදී රහතන්වහන්සේලා ඍද්ධියෙන් අහසින් වඩිනවා දැකීමට පෙරුම්පුරමින් සිටියොත්, එම පින්වතාට අනාගතයේ පහළ වෙන කාසායකණ්ටකයන්ගේ ලෝකයේ වල්මත්-වීමටයි සිදුවෙන්නේ.

ප්‍රඥාවිමුක්ත රහතන්වහනසේ පංචඋපදානස්කන්ධයේ අනිත්‍යභාවය පිළිබඳව අවබෝධය ලබමින් චතුරාර්ය සත්‍යය අවබෝධකරගන්නා උතුමෙක්. උන්වහන්සේටත් ප්‍රථම ධ්‍යාන, ද්විතීය ධ්‍යාන, තෘතීය ධ්‍යාන, චතුර්ථ ධ්‍යානවලට සමවැදීමේ හැකියාව තිබෙන්නට පුළුවන්. නමුත් උන්වහන්සේලා ධ්‍යාන සැපයට වඩා අනිත්‍ය සංඥාව තුලම ජීවත්වීමට කැමති බවක්

පෙනෙනවා. ඉහත සතරවන ධ්‍යාන තලයන් ඉක්මවාගොස් ආකාසානඤ්චායතනයට පමණක් සමවැදීමට හැකියාව ඇති ප්‍රඥාවිමුක්ත රහතන්වහන්සේ නමක් ගැන මේ සටහන තබන භික්ෂුව හොඳින් දන්නවා. එම කරුණ බොහෝම විශ්වාසයෙන් මෙහි සටහන් තබන්නේ. ඉහත කාරණාවන් තුලින් පෙනෙනවා ප්‍රඥාවිමුක්ත රහතන්වහන්සේලා තුලත් හැකියාවන් අතින් වෙනස්කම් තිබෙනවා කියලා. එම කාරණය ගැන පැහැදිලි වැටහීමක් පින්වත් ඔබට අංගුත්තර නිකායේ ප්‍රඥාවිමුක්ත සූත්‍රය ඇසුරෙන් ලබාගැනීමට පුළුවන්. ඕනෑම පුද්ගලයෙකුට වුවද තම කුසල් ශක්තිය මත සතරවන ධ්‍යානය දක්වා සමවැදීමට හැකිනම් ඔහුට චුතූපපාත ඥාණය, පූර්වේනිවාසානුස්සති ඥාණය දිව්‍ය චක්ඛු ඥාණය, දිව්‍ය ශ්‍රෝත ඥාණය තමන්ගේ දක්ෂතාවය මත සකස්කොට ගැනීමට හැකිබව බුදුරජාණන්වහන්සේ දේශනා කරනවා. එසේ නම් ප්‍රඥාවිමුක්ත රහතන්වහන්සේලා අතර ද ඉහත ඥාණයන් සකස්කොටගත් උතුමන් සිටින්නට පුළුවන්. නමුත් සෑම ප්‍රඥාවිමුක්ත රහතන්වහන්සේ නමකටම එම දක්ෂභාවය නොමැති බව සුසීම සූත්‍රයේදී සහ කීටාගිරි සූත්‍රයේදී බොහෝම පැහැදිලිව දේශනා කරනවා.

ඍද්ධි ප්‍රාතිහාර්ය කියන කාරණය බෞද්ධයෙකුටම පමණක් සීමාවූවක් නොවේ. තෙරුවන් සරණ නොගිය හිමාලයේ සිටින ඍෂි වරයෙකුට මේ මොහොතේදී ඍද්ධිමත්භාවය තිබෙන්නට පුළුවන්. තෙරුවන් පහළ වීමට පෙරාතුවත් රූපාවචර අරූපාවචර ධ්‍යාන සකස්කොට ගත් ආලාරකාලාම, උද්දකරාමපුත්‍ර වැනි ගුරුවරුන් සිටියා. ඒ ගුරුවරුන්ගේ ශිෂ්‍යයින් දහස් ගණනින් හිටියා. සීලය සහ සමාධිය කියන කාරණා දෙක බුදුරජාණන්වහන්සේ පහළ වීමට පෙරාතුව දඹදිව සමාජයේ ක්‍රියාත්මකව තිබුණා. තෙරුවන් සරණ නොගිය පින්වතුන්ලා සීලය සහ සමාධිය සරණකොට ගෙන සකස්කොට ගන්නා රූපාවචර සහ අරූපාවචර ධ්‍යාන සහ ඍද්ධි ප්‍රාතිහාර්ය පෑමේ ශක්තිය ලෞකික ආශ්වාදයේ විඳීමක් හැටියටයි ගැනෙන්නේ. ඍද්ධියෙන් යෑමේ හැකියාව ඒ

අයට තිබුණත් තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාව නොමැති නිසාම සතර අපායෙන්වත් එම පින්වතුන් මිදිලා නැහැ. තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාව ඇතිකරගත් පින්වතුන්මයි විඳීමේ ආශ්වාදයේ අනිත්‍යභාවය නුවණින් දකින්න දක්ෂවෙන්නේ. එමනිසා, උභතෝභාගවිමුක්ත රහතන්වහන්සේගේ විදර්ශනා ඥාණයේ විනිවිද ගිය උතුම් ඍද්ධි ප්‍රාතිහාර්ය පෑමේ ශක්තියෙන්, තෙරුවන් සරණ නොගිය පින්වතුන් සීලය සහ සමාධිය තුලින් සකස්කොට ගත් ලෞකික රූපාවචර සහ අරූපාවචර ධ්‍යාන ශක්තියත් සකස්කොට ගන්නා, ඍද්ධියෙන් යෑමේ හැකියාවත් අතර ඇති පරතරය පින්වත් ඔබ නුවණින් හඳුනාගන්න ඕනේ. එම නිසා වර්තමානයේදීද තෙරුවන් සරණ නොගිය රූපාවචර අරූපාවචර ධ්‍යාන සකස්කොටගත් ඍද්ධියෙන් යාමේ හැකියාව ඇති පින්වතුන් සමාජයේ සිටින්නට පුළුවන්. නමුත් ඒ අය ප්‍රඥාව නොමැති නිසාම විඳීමේ ආශ්වාදයෙන් මත්වුණ කෙළෙස් සහිත පින්වතුන්. සමාධි ශක්තිය නිසාම පංචනීවරණයන් යටපත් වී තිබෙනවා පමණයි. සමාධිය තුලින් පංචනීවරණ යටපත් කොටගෙන සිටීම නිසාම, විඳීමේ ආශ්වාදය නිත්‍යභාවයෙන් ගැනීමත්, සමාධි සැපයට ඇලීමත් හේතුවෙන් ලෝකයාට තම ඍද්ධි ශක්තිය පෙන්වීමට යනවාට වඩා අරූපාවචර ධ්‍යාන සැපයේ ආශ්වාදය විඳීමමයි, ඔහු එකම සැපයකොට දකින්නේ.

ගෞතම සම්මා සම්බුද්ධ ශාසනයෙන් උපරිම ඵලය නෙලාගත් පුද්ගලයාය කියන්නේ චතුරාර්ය සත්‍ය අවබෝධ කළ උත්තමයාටයි. ආර්ය අෂ්ඨාංගික මාර්ගයේ ගමන් කිරීමෙන් අපි එම ඵලයටයි ළඟාවෙන්නේ. පින්වත් ඔබ ආර්ය අෂ්ඨාංගික මාර්ග යේ ගමන් කොට ශ්‍රද්ධානුසාරී, ධම්මානුසාරී, සෝවාන්ඵලය, සකෘදාගාමීඵලය අනාගාමීඵලය කියන එම මාර්ගයන් අවබෝධයෙන් ස්පර්ශ කරමිනුයි ගමනාන්තය වන ප්‍රඥාවිමුක්ත රහතන්වහන්සේ කියන අවබෝධයට පත්වෙන්නේ. එම නිසා අපි හිතන්න ඕනේ අපට මේ ගමන යන්ට වීර්ය වගේම ඉවසීමත් තිබෙන්න ඕනේය කියලා. වීර්ය තිබෙන කෙනාට ඉවසීම නොමැතිනම් ඔහු මේ ධර්ම මාර්ගය තුල දී මමත්වයේ

දැඩිභාවයමයි සකස්කොට ගන්නේ. ඉවසීම තිබෙන පින්වතාට වීර්ය නොමැති නම් ඔහු මේ ධර්ම මාර්ගයේදී පංචනීවරණයන්මයි තීව්‍ර කොට ගන්නේ. එම නිසාම මෙම ගමන සිහිනුවණින් තොරව ගියහොත් අනතුරුදායක ගමනක් වෙනවා. එම නිසාම ඔබ මේ ධර්ම මාර්ගයේ ගමන කල්‍යාණමිත්‍ර ආශ්‍රය තුලින්මයි ඉදිරියට යන්න ඕනේ.

එතකොට අපි කාවද කල්‍යාණමිත්‍රයා කොට ගන්නේ. මෙය සහටන් තබන භික්ෂුව කල්‍යාණමිත්‍රයා කොටගන්නේ ලොව්තුරා බුදුරජාණන්වහන්සේවයි. පින්වතුන්ලාට දැන් හිතෙන්න පුළුවවන් ලොව්තුරා බුදුරජාණන්හන්සේ දැන් පිරිනිවන්පාලා නේද කියලා. ඒ නිසාමයි සද්ධර්මය පිරිහෙමින් පවතින මෙවැනි කාලයකදී ඇතිවන මෙවැනි හිඩැස් බුදුරජාණන්වහන්සේ නුවණින් දැකලා පිරිණිවන්පෑමට පෙරාතුව දේශනාකරන්නේ බුදුරජාණන්වහනසේගේ ඇවෑමෙන් ධර්ම විනය දෙක ශාස්තෘන්වහන්සේ හැටියට දකින්න කියලා. ඒ කියන්නේ ශාස්තෘන්වහන්සේ තවමත් ජීවමානව සිටිනවා. පින්වත් ඔබගේ කුසල් ශක්තිය නිසාම ඔබට ජීවමානව සිටින ධර්ම විනය දෙක කල්‍යාණමිත්‍රයා කරගැනීමට පුළුවන්.

මෙන්න මේ සැබෑම කල්‍යාණමිත්‍රයා ඔබට ලබාදෙන මුල්ම ගුරු උපදේශය තමයි පින්වත් ඔබ මේ ජීවිතය තුලදීම චතුරාර්ය සත්‍ය අවබෝධ කරගැනීමට නම් ඔබට අවශ්‍ය වන්නේ කාරණා තුනක් පමණක් බවයි. බලන්නකෝ, මේ මාර්ගය දිග්විජය කොට වදාළ සැබෑම කල්‍යාණමිත්‍රයාණන්වහන්සේ අපව මංමුලා කරන්නේ නැතිව අපිව බියට පත්කරන්නේ නැතිව අපිට පටලවන්නේ නැතිව බොහෝම සරලව දේශනාකරනවා මේ ජීවිතය තුලදීම චතුරාර්යසත්‍යය අවබෝධ කරගැනීමට පින්වත් ඔබට අවශ්‍ය ශ්‍රද්ධාව, වීර්යය, හිරිඔතප් කියන කාරණා තුනය කියලා. බලන්නකෝ මුළු ආර්ය අෂ්ඨාංගික මාර්ගයම ඉහත කාරණා තුන තුලින් ලොව්තුරා බුදුරජාණන්වහන්සේ අපට පෙන්වනවා. දැන් මේ උතුම් ගුරු උපදේශය ශාස්තෘන්වහන්සේ ලබාදෙන උපදේශයක් නිසා විවේචනයකින් තොරව පිළිගන්න

ඕනේ. පින්වත් ඔබ මේ උතුම් සම්බුදු වදන සැකයෙන් තොරව පිළිගැනීමට සූදානම් නම් ඒ සූදානම් තුලම ඔබ තුල සකස්වෙන්නේ බුදුරජාණන්වහන්සේ කෙරෙහි ශ්‍රද්ධාවයි. තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාවකින් තොරව ඕනෑම පිංවතෙක් තුල සකස්වෙන සතිය, මිච්ඡා සතියක්ම වෙනවා. මේවා තුලින් නිවීමේ මාර්ගයට අනතුරක් වූ සක්කායදිට්ඨියමයි සකස්වෙන්නේ. තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාව කියන කාරණය මේ ලෝකයේ ශ්‍රේෂ්ඨම ධනය කියලයි බුදුරජාණන්වහන්සේ දේශනා කරන්නේ. ශ්‍රද්ධාව කියන ධනයෙන්මයි ඔබට නිවීමේ මාර්ගයේ දොරටුව විවෘතකොටගත හැකිවෙන්නේ.

# තමා තුළින්ම කල්‍යාණ මිත්‍රයා මතුකොට ගන්න දක්ෂවෙන්න

පින්වත් ඔබට තවමත් නිවීමේ මාර්ගයේ දොරටුව විවෘත නැතිනම් ඔබ මුලින්ම ශ්‍රද්ධාවේ යතුරයි සොයාගත යුත්තේ. ශ්‍රද්ධාවේ යතුර සොයාගෙන යනකොට පින්වත් ඔබ ප්‍රවේසම් වන්න ඕනේ. ශ්‍රද්ධාව කියන සැබෑම යතුරත්, අමූලිකා ශ්‍රද්ධාව කියන ව්‍යාජ යතුරත් දෙකම ලෝකය තුල තිබෙනවා. මේ යතුරු දෙක නිවැරදිව හඳුනා ගැනීමේ ශක්තිය ඔබට තිබෙන්නට ඕනේ. අමූලිකා ශ්‍රද්ධාව කියන යතුර මෝහය මුහුකරලයි හදලා තියෙන්නේ. එය අභියෝගයන් සහිත අවස්ථාවලදී දියවෙලා යනවා. ශ්‍රද්ධාව බුදුරජාණන්වහන්සේගේ ගුණයන් කෙරෙහි අවබෝධයෙන් සැබෑම විශ්වාසයෙන් හැදිලා තිබෙන්නේ. ඒ විශ්වාසය කවදාවත් අභියෝග හමුවේ ඔබට අතහැරෙන්නෙ නැහැ. ශ්‍රද්ධාව සකස්කොටගත් තැනැත්තා බුදුරජාණන්වහන්සේ දේශනාකොට වදාළ ධර්මයෙන් බැහැරට යන්නෙ නැහැ. එම ගුණයන් පිළිබඳව අතිශයෝක්තියක් නොවේ. ඔහුට තිබෙන්නේ. සැබෑම අවබෝධයක් විශ්වාසයක්.

මෙය සටහන් තබන භික්ෂුව බුදුරජාණන් වහන්සේගේ ගුණයන්මයි ඥාණයන්මයි නිරතුරුවම දැක්කේ. බුදුරජාණන් වහන්සේ තුලින්මයි ධර්මරත්නයේත් සංඝරත්නයේත් ආශ්චර්ය දැක්කේ. පින්වත් ඔබ බුදුරජාණන් වහන්සේ කෙරෙහි උතුම් ශ්‍රද්ධාව සකස්කොටගත් සැණින් එහි ඵලය හැටියට ධර්මරත්නයත් සංඝරත්නයත් කෙරෙහි ශ්‍රද්ධාව සකස්වෙනවා. බුදුරජාණන් වහන්සේගේ ධර්ම ශක්තිය අයෝමය ශක්තියක්. එම ශක්තිය තුල

සිටිමිනුයි අපි ජීවිතය දකින්න ඕනේ. බුදුරජාණන්වහන්සේගේ අයෝමය මහා කරුණා ගුණයේ ආශ්චර්යමත් භාවයමයි භික්ෂුව හැම මොහොතේම දැක්කේ. එම මහා කරුණා ගුණයේ ඊ කවරණය තුල සිටිමින්මයි භික්ෂුව නිවන් මාර්ගයේ සෑම පියවරක්ම තැබුවේ. භික්ෂුව හැම මොහොතකම දැක්කේ ලොව්තුරා බුදුරජාණන්වහන්සේ මේ උතුම් ශ්‍රද්ධර්මය දේශනා කළේ මා උදෙසාමයි කියලා.

මුලින්ම ඔබ බුදුරජාණන්වහන්සේ ඔබේ කරගත යුතුයි. ඔබේ ආරක්ෂකයා කරගත යුතුයි. භික්ෂුවගේ ගිහි ජීවිතයේදීත් පැවිදි ජීවිතයේදීත් සැප දුක් භික්ෂුව දැක්කේ ධර්මයේම කැඩපතක් හැටියට. බුදුරජාණන්වහන්සේගේ ධර්මයත් භික්ෂුවගේ ජීවිතයත් අතර වෙනසක් දැක්කේ නැහැ. ඒ හේතුවෙන්මයි ජීවිතයත් ධර්මයත් එකක්ම වුයේ. ජීවිතයත් ධර්මයත් එකක්ම වෙච්ච තැනකදී ධර්මය සොයා යන්න භික්ෂුවට අවශ්‍ය වුණේ නැහැ. ජීවිතය තුලින්ම ධර්මය දැක්කා. ධර්මය තුලින්ම ජීවිතය දැක්කා. මේ තරම් සරල තැනකට භික්ෂුව ගෙනාවේ තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාව නිසාමයි. මේ ශ්‍රද්ධාව හේතුවෙන්ම භික්ෂුව තුලින්ම භික්ෂුව කල්‍යාණමිත්‍රයා මතුකොට ගත්තා. තෙරුවන් තුලින්ම තමා කල්‍යාණමිත්‍රයාව මතුකොට ගැනීම. දැන් තමා සුරක්ෂිත පුද්ගලයෙක්.

ඔහු දැන් ලෝකය පසුපස ධර්මය සොයමින් ඉබාගාතේ යන්නේ නැහැ. බුදුරජාණන්වහන්සේ තම ශ්‍රාවකයන්ගෙන් බලාපොරොත්තු වුන සැබෑම ඉලක්කය පිළිබඳව සිහියෙන් ඔහු නිරතුරුවම සන්නද්ධයි. මේ සිහිය නැමැති සන්නද්ධ ආරක්ෂාව නිරතුරුව නිවීමේ මාර්ගයේ සතුරු සේනාවන් වන පංචනීවරණ ධර්මයන් පළවාහරිනවා. පංචනීවරණයන්ගෙන් යටපත් වූ සිත බුදුරජාණන්වහන්සේගේ ගුණයන් ගැනමයි සිහිපත් කරන්නේ. ලෝකයේ ශ්‍රේෂ්ඨම ධනවත්භාවය වන ශ්‍රද්ධාව අචල ශ්‍රද්ධාව බවට පත්කරගැනීමටයි දැන් ඔහු වෙහෙසෙන්නේ. ඔහු හොඳින්ම දන්නවා නිවීමේ

මාර්ගයේ මුල්ම සුදුසුකම ශ්‍රද්ධාව බව. ඔහු සමාධිය ගැන ප්‍රඥාව ගැන සිතන්න කලබලවෙන්නේ නැහැ. එහෙම සිතන්න කියලා බුදුරජාණන්වහනසේ තවම කියලා නැහැ.

ආර්ය අෂ්ඨාංගික මාර්ගයේ මුල්ම පියවර සම්මා දිට්ඨිය. මුලින්ම තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාවට මුල් තැන දෙන්න. අපි පළවෙනි පියවර සැකයෙන් විචිකිච්ඡාවෙන් පිරිසිදු කොටයි දෙවැනි පියවරට යා යුත්තේ. තෙරුවන්ගේ ගුණයත් එහි සැබෑම අර්ථයත් නුවණින් දකිනකොට ශ්‍රද්ධාව අප තුල අචල ශ්‍රද්ධාවක් බවට වැඩෙන්නේ ප්‍රඥාවත් සියුම්ව මෝදුකරගෙනයි. ශ්‍රද්ධාව හේතුවෙන් ඔබතුල ප්‍රඥාව වැඩෙනවා කියන්නේ ප්‍රඥාව සකස්වීමට හේතු කාරණා වන වීර්‍යය සති, සමාධි, ධර්මයනුත් පින්වත් ඔබ තුල මෝදුවෙනවාය කියන කාරණයයි. මෙවැනි මොහොතක පින්වත් ඔබ තව තවත් බුදුරජාණන්වහන්සේගේ මහා කරුණා ගුණයේ සෙවණටමයි සමීප විය යුත්තේ. බුදුරජාණන්වහන්සේගේ මහාකරුණා ගුණය අපගේ භව අසරණභාවය නිවීම උදෙසාමයි. උන්වහන්සේ සසර පුරාවට පාරමීධර්මයන් පුරමින් සකස්කොට ගත් ඒ මහා කරුණා ගුණයේ සෙවණට යමෙක් පත්වුවහොත් ධර්මයේ ඵලයන්මයි ඔහු බලාපොරොත්තු විය යුත්තේ.

භික්ෂුව මෙවැනි ස්වභාවයක් තුලදී නිරතුරුවම සිතුවේ බුදුරජාණන්වහන්සේ සංසාරයක් පුරාවට මම උදෙසා මොන තරම් කැපවීමක් කළාද කියන කාරණය. අපි හැම වේලාවකම බුදුරජාණන්වහන්සේ කියලා කියනකොට සිදුහත් කුමාරයා කියන තැනින් තවතිනවා. සිදුහත් කුමාරයා කියන තැනට එන්න බෝධිසත්වයන් වහන්සේ මොන තරම් නම් කැපවීම් සිදුකළාද? දීපංකර බුදුරජාණන්වහන්සේ අභිමුව සුමේධ තාපසයන් හැටියට දීපංකර බුදුරජාණන්වහන්සේගෙන් එක බණ පදයක් ශ්‍රවණය කරලා නිවන් අවබෝධය ලබන්න එදා සුමේධ තාපසයන්ට අවස්ථාව තිබුණා. සුමේධ තාපසයන් තමාගේ නිවීමේ කැමැත්ත අතහරිනවා මම තනිවම නිවන් අවබෝධ කරගන්නේ නැහැ. තවත් සියක් කෝටි ගණනක් අසරණ සත්වයින්ට නිවන් මාර්ගය

මතුකොට දීලයි පිරිනිවී යන්නේ කියලා. එදා සුමේධ තාපසයන් ආත්මාර්ථකාමී නොවී පරාර්ථකාමී තීරණයක් අරගෙන මේ අතිභයානක සංසාර ගමනට බැස්සේ ඔබ උදෙසාමයි කියලයි ඔබ සිතන්න පුරුදුවෙන්න ඕනේ. එදා සුමේධ තාපසයන් එවැනි තීරණයක් නොගන්න අපට ගෞතම සම්මා සම්බුද්ධ ශාසනයක් මුණගැසෙන්නේ නැහැ. එහෙම වුණානම් ඔබත් මමත් බිහිසුණු මිත්‍යාදෘෂ්ටික ලෝකයේ සතර අපායේ කොටස්කරුවෙක් මේ මොහොතේ.

දීපංකර බුදුරජාණන්වහන්සේගෙන් ගෞතම සම්මා සම්බුද්ධත්වය කියන නියත විවරණය ලබාගත් තැන් පටන් කල්ප ලක්ෂ කීයක් නම් දසපාරමී ධර්මයන් පුරමින් සංසාරයේ සැරිසැරුවද? මේ අති දීර්ඝ කාලය පුරාවට තම ඇස් ගලවා ගලවා කැමැත්තෙන්ම දන් දෙනවා. මහා සාගරයේ ජලය පරදවන තරමට රුධිරය දන් දෙනවා. මහ පොළොවේ පස් පරදන තරමට ශරීර මාංශ දන්දෙනවා. මේ සංසාරික පාරමී ගමන තුල දී සක්විති රජ පදවියක් රටක්, රාජ්‍යයක්, බිසවක්, බිරිඳක්, දරුවෙක්, තනතුරක්, වස්තුවක්, දේපළක් ලැබුවද ඒ සියල්ල කැමැත්තෙන් දන් දෙනවා. තමාගේ කැමැත්ත ඔබ අපි උදෙසාම කැප කරනවා. අපිට ධර්ම මාර්ගය විවෘත කොට දීම උදෙසා සියල්ල කැප කරනවා. පින්වත් ඔබ සිතන්න දක්ෂවෙන්න ඕනේ ඔබ සඳහාමයි බෝධිසත්වයන් මේසා කැපවීම් කළේ කියලා.

කල්පයක් කියන්නේ මොන තරම් දුරක්ද? බුදුරජාණන්වහන්සේ දේශනාකරනවා කල්පයක් හැඳින්වීමට මෙවැනි උපමාවක්. යොදුනක් දිග යොදුනක් පළල යොදුනක් උස පෙට්ටියක් ගන්න. මෙතනදී යොදුනක් කියන්නේ සැතපුම් හතක් පමණ ප්‍රමාණයක් බව ඔබ සිහිකරගත යුතුයි. මේසා විශාල පෙට්ටියකට අබ ඇට පුරවලා වසර 100 ට වතාවක් එක අබ ඇටය බැගින් ඉවත්කළොත් යම් දවසකද එම අබ ඇට ප්‍රමාණය ඉවර වෙන්නේ කල්පයත් එතරම් දුරයි කියලා. එහෙම නම් පින්වත් ඔබ නුවණින් මෙනෙහි කළ යුතුයි පින්වත් ඔබ උදෙසාම ඔබට මේ ධර්මයේ සැනසිල්ල

ලබාදීම උදෙසාම බෝධිසත්වයන්වහන්සේ එවැනි කල්ප ලක්ෂ කීයක් කැපකළාද කියන කාරණය. මෙවැනි සිතාගැනීමටවත් නොහැකි අතිදීර්ඝ කැපවීමක් ඔබ වෙනුවෙන් ඔබගේ දෙමාපියන්, ඥාතීන් දරුවන් විඳලා නැහැ. ඒ අය ඔබ වෙනුවෙන් උපරිම වසර 50 ක් දුක් විඳින්න ඇති. ඒ වසර 50 ක් දුක් විඳින්නේ මගේ පුතා, දුව කියන චේතනාවෙන්. මෙවැනි මහ මෙරක් වගේ කැපවීමක් ඔබ වෙනුවෙන් සිදුකළ අම්මා කෙනෙක් තාත්තා කෙනෙක් ඥාතිවරයෙක් සිටිනවා. නමුත් ඒ ප්‍රතාපවත් ඥාතිවරයාගේ අම්මාගේ තාත්තාගේ රුව ගුණ සැබවින්ම ඔබ දකින්නේ නැහැ. බුදුරජාණන්වහන්සේ කියලා සිතනකොට සිදුහත් කුමාරයා කියන තැනින් නවතින්නේ නැතිව දීපංකර බුදුරජණන්වහන්සේගේ පාද මූලයටම යන්න. ඒ අතීත කාල පරාසය තුල ශ්‍රද්ධාව සකස්කර ගැනීමට අවශ්‍ය මහා ගුණ කන්දරාවක් සැගවී තිබෙනවා.

මෙවැනි අතීත පාරමී ගමනක් පරිපූර්ණ කරලා සිදුහත් කුමාරයා හැටියට ඉපදිලා මොන තරම් අසිරියක්ද වින්දේ. අනාගත සක්විති රජකමේ අසිරිය දරාගෙන රජ පවුලක උපත ලබලා රම්‍ය, සුරම්‍ය, සුභ මාළිගාවල අනේක සැප පහසුව ලබලා යසෝදරාව වැනි පින්වත් රූමත් බිසවක් රාහුල වැනි පිනැති පුතකු ලබලා මේ සැම සම්පතක්ම හිම්දිරියේ ඉවතලන කෙළ පිඩක් සේ ඉවත දමලා ගිහි ගෙදරින් නික්මිලා වනගත වෙනවා. පින්වත් ඔබට පුළුවන්ද ඔබේ ගේ දොර අතහැරලා, ව්‍යාපාරය අතහැරලා, දුවා දරුවන් අතහැරලා එක් දිනක් විවේකීව සිටින්න. නමුත් සිදුහත් කුමරුන් මෙවන් යස ඉසුරු අත්හැරදමා යන්නේ ඔබත් මමත් මේ මොහොතේ ලබන සද්ධර්මයේ සැනසිල්ල ලබාදීම සඳහාමයි.

එතැන් පටන් හය වසරක් පුරාවට ගුරුවරයෙක් ඥාතියෙක් හිතවතෙක් නොමැතිව අධිෂ්ඨානය පමණක් එකම හිතවතා කොටගෙන දුක තුලින් දුක ජයගැනීමට හැකිය යන විශ්වාසයෙන් ශරීරයට දුන් අප්‍රමාණ දුක් මෙලොව කිසිම බ්‍රහ්මයෙකු, දෙවියෙකු, මනුෂ්‍යයෙකු මෙයට වැඩියෙන් විඳ නැති බව පසු

කාලයකදී බුදුරජාණන්වහන්සේ දේශනා කරනවා. මේ දුෂ්කර ක්‍රියා කරන කාලයේදී සමහර දිනවල මම වැළඳුවේ එක මුං ඇටයක් පමණයි. සමහර දිනවල වැළඳුවේ එක සහල් ඇටයක් පමණයි. ඊට වඩා දෙයක් මම ගත්තේ නැහැ. මම විශ්වාස කළා දුක තුලිනුයි දුක ජයගන්න පුළුවන් වෙන්නේ කියලා. ඒ කාලයේ මගේ උදරය කියලා පිටකොන්ද කියලා දෙකක් තිබුණේ නැහැ. ඒ දෙකම එකට ඇලිලයි තිබුණේ. නමුත් අතීත පාරමී ශක්තිය නිසා ජීවිතය රැකිලයි තිබුණේ. මට සමහර දිනවල ඇවිදින්න පණ තිබුණේ නැහැ. මම බඩගාගෙන ගව ගාල්වලට ගිහිල්ල ගොපළු දරුවන් ඉවත්වෙනතුරු ඉඳලා එළදෙනුන්ගේ තන පුඩුවලට කට තබාගෙන කිරි උරා බීවා. එම එළදෙනුන් පයින් ගසන විට ඒ පා පහරවල් වැදී කලන්තය දමා දින ගණන් වැටී සිටියා. නැවත සිහිය එනවිට ගවගාලේ වැටී තිබූ වසු පැටවුන් දමන කහපාට අසුචි මම අනුභව කළා. වසු පැටවුන්ගේ කහපාට අසූචි අනුභව කරනකොට මට අපුලක් දුගඳක් දැනුනේ නැහැ. මම කැමැත්තෙන්මයි අනුභව කළේ. රජ පවුලක සක්විති රජ තනතුරේ උරුමය දරාගෙන ඉපදිලත් සිදුහත් කුමරුන්ට හරක් පැටවුන්ගේ කහපාට අසූචි වළඳනකොටත් අපුලක් දුගඳක් නොදැනුනේ ඔබත් මමත් කෙරෙහි අනුකම්පාවෙන්මයි. ඔබත් මමත් මේ මොහොතේ ලබන සද්ධර්මයේ සැනසිල්ල ලබාදීම සඳහාමයි.

පසුව උන්වහන්සේ දැනගන්නවා දුක තුලින් දුක ජයගන්න බැහැය කියන කාරණය. උන්වහන්සේ මධ්‍යම ප්‍රතිපදාව තෝරාගන්නේ ඉන් අනතුරුවයි. ඉන් අනතුරුව සුජාතා සිටුදියණියගේ කිරිපිඬු දානය වළඳලා ජය ශ්‍රී මහා බෝධිමූලයේ බෝධිසත්වයින් වාඩිවෙන්නේ "මේ ශරීරයේ ලේ සම් මස් නහර වියලේවා! මා සම්මා සම්බෝධිය අවබෝධයෙන් තොරව නොනැගිටිමි" ය කියන අධිෂ්ඨානයෙන්. බලන්න පින්වත් ඔබත් මමත් උදෙසා බෝධිසත්වයන්වහන්සේ තම ජීවිතය මරණයට දමනවා ජීවිතය අතහරිනවා උතුම් සම්මා සම්බුද්ධත්වය වෙනුවෙන් පින්වත් ඔබටත් මටත් මේ සම්මා සම්බුද්ධ ශාසනේ

අසිරිය ලබාදෙන්න බෝධිසත්වයන් කී වතාවක් නම් ජීවිතය මරණයට දමන්න ඇති ද? උන්වහන්සේගේ අතීත පාරමී ශක්තියේ කුසල් සංස්කාරයන්ගේ බලවත්භාවය නිසාම සම්මා සම්බුද්ධ ඥාණයත් ජීවිතයත් දෙකම දිනාගන්නවා. ඔබත් මමත් උදෙසා මෙවන් අසිරිමත් කැපවීම් කළ තවත් උත්තමයෙක් ගැන කෙසේ නම් සිතන්නද? පින්වත් ඔබේ අම්මා, තාත්තා, පුතා, දුව, ඥාතිවරයා වැඩිම වුනොත් අවුරුදු 50 ක් දුක්විඳින්න ඇති. එත් ඒ දුක් වින්දේ ඔබට අධ්‍යාපනයේ රැකියාවේ ගෙදර දොරේ විවාහ ජීවිතේ වටිනාකම කියාදෙන්නමයි ඒ කියන්නේ දුකට පාර කියා දෙන්නමයි. එහෙත් කල්ප ලක්ෂ ගණනක් පුරාවට මහාසාගරය ලේ ධාතුවෙන් පුරවපු මහා පොළොව ශරීර මාංශවලින් වැසුව ඔබ වෙනුවෙන් මහා දුක්කන්දරාවක් වින්ද අම්මා කෙනෙක් තාත්තා කෙනෙක් ඥාතිවරයෙක් මේ ලෝකයේ ඉන්නවා ඒ තමයි ලොව්තුරා බුදුරජාණන්වහන්සේ. මෙසේ සිතමින් ම ඒ උතුම් අම්මා තාත්තාගේ මහා කරුණා ගුණයේ සෙවනටමයි අප සේන්දුවෙන්න ඕනේ. ඒ උතුම් කරුණා ගුණය තුලයි අපේ අසරණභාවයට සරණක් තිබෙන්නේ.

බෝධිසත්වයන් වහන්සේ ලොව්තුරා සම්බෝධිය අවබෝධකොටගෙන හතලිස් පස් වසරක් පුරාවට උන්වහන්සේ තම සිරිපතුල්වල කරගැට දියපට්ටා මතුවෙන තුරාවට යොදුන් සිය දහස් ගණන් දෙපයින්ම වැඩම කොට අසරණ සත්වයින් සොයා සොයා ගියේ සද්ධර්මයේ සැනසිල්ල ලබාදීමටයි. සාරා සංඛ්‍යය කල්ප ලක්ෂ ගණනාවක් පුරාවට රැස්කළ පාරමී ධර්මයන්ගේ ඵලය වන සම්මා සම්බෝධිය හතලිස් පස්වසරකින් නිමා කරලා පිරිනිවන් මංචකයේ සැතපිලා උන්වහන්සේ දේශනාකරන්නේ "සියළු සංස්කාරයෝ අනිත්‍යයි" කියන ධර්මතාවයි. මේ අනිත්‍යයි කියලා දේශනා කරන්නේ හිස ගිනි ගත්තෙක් ඒ ගින්දර නිවන්න යම් වෙහෙසක් ගන්නේ ඊට වඩා වෙහෙසක් ගෙන මේ භවගින්දර නිවාගන්න කියන අවසාන වචනයයි සම්බුදු මුවින් පිටවෙන්නේ. උන්වහන්සේ දේශනා කළේ නැහැ පින්වතුන්ලාට තට්ටු දෙකේ

ගෙදරක් හදාගෙන හොඳ රැකියාවක් ව්‍යාපාරයක් කරගෙන විවාහයක් වෙලා දරු මුණුපුරන් හදාගෙන ජීවත්වෙන්න එය සැපයක්ය කියලා. උන්වහන්සේ දේශනා කලේ නැහැ කිසිදු දිව්‍ය බ්‍රහ්ම තලයක එක දශමයක හෝ නිත්‍ය ස්ථිර සැපයක් තිබෙනවා කියලා. ඇයි භාග්‍යවතුන්වහන්සේ එහෙම දේශනා නොකළේ? අනේ මේ සත්වයා මේ කෙටි සැපයට මුලාවී කල්ප ගණන් වන අබුද්ධෝත්පාද කාලවල මංමුලාවට පත්වී දුක්විඳියි කියන මහා කරුණාවෙන්මයි. ඔබ උදෙසා මෙවන් අසිරිමත් මහාකරුණා ගුණය ලයෙහි දරාගෙන වැඩසිටිය උතුම් ශාස්තෘන්වහන්සේගේ මහා කරුණා ගුණයේ සෙවනට ඔබ ලංවෙන්න. උන්වහන්සේ කැමතිවුනේ නැහැ සත්වයා භවයේ දුකෙන් දුකට යනවා දකින්න. එවන් අසිරිමත් ශාස්තෘන්වහන්සේ නමකගේ රැකවරණයෙන් ඔබ දුරස්වෙන්න එපා.

# තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාව තුලින් ධර්ම මාර්ගය කෙරෙහි වීර්‍යය මෝදුකොටගන්න

ඒ අයෝමය චරිතය පුරා බලනකොට කල්ප ගණනාවක් පිරූ පාරමීධර්මයන්ගේ ඵලය ප්‍රඥාව හැටියට ජීවිතයට එකතුකොටගත් ආදර්ශයමයි අපිට වැදගත් වෙන්නේ. මේ පාරමී ශක්තියේ ඵලය තුලින් තමයි මහාසීහනාද සූත්‍රය දේශනා කරන බුදුරජාණන්වහන්සේ ලෝකයාට සිංහනාද කරන තථාගත බලයන් සකස්වෙන්නේ.

බුදුරජාණන්වහන්සේ සතුවූ උතුම් ඥාණයන් ගැන නුවණින් මෙනෙහි කරන්න. සත්වයාගේ අතීත අනාගත වර්තමාන කර්මයන් දැකීමේ ඥාණය, සත්වයාගේ පෙර ජීවිතය දැකීමේ පුර්වේනිවාසානුස්සති ඥාණය, සත්වයාගේ මරණින් පසු ජීවිතය දැකීමේ චුතුපපාත ඥාණය, දිව්‍ය චක්ඛු ඥාණය, දිව්‍ය ශ්‍රෝත්‍ර ඥාණය සත්වයාගේ ශ්‍රද්ධාදි ඉන්ද්‍රියයන්ගේ දියුණු නොදියුණු බව දකින ඥාණය, සත්වයාගේ ආශ්‍රවයන් ක්ෂය වූ බව දැනගන්නා ඥාණය, යමක ප්‍රාතිහාර්ය පෑමේ ඥාණය, සත්වයාගේ ධ්‍යාන විමෝක්ෂ සමාධි සමාපත්තීන්ගේ ස්වභාවය දැනගැනීමේ ඥාණය, ආස්‍රව නොමැති චේතෝවිමුක්තියත් ප්‍රඥාවිමුක්තියත් ප්‍රත්‍යක්ෂකොට ඊට පැමිණ වාසය කිරීමේ ඥාණය කියන මේ උතුම් සම්මා සම්බුද්ධ ඥාණයන්ගේ ආශ්චර්යවත් භාවය නිරතුරුවම සිහිපත්කරන්න. ඔබ වෙනුවෙන්ම පිරූ පාරමී ශක්තියේ ඵලය හැටියට මේ උතුම් ඥාණයන් දකින්න. මෙවැනි උතුම් ගුණයන්ගෙන් ඥාණයන්ගෙන් පරිපූර්ණ වූ ශාස්තෘන් වහන්සේගේ මහා කරුණා ගුණයේ සෙවණ ඔබේ ජීවිතයේ

එකම රැකවරණය කොට ගන්න. මෙවන් අසිරිමත් කැපවීම් ඔබ වෙනුවෙන් කළ බුදුරජාණන්වහන්සේට පින්වත් ඔබේ ජීවිතයට පූජාකරන්න. බුදුරජාණන්වහනසේට මේ ජීවිතය අයිති බව සිතන්න. මේ සිතුවිල්ලක් පාසා ඔබ ඇතිකරගන්නේ ශ්‍රද්ධාවට අවශ්‍ය ගුණාංගයි.

ඒ පිරිසිදු ශ්‍රද්ධාව සකස්වුණ තැනදී එහි හේතුඵල ධර්මයන් නිසාම ඔබ තුල මීළගට වැඩෙන්නේ වීර්‍යයයි. කුමක් කෙරෙහිද ඔබ වීර්‍යය ඇති කරගන්නේ? බුදුරජාණන්වහන්සේ දේශනාකොට වදාළ ධර්ම මාර්ගයේ පෙරටම විශ්වාසයෙන් යුතුව ගමන් කරන්නයි. පින්වත් ඔබ වීර්‍යයෙන් පෙරට යන ගමනේදී අධි වීර්‍යයෙන් බැහැර වෙනවා. හීන විර්යයෙනුත් බැහැර වෙනවා. ඔබ සැම මොහොතකම මධ්‍යස්ථභාවය තුලයි පෙරට යන්නේ.

මේ මධ්‍යස්ථභාවය තුල සිටිමින් ඔහු නුවණින් මෙනෙහි කරනවා බුදුරජාණන්වහන්සේ අපිට කුමක්ද දේශනාකොට තිබෙන්නේ කියලා. බුදුරජාණන්වහන්සේ දේශනා කරන්නේ පංචඋපාදානස්කන්ධය දුකය කියන කාරණයයි. මේ දුක් සහිත පංචඋපාදානස්කන්ධය තුන් ආකාරයකට මෙනෙහි කරන්න කියලා බුදුරජාණන්වහන්සේ දේශනා කරනවා. අතීත පංචඋපාදානස්කන්ධය වශයෙන්. මේ සටහන් පුරාවට සඳහන් කළා බෝධිසත්වයන් ගැන. බෝධිසත්වයන්ගේ මතකය අපි දීපංකර බුදුරජාණන්වහන්සේගේ පාද මූලය දක්වා අතීතයට අරගෙන ගියා. ඒ ඈත අතීතයේ පටන් මේ මොහොතේ අති ගෞරවයෙන් මතකයට නැගෙන බුදුරජාණන්වහන්සේගේ රූපකාය උන්වහන්සේගේ ගුණයන් ඥාණයන් සියල්ලක්ම අතීත පංචඋපාදානස්කන්ධයක් පමණක්මයි. සුමේධ තාපසයන් හැටියට මඩවගුරක වැතිරගෙන දීපංකර බුදුරජාණන්වහන්සේට පාපිස්නාවක් වූ ඒ සුමේධ තාපසයන්ගේ රූපය අනිත්‍ය වී ගියා. ඒ උතුම් ක්‍රියාව තුලින් සකස්වුණා වූ වේදනා සංඥා සංඛාර විඤ්ඤාණ සියල්ලම අනිත්‍ය වී ගිය පංචඋපාදානස්කන්ධයක්මයි. සාරා සංඛ්‍යෙය කල්ප ලක්ෂ ගණනාවක් පිරුවා වූ දසපාරමී

ධර්ම, වින්දාවූ සැප දුක්, ලැබුවා වූ අවබෝධයන් අනිත්‍යතාවයට පත් වූ පංචඋපාදානස්කන්ධයන්මයි. අතීත පාරමී ශක්තියෙන් සකස්වුනාවු දෙතිස්මහා පුරුෂ ලක්ෂණ ඒ ආශ්චර්යමත් බුදුරජාණන්වහන්සේගේ රූපකාය අනිත්‍යභාවයට පත් වූ පංචඋපාදානස්කන්ධයක්මයි සාරා සංඛ්‍යෙය කල්ප ලක්ෂ ගණනාවක් මම ඔබ වෙනුවෙන්ම පංචඋපාදානස්කන්ධය නිත්‍යභාවයෙන් වින්දාවූ බෝධිසත්වයන් වහනසේගේත් සම්මා සම්බුද්ධ ඥාණයේ ගුණයන්ගෙන් පංචඋපාදානස්කන්ධයේ අනිත්‍යභාවය ප්‍රත්‍යක්ෂකොටගත් බුදුරජාණන්වහන්සේගෙත් මතකය අතීත පංචඋපාදානස්කන්ධයන් පමණක්ම නම් ඔබේ ජීවිතය මගේ ජීතය ගැන මොන බලාපොරොත්තු තබා ගන්නද? මගේම කොටගත් මේ රූපය කෙරෙහි තෘෂ්ණාව හේතුවෙන්ම සකස්කොට ගත් විඳීම් මොන තරම් නම් ප්‍රෝඩාවක්ද? සාරා සංඛ්‍යෙය කල්ප ලක්ෂ ගණනාවක් මුළුල්ලේ බෝධිසත්වයින් මහා සාගරයේ ජලය පරදා රුධිරය දන්දෙන කොට, මහ පොළොවේ පස් පරදා ශරීර මාංශ දන්දෙනකොට, ඇස් ගලවා ගලවා දන්දෙනකොට සකස්කොට ගත් විඳීම් හඳුනාගැනීම් චේතනාවන් විඤ්ඤාණයන් සියල්ලම අනිත්‍යයේ අර්ථයටම අයත් දේවල්. ඔබ තුල සකස්වෙන වර්තමාන පංචඋපාදානස්කන්ධය තුලින් අතීත පංචඋපාදානස්කන්ධය මෙනෙහි කරනවා. ඒ මෙනෙහි කරන මොහොතේම වර්තමානයත් අතීතයට ගොසින්. මෙසේ මෙනෙහි කරනකොට තමා තුල සකස්වෙන්නේ බියක්. අනිත්‍ය වූ රූපයන් නිත්‍යභාවයෙන් ගැනීමෙන් සකස්වෙන බියක්. මේ බිය ඔබ තුල තව තවත් වීර්‍යය සකස්කොට දෙනවා. ධර්ම මාර්ගයේ පෙරට යන්න මේ වීර්‍යය ඔබ තුල සකස්වෙන්නේ තෙරුවන් කෙරෙහි ඔබ ඇතිකරගත් ශ්‍රද්ධාව නිසාමයි. දැන් ඔබ තුල තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාව තුලින් වීර්යයත් සකස් වෙලයි තියෙන්නේ.

මීළඟට ඔබ තුල හිරි ඔතප් කියන කාරණාවයි සකස්වෙන්නේ. ඔබ තුල ලැජ්ජාව බය දෙක නැතිකම සකස්වෙන්නේ අනිත්‍ය වූ

රූපයන් අනිත්‍ය වූ වේදනාවන් මගේ කොට ගැනීම නිසාමයි. ඔහු මෙනෙහි කොට බලනවා කුමක් නිසාද මේ ලැජ්ජා භය නැතිකම සකස්වෙන්නේ කියලා. රූපය කෙරෙහි තෘෂ්ණාව නිසාමයි. රූපය කෙරෙහි තෘෂ්ණාව නැති කරගැනීම උදෙසා බුදුරජාණන්වහන්සේ දේශනා කළ මාර්ගය ඔහු නුවණින් මෙනෙහි කරනවා. මේ වන විට ඔහු තුල සම්මා දිට්ඨිය වැඩිලයි තියෙන්නේ. ඒ සම්මා දිට්ඨිය වැඩීමේ ඵලය හේතුවෙන්ම ඔහු දකිනවා සම්මා සතිය ඇතිකර ගැනීමට නම් සම්මා වාචා සම්මා කම්මන්ත සම්මා ආජීව කියන සීලයට අයත් අංගයන් හොඳින් වැඩෙන්න අත්‍යාවශ්‍යයි කියලා. ඔහු සීලයට ජීවිතය තුලින් මුල් තැන දෙනවා. සීලයත් ජීවිතයත් ඔහු දෙකක් හැටියට නොවේ දකින්නේ. සීලයමයි ඔහු ජීවිතය හැටියට දකින්නේ. ඔහු සීලයෙන් ශක්තිමත් වෙනකොට ඔහු තුල අව්‍යාපාද අවිහිංසා නෙක්ඛම්ම සංකල්පයන් ශක්තිමත්ව වැඩෙනවා. මෙන්න මේ තැනට පින්වත් ඔබව ගේන්න තමයි ලොව්තුරා බුදුරජාණන්වහන්සේ ඔබට මේ ජීවියේදීම චතුරාර්ය සත්‍යය ධර්මය අවබෝධකර ගැනීමට නම් ශ්‍රද්ධාව වීර්යය හිරි ඔතප් කියන කාරණා තුනමයි අත්‍යාවශ්‍ය වෙන්නේ කියලා දේශනාකරන්නේ.

සීලයෙන් ඔබ පරිපූර්ණ වෙච්ච තැනමයි ඔබ තුල සමාධිමත් සිතක් සකස්වෙන්නේ ඒ සමාධිමත් සිතමයි. පින්වත් ඔබට පංචඋපාදානස්කන්ධයේ අනිත්‍ය දුක්ඛ අනාත්ම ස්වභාවය මතුකොට පෙන්වා දෙන්නේ. බොහෝම සුවසේ මංමුලා නොවී පින්වත් ඔබ තුලින්ම ධර්මාවබෝධයට යන මාර්ගය බුදුරජාණන්වහන්සේ නැමති කල්‍යාණමිත්‍රයා ඔබට පැහැදිලි කොටදී තිබෙනවා. අප සැම විටම ධර්මයේ හැඩ රුව අප තුලම තබාගෙන සමාජය තුල ධර්මය සොයනවා. අපේ ඥාතීන් ගුරුවරුන් නිරතුරුවම අපට උගන්වන්නේ පංචඋපාදානස්කන්ධය විඳින්න මිල කරන්න විකුණන්න. නමුත් බුදුරජාණන්වහන්සේ නැමති ගුරුවරයා නිරතුරුවම අපට ශ්‍රද්ධාව නැමැති විෂය උගන්වන්නේ පංචඋපාදානස්කන්ධයේ අනිත්‍යභාවය අවබෝධකොට ගැනීමටයි. පින්වත් ඔබ තුල නිවීමේ මාර්ගයට

අවතීර්ණ වීමට වීර්‍යයක් සකස් නොවෙනවා නම් ඔබ වාහා කළ යුත්තේ තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාව ශක්තිමත් කොට ගැනීමයි. තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාවේ දුර්වලභාවය නිසාමයි පින්වත් ඔබ තුල වීර්‍යය සහ සීලය කියන කාරණාවන් දුර්වල වෙන්නේ. එම නිසා සියල්ලටම පෙරාතුව තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාවටම මුල්තැන දෙන්න.

බුදුරජාණන්වහන්සේ, ධර්මරත්නය, සංඝරත්නය පිළිබඳ අචල විශ්වාසය ඔබ තුලින්ම මතුවෙන මොහොතේ ඊට සාපේක්ෂව ඔබ තුල වීර්‍යයමයි ජීවිතයට එකතුකොට ගන්නේ. මේ කාරණා තුන පින්වත් ඔබව ශක්තිමත් ආකාරයට ආර්ය අෂ්ඨාංගික මාර්ගය තුලට ස්ථානගත කරනවා. බුදුරජාණන්වහන්සේ අප සැමට කල්‍යාණමිත්‍ර භාවයෙන් යුතුව දේශනා කොට වදාළ ශ්‍රද්ධා වීර්‍යය හිරි ඔතප් කියන කාරණාවන් නිවීමේ මාර්ගයේ ප්‍රමුඛතාවයන් හැටියට අප ජීවිතයට එකතු කරනොගත්තොත් දුක නැමති සහකාරිය සමග අපට භවයේ තව ගොඩක් දුරක් යන්නම සිදුවේවි. අනාගත යාග භූමිවල අපි නොවිඳිනා දුක්විඳීවි. එම නිසා ශ්‍රද්ධාව වීර්‍යය හිරි ඔතප් කියන ධර්මතාවයන් තුලින්ම බුදුරජාණන්වහන්සේ දේශනා කොට වදාළ සැබෑම යාගය ඔබේ ජීවිතයට එකතු කොටගන්න.

# අශ්‍රද්ධාව තුලින් පෝෂණය වන වීර්යය, ක්‍රියාත්මකභාවයෙන් බලවත්වෙනවා

මිනිසුන් මරණ, සතුන් මරණ, සත්ව හිංසාකරන යාගභූමිවල යාගකරුවන්ටත් වීර්‍යය කියන කාරණය හොඳින් පිහිටලා තිබෙනවා. කොටින්ම ඔවුනට ඇත්තේ අධිවීර්‍යයක්. මේ අධිවීර්‍යයක් සකස්වෙන්නේ රූපය කෙරෙහි ඇතිකොටගත් දැඩි තෘෂ්ණාව හේතුවෙන්. රූපය ඇසුරෙන් සකස්වෙන පංචඋපාදානස්කන්ධයට ඇති දැඩි තෘෂ්ණාව හේතුවෙන්. මිනිසුන්ගේ තිරිසන් සතුන්ගේ මරණ අඳෝනාවන් තුලින් තම ජීවිතයට තම ඥාති වර්ගයාගේ ජීවිතවලට ආයුෂ වර්ණය සැපය බලය සොයන මේ අයව වීර්‍යය විසින් අකුසලයෙන් අකුසලයටමයි ඇද දමන්නේ. මොවුන්ගේ වීර්‍යය පෝෂණය වී ඇත්තේ අශ්‍රද්ධාව තුලින්මයි. අශ්‍රද්ධාව තුලින් පෝෂණය වන වීර්‍යය ක්‍රියාත්මකභාවයෙන් බොහෝම බලවත් වෙනවා. සත්වයාට සංසාරික භව ගමනේදී කල්ප ගණන් සතර අපායන්හි ප්‍රමාදභාවයට පත්කරවන්නේ අසද්ධාවෙන් පෝෂණය වුණ වීර්යයේ හේතුඵල ධර්මයෙන්මයි.

අශ්‍රද්ධාව තුලින් සකස්වෙන මිත්‍යාදෘෂ්ටිය නිසා රූපය නිත්‍යභාවයෙන් ගැනීම නිසාම අසීමිත ඇලීම් සහ ගැටීම් දෙසට ඔබව යොමුකරනවා. එහි ඵලය දුස්සීලභාවයමයි. දුස්සීලභාවයේ ඵලය සතර අපායමයි. පින්වත් ඔබ බොහෝම විවේකීව පරිස්සමෙන් සිතන්න ඕනේ. ඔබ ඔය ඉටුකරන වගකීම් ඉටුකිරීම උදෙසා ගන්න වීර්‍යය අවංකවම ශ්‍රද්ධාවෙන්ද අශ්‍රද්ධාවෙන්ද පෝෂණයවෙලා තියෙන්නේ කියලා. වර්තමාන

ලෝකයේ මනුෂ්‍යයන් තුල බොහෝ විට ක්‍රියාත්මක වන වීර්‍යය අශ්‍රද්ධාව තුලින්ම සකස්කොටගත් වීර්‍යයක්. අශ්‍රද්ධාව තුලින්ම සකස්කොටගත් අධිවීර්යය නිසාම ප්‍රභූ ජීවිතයක් ගතකොට මියගිය මහත්මයෙක් මරණින් මතු ලැබූ උපත ගැන එක්තරා, භික්ෂුවක් සමාධියෙන් අරමුණු කොට බලනවා. එවිට ඒ ව්‍යාපාරික ප්‍රභූ මහත්මයා මරණින් මතු ඌරු කුලයක උපත ලබලා. හොඳින් නුවණින් ධර්මානුකූලව මෙනෙහි කරන්න. තම ප්‍රභූත්වය ආරක්ෂාකොට ගැනීම සඳහා සිදුකළ යාගයන්ගේ ඵලයයි මේ ඌරු ජීවිතය. ඇයි මේ ඌරු කුලයක ඉපදුනේ? නැවත නැවත හිංසාවට ලක්වෙමින් මැරුම් කන්න. බුදුරජාණන්වහන්සේ දේශනා කරනවා. තිරිසන් සතුන් වෙලා උපදින සතුන් මැරෙන මොහොතේ එම සත්ව සංඥාවම එම සත්ව රංචුවම උපාදානය කොට ගන්නා නිසා ආත්ම භාව 500 යක් පමණ එම කුලයේම උපදිනවා කියලා. ඌරා මැරෙන වෙලාවේ ඌරු රංචුවමයි උපාදානය වෙන්නේ. එම නිසා ඊරියකගේ කුසකම නැවත ප්‍රතිසන්ධිය සකස්කොට ගන්නවා. ඒ කියන්නේ නැවත නැවත හිංසාවට ලක්වෙමින් මැරුම් කන්න. ඕනෑම ඌරෙක් ස්වාභාවික ලෙස වයසට ගොස් මැරෙන්නේ නැහැ. මැරිලා වළදමන්නේ නැහැ. හිංසාවට ලක්කරලාමයි මරන්නේ. තිරිසන් සතුන්ගෙ න් වැඩියෙන්ම හිංසාවට පත්කොට මරණ සතා තමයි ඌරා. හිසට පොලුවලින් ගහලා මස තලනවා. පණපිටින් සිටියදීම පණ ගැහෙන ගමන්ම සමේ රෝම පුළුස්සනවා. මේ සතුන් මැරෙන්න පෙරාතුව ඇයි මේ තරම් දහ දුක් විඳින්නේ. අතීත භවයන්හිදී මනුෂ්‍යයින් ප්‍රභූන් වශයෙන් ඉපදිලා තම ආයුෂ වර්ණය සැපය බලය උදෙසා අශ්‍රද්ධාවේ වීර්‍යයෙන් පවත්වපු මිනිස් යාගයන් සත්ව යාගයන් නිසාමයි. ප්‍රභූ ව්‍යාපාරික ජීවිතයක් ලබලා එම ප්‍රභූභාවය නිසාම සියළු යස ඉසුරු සම්පත් ලබලා සුඛෝපභෝගී ජීවිත ගතකරලා මැරෙන මොහොතේ එක නිමේෂයක ප්‍රමාදයකින් ඌරු කුලයක පිළිසිඳගන්නවා. අශ්‍රද්ධාව තුලින් සකස්වෙන වීර්‍යය ගැන පින්වත් ඔබ ගොඩාක් පරිස්සම් වෙන්න ඕනේ. මේවා කියවලා මෙය සටහන් තැබූ භික්ෂුවට

හිංසාකිරීමට නොවේ සිතිය යුත්තේ. තමා තමාට හිංසාකරගන්නා වූඅශ්‍රද්ධාවේ වීර්‍යයෙන් අප්‍රමාදව මිදී තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාව සකස්කොට ගැනීමයි.

තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාව ඔබ තුල සකස්වෙන්නේ කල්‍යාණමිත්‍ර ඇසුරත් සද්ධර්මශ්‍රවණය කිරීමත් තුලින්මයි. ශ්‍රවණය කළා වූ සද්ධර්මය නුවණින් මෙනෙහි කිරීම තුලින්මයි. වීර්‍යය කියන වචනයට සැබෑම වටිනාකම සැබෑම අර්ථය ලබාදෙන්නේ ශ්‍රද්ධාව විසින්. ශ්‍රද්ධාවේ අර්ථයෙන් පෝෂණය වුන වීර්‍යය ඔබේ ඉලක්කය සකස්කොට දෙන්නේ ආර්ය අෂ්ඨාංගික මාර්ගය තුලටමයි. ඒ හේතුව නිසාමයි ලොව්තුරා බුදුරජාණන්වහන්සේ මේ ජීවිතය තුලදීම ධර්මාවබෝධයෙන් සැනසීමට අවශ්‍ය නම් ශ්‍රද්ධාව වීර්‍යය හිරි ඔතප් කියන කාරණා තුනයි ඔබ වැඩිය යුත්තේ කියලා දේශණා කරන්නේ.

භාවනා කරන පින්වතුන්ලාත් මේ කාරණය බොහොම හොඳින් සිහියට ගන්න ඕනේ. බුදුරජාණන්වහන්සේ ධර්මරත්නය සංඝරත්නය පිළිබඳව කියවීමෙන් හැදෑරීමෙන් අපි ලබන දැනුම ශ්‍රද්ධාව නොවේ. ශ්‍රද්ධාව සකස්වීමට දැනුම ඉවහල් වෙනවා. මේ දැනුම ශ්‍රද්ධාව වශයෙන් හඳුනාගෙන භාවනාවන්ට යොමුවුණ විශාල පින්වතුන්ලා පිරිසක් සමාජයේ සිටිනවා. යම් පින්වතෙක් භාවනාව හුදු කායික මානසික සුවයක් ලබාගැනීම සඳහා පමණක් නම් සිදුකරන්නේ ශ්‍රද්ධාවේ අවශ්‍යතාවයක් මතු වෙන්නේ නැහැ. නමුත් පින්වත් ඔබ සසර දුකෙන් එතෙර වීම සඳහා චතුරාර්ය සත්‍ය අවබෝධය උදෙසා නම් භාවනා කරන්නේ තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාවටයි ඔබ මුල් තැන දිය යුත්තේ. තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාවටයි ඔබ මුල් තැන දිය යුත්තේ. තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාවයි සම්මා දිට්ඨිය ඔබ තුල සකස් කර දෙන්නේ. සම්මා දිට්ඨියෙන් තොරව සම්මා සතියක් සම්මා සමාධියක් ගැන සිතීම විහිළුවක් වෙනවා. මෙතනදී ඔබ උපේක්ෂාව තුල සිටිමින් ලෝකය තුල දුකත් සැපත් අතර දෝලනය වීම පමණක්මයි සිදුවන්නේ. ලෝකයෙන් මිදීම දෙසට ගමන් කරන්නේ නැහැ. ලෝකයෙන්

මිදීමට නම් චතුරාර්ය සත්‍ය ධර්මයේ මුල්ම ආර්ය සත්‍යය වන පංචඋපාදානස්කන්ධය දුකය කියන කාරණය දුකට හේතුව තෘෂ්ණාව කියන කාරණය භාවනා කරන පින්වතා දැනගන්න ඕනේ. තෘෂ්ණාව ප්‍රහාණය කිරීමේ මාර්ගයයි භාවනාව කියන කාරණය තුලින් දැන ගන්න ඕනේ. ඒ දැකීම ඔබ තුල සකස්කොට දෙන්නේ තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාවයි. ශ්‍රද්ධාව තුලින් සකස්වෙන පංචඋපාදානස්කන්ධය අනිත්‍යයි කියන දැක්ම ඔබ තුල නැත්නම් භාවනාව තුලිනුත් ඔබ ආශ්වාදයක්මයි බලාපොරොත්තු වන්නේ.

මෙතනදී ඔබ සුවසේ නින්දයන්නයි ශරීරය ප්‍රසන්නභාවයෙන් පවත්වාගෙන යන්නයි සමාජයේ හැමෝටම ප්‍රිය වෙන්නයි මෛත්‍රී භාවනාව වඩන්නේ. ගැටළුකාර සංකීර්ණ සිතිවිලිවලට විවේකයක් ලබාදීම උදෙසායි ඔබ අනාපානසති භාවනාව වඩන්නේ. සමාජය කෙරෙහි ඇති ගැටීම් හීන කරගැනීම උදෙසායි ඔබ සතර සති පට්ඨාන ධරම්යන් වඩන්නේ. මේ සෑම ඉලක්කයකම තිබෙන්නේ ආශ්වාදයක්මයි. ඉලක්කයන් ආශ්වාදයක් බවට පත්වෙන්නේ චේතනාව අශ්‍රද්ධාවෙන් පෝෂණය වුණ නිසාමයි. තෙරුවන් කෙරෙහි අචල ශ්‍රද්ධාව තුලින් ඔබ ඇතිකරගන්නා ඉලක්කය ආශ්වාදය ආදීනවය විනිවිද දකිමින් නිස්සරණය දෙසට ඔබව යොමුකරනවා. පින්වත් ඔබ මේ ජීවිතයේදීම උතුම් සද්ධර්මයේ සැබෑම අර්ථය වන ආර්ය අෂ්ඨාංගික මාර්ගය තුලට අර්ථවත්ව ප්‍රවිශ්ට වීමට නම් බුදුරජාණන්වහන්සේගේ ධර්මරත්නයේ සංඝරත්නයේ සැබෑම ගුණයන් ඥාණයන් පිළිබඳව ඇතිකරගන්නා අචල ශ්‍රද්ධාව මූලිකම සුදුසුකම වන බව බුදුරජාණන්වහන්සේ දේශනාකොට වදාළ ධර්මය තුලින්ම තේරුම් ගත යුතු වෙනවා.

# සංස්කාරයන්ට අදාළවයි ඔබේ දැනීම් සකස්වෙන්නේ

පටිච්චසමුප්පාද ධර්මයේ සංස්කාර පච්චයා විඤ්ඤාණ කියන ධර්මතාවය ලෝකයේ ක්‍රියාකාරීත්වය කියලා කිව්වොත් වරදක් නැහැ. සංස්කාරයටම අදාළවයි විඤ්ඤාණය ක්‍රියාත්මක වෙන්නේ. සමාජයේ ජීවත්වෙන පින්වතුන්ට සංකීර්ණ වූ බලාපොරොත්තු තිබෙනවා. කෙනෙක් දීර්ඝායුෂ ලබන්න තිබෙන තෘෂ්ණාවෙන් පින්කම් කරනවා, තව කෙනෙක් ජීවිතය කෙරෙහි කලකිරීමෙන් සියදිවි නසාගන්න උපක්‍රම සොයනවා. දීර්ඝායුෂ ලබන්නට අදාළ සංස්කාර ජීවිතය තුල තිබෙන පුද්ගලයාට දැනීම් සකස්වෙන්නේ පින්කම් සිදුකරන්න. අතීත අකුසල් නිසා දිවි නසාගැනීමට අවශ්‍ය හේතුකාරණා තිබෙන පුද්ගලයාට දැනීම් සකස්වෙන්නේ දිවි නසාගන්න. සංස්කාරයන්ට අදාළවයි පුද්ගලයාට දැනීම් එසේත් නැතිනම් විඤ්ඤාණය සකස්වෙන්නේ. පින්වත් ඔබට අසනීපයක් හැදුනාම වෛද්‍ය ප්‍රතිකාර ගන්න සිත නොදෙනවා නම්, වෛද්‍ය ප්‍රතිකාර එපාය කියන දැනීම සකස්වෙන්නේ අතීත අකුසල් සංස්කාරයන් විපාකයට පැමිණීමට අවකාශය සකස්කොට ගැනීමට වෙන්න පුළුවන්. පින්වත් ඔබට නරක මිත්‍රයෙක් ආශ්‍රය කිරීමට සිත සකස්වෙන්නේ, ස්ත්‍රීන් ගැවසෙන, මත්වතුර පරිහරණය කරන සමාජයන්ට වැඩිපුර යන්න සිත සකස්වෙන්නේ අතීත අකුසල් සංස්කාරයන් විපාකයට පැමිණීමට අවශ්‍ය අවකාශය සකස්කොට ගැනීමට වෙන්න පුළුවන්. පින්වත් ඔබ ලබන අධ්‍යාපනය කෙරෙහි රැකියාව කෙරෙහි කළකිරීමට, මඟහැරීමට අදාළ සිතුවිලි සකස්වෙන්නේ ඔබේ අතීත අකුසල්

සංස්කාරයන් විපාකයට පැමිණීමට අවශ්‍ය අවකාශය සකස්කොට ගැනීමට වෙන්න පුළුවන්. පින්වත් ඔබට ඔබේ අම්මා, තාත්තාට, බිරිඳට, ස්වාමිපුරුෂයාට අකීකරුවන්නට සිතෙන සිතුවිලි සකස්වෙන්නේ ඔබේ අතීත අකුසල් සංස්කාරයන් විපාකයට පැමිණීමට අවශ්‍ය ඉඩකඩ සකස්කොට ගැනීමට වෙන්න පුළුවන්. පින්වත් ඔබට සිල්වතුන් සමග ගැටෙන නොරිස්සුම් සහගත හැඟීම් සකස්වෙන්නේ ඔබේ අතීත අකුසල් සංස්කාරයන් විපාකයට පැමිණීමට අවශ්‍ය ඉඩකඩ සකස්කොට ගැනීමට වෙන්න පුළුවන්. පින්වත් ඔබ මෙවැනි දෙලොවක් අතර තනිවී තීරණයක් ගැනීමට නොහැකිව සිටින අවස්ථාවකදී මේ සංස්කාර පච්චයා විඤ්ඤාණ කියන ධර්මථාවය නුවණින් මෙනෙහි කිරීම ඔබට හුඟාක් ප්‍රයෝජනවත් වෙනවා.

පාසලේ පන්ති කාමරයේ ඉගෙනගන්නා ළමයින් 40 දෙනෙක් සිටිනවා. එම දරුවන්ගෙන් ගුරුතුමා අසනවා, ඔයගොල්ලො ලොකුවෙලා කවුරු වෙන්නද කැමති කියලා. දරුවන් පිළිතුරු දෙනවා, මම වෛද්‍යවරයෙක්, මම ඉංජිනේරුවෙක්, මම හමුදා නිළධාරියෙක් තවත් දරුවෙක් මට කවුරුවත් වෙන්න බැරිවෙයිද කියන ප්‍රශ්නාර්ථය තුල සිටිනවා. පන්ති කාමරයේ දරුවන් තුල එකිනෙකට වෙනස් දැනීම් ඒ කියන්නේ විඤ්ඤාණය සකස්වෙන්නේ තම තමන්ට බලපාන අතීත සංස්කාර හේතුවෙන්. ගිය ජීවිතයේ බෞද්ධ හෝ අබෞද්ධ මහණ බමුණන් ෆාදර් තුමන්ලා ළඟට ගිහිල්ලා. හොඳ නරක ගැන, සීලය දුස්සීලභාවය ගැන ධර්මය, අධර්මය ගැන මෛත්‍රිය, ද්වේශය ගැන අසා දැනගෙන ඊට අදාළව යහපත් ජීවිතයක් ගතකිරීම හේතුවෙන් ඉහළ වෘත්තීන්ට අදාළව දැනීම් සකස්වෙනවා කියලා බුදුරජාණන්වහන්සේ දේශනා කරනවා.

පසුගිය ජීවිතයේදී තමන් ලැබූ ඉහළ වෘත්තිය නිසා සමාජ තත්වය නිසා මාන්නය සකස්කොටගෙන අනුන්ව පහත්කොට තැකීම, තම මහන්තත්වභාවයෙන් අනුන්ව මානසිකව පීඩා කිරීම හේතුවෙන් නූගත්භාවයට අදාළ දැනීම් සකස්වෙනවා

කියලා බුදුරජාණන්වහන්සේ දේශනා කරනවා. යම් පාසල් වියේ දරුවෙක් අනාගත බලාපොරොත්තු රහිතව, අධ්‍යාපනය කෙරෙහි අලසව කටයුතු කරනවා නම් එය දරුවාගේ ජීවිතයට බලපාන අතීත අකුසල් විපාකයන් වෙන්න පුළුවන්. මෙවැනි අවස්ථාවකදී පින්වත් දෙමාපියන් දක්ෂවෙන්ව ඕනේ. තම දරුවා යන්ත්‍ර, මන්ත්‍ර, ගුරුකම් අන්‍ය සීලව්‍රත පසුපස රැගෙන ගොස් තව තව අකුසල් පක්ෂය වැඩිකොටගන්නේ නැතිව කලබල නොවී උපක්‍රමශීලීව දරුවා කෙරෙහි අනුකම්පාවෙන් දරුවා පින්කම් තුල ගුණධර්ම තුල ශක්තිමත් කොට මතුනොවී පවතින අතීත කුසල් අතීත අකුසල් ශක්තීන් දරුවාට මතුකොට දෙන්න. සංස්කාරයන්ගේ ස්වභාවය හේතුවෙන් දරුවාගේ දැනීම් සකස්වෙන්නේ දුර්වල දිශාවට එය දරුවාගේ වරදක් නොවේ. මෙතනදී දරුවාට දඬුවම් කිරීමෙන් වැලකීමට දෙමාපියන් දක්ෂවෙන්න ඕනේ. දරුවා මේ ජීවිතයේදී නොකළ වරදකට විපාකයයි මේ අත්විඳින්නේ. මෙතනදී දෙමාපියන් දරුවාට නොවේ චෝදනා කළ යුත්තේ. සංස්කාරයන්ගේ කුරිරු භාවයේ අර්ථයයි දරුවා තුලින් මතුකොට ගැනීමට දක්ෂවිය යුත්තේ. තම අධ්‍යාපනය කෙරෙහි අලස දරුවා තුලින් සංස්කාරයන්ගේ යථා ස්වභාවය මතුකොටග න්න දෙමාපියන් දරුවා නිසා තමන් අපහසුවට පත්වන්නේද තමන්ගේ අතීත අකුසල් සංස්කාරයක විපාකයන් බව නුවණින් දකින්න දක්ෂවෙන්න. සංස්කාර පච්චයා විඤ්ඤාණ කියන ධර්මථාවය පින්වත් ඔබගේ එදිනෙදා ජීවිතයේ ප්‍රශ්න අකුසල් රැස්නොකරගෙන විසඳාගැනීමට හුඟාක් උපකාරීවෙනවා.

# දානයේ ආනිසංශ බෞද්ධ අබෞද්ධ කාටත් පොදුයි

බෞද්ධ වේවා අබෞද්ධ වේවා පින්වතුන්ලා දන් දෙන්න ගොඩක් කැමතියි. බෞද්ධ පින්වතුන් සම්මා දිට්ඨියේ අර්ථයෙන් පෝෂණය වූ සිතින්, දන් පූජාකරන අතර අබෞද්ධ පින්වතුන් දන් දෙන්නේ සම්මා දිට්ඨියේ අර්ථයන්ගෙන් බැහැරවයි. දානයෙන් ලැබෙන ආනිසංශ බෞද්ධ අබෞද්ධ කියලා වෙනසක් නැහැ. සම්මා දිට්ඨියේ අර්ථයන්ගෙන් පෝෂණය වූ දානය පින්වත් ඔබට සම්මා දිට්ඨියට අදාළ දිව්‍ය මනුෂ්‍ය සැපයන්ට ඔබව ඔසවා තබන අතර සම්මා දිට්ඨියේ අර්ථයන්ගෙන් තොරව පූජාකරන අන්‍ය ආගමික පින්වතුන්ලාගේ දානයන්ගෙන් ලැබෙන ආනිසංශ මිථ්‍යාදෘෂ්ටික දිව්‍ය මනුෂ්‍ය සැපයන්ට ඔසවා තබනවා.

එක පින්වත් මහත්මයෙක් සිටිනවා. එම මහත්මයා බෞද්ධ පින්වතෙක්. නමුත් බුදුරජාණන්වහන්සේගේ දේශනා කොට වදාල සූත්‍ර ධර්මයන්ට පටහැනි දෘෂ්ඨිමතවාදවල සිරකරුවෙක් වෙලයි ඔහු ජීවත්වෙන්නේ. ඒ කියන්නේ එම පින්වත් මහත්මයාගේ තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාව ඉතාමත් දුර්වලයි. යම් මනුෂ්‍යයෙක් තම බත් පිඟාන සමග මාළු කැබැල්ලක් අනුභව කළොත් එම මාළු කැබැල්ල අනුභව කළ මහත්මයා යන අපායක නම පවා ඉහත මහත්මයා ප්‍රකාශකරනවා. මේ හේතුව නිසයි භික්ෂුව සඳහන් කළේ තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාවෙන් එම පින්වත් මහත්මයා දුර්වලයි කියලා. නමුත් මේ පින්වත් මහත්මයා විශාල වශයෙන් දන් දෙනවා. සාංඝික දාන පූජාකරනවා. සිල්වතුන්ට දන් දෙනවා. නමුත් මේ දානයන් ශ්‍රද්ධාවෙන් පෝෂණය වෙන්නේ නැහැ. ඒ

නිසාම යම් දවසක ඒ මහත්මයා දීර්ඝායුෂ ඇතිව ජීවත්වෙලා මියපරලොව යන වේලාවට දෘෂ්ඨිගත ශ්‍රද්ධාවෙන් පෝෂණයව පූජාකළ දානයන් නිසාම අන්‍ය ආගමික ධනවත් ප්‍රභූ පවුලක උප්පත්තිය සකස්කොට ගන්න පුළුවන්. සමහරක් පින්වතුන් අපෙන් ප්‍රශ්න කරනවා සාංඝික දානයත් පූජාකරන්නේ පින්වතුන් අපෙන් ප්‍රශ්න කරනවා සාංඝික දානයන් පූජාකරන්නේ බෞද්ධ පින්වතුන් නමුත් ලෝකයේ වැඩිම ධනවත් ප්‍රභූ පුද්ගලයින් ඉන්නේ අන්‍ය ආගම්වලය කියලා. අබෞද්ධ ධනවතෙක් උපදින්න එක හේතුවක් තමයි භික්ෂුව ඉහතින් සඳහන් කළේ.

තවත් පින්වත් අබෞද්ධ මහත්මයෙක් සිටිනවා. එම මහත්මයා පල්ලිය මුල්කොටගෙන තම ආගමට සම්බන්ධ පින්කම් සිදුකොට ගන්නවා. තම ආගමට සම්බන්ධ සීලයන් ආරක්ෂාකරන, මෛත්‍රිය වඩන, සමාධිය වඩන, පින්වතුන්ලාව ආහාර, ඇඳුම් පැළඳුම්, පතපොත, නිවාස, යනාදී පූජාවන් සිද්ධ කරනවා. නමුත් ඔහු අබෞද්ධ පින්වතෙක්. මේ පුද්ගලයා දීර්ඝායුෂ ලබා ජීවත්වෙලා යම් දවසක මියපරලොව යන වෙලාවට අවසාන චුති සිතට තමන් සිදුකළ පින්කම් සිහියට නැගුනොත් ඔහු නැවත මිථ්‍යාදෘෂ්ඨික පවුලක ධනවත් ප්‍රභූ දරුවෙක්ව උපදින්න පුළුවන්.

කුසල් වේවා අකුසල් වේවා සංස්කාරයන්ගේ ක්‍රියාකාරීත්වය හරිම උපක්‍රමශීලියි. සමාජය තුල ඔබ දකින මනුෂ්‍යයාගේ උපක්‍රමශීලී ජීවන චර්යාවන් කියන්නේ සංස්කාර හේතුවෙන් සකස්වෙන දැනීම්වල ක්‍රියාකාරීත්වයයි. කෙනෙක් විශ්වවිද්‍යාල උපාධිය දක්වා අධ්‍යාපනය ලබලා, මධ්‍යම පාන්තික ජීවිතයක් ගතකරනවා. තව කෙනෙක් පහේ පන්තියට විතරක් පාසලට ගිහිල්ලා වැඩිවියට පත්වෙලා ධනවත් ප්‍රභූ ජීවිතයක් ගතකරනවා. එක පින්වත් මහත්මයෙක් සිටිනවා. එතුමා උපත ලබන්නේ ඈත ගම්මානයක දුප්පත් ගොවි පවුලක. ගොවි පවුලක් කිව්වත් ඔවුනට ඉඩ කඩම් නැහැ. නමුත් මේ දුප්පත් දරුවා, මැදිවියට පත්වෙනකොට ධනවත් ප්‍රභූ ව්‍යාපාරකයෙක් බවට පත්වෙනවා. මේ දුප්පත්භාවය ධනවත්භාවය දෙකම සංස්කාරයන්ගේ

ක්‍රියාකාරීත්වයේ ඵලයන්. මේ මහත්මයා දුප්පත්කම මැද්දේ අගහිගකම් ඇති පවුලක උපදින්නේ හේතුඵල ධර්මයන් නිසා. අපි සිතමු මේ දුප්පත් දරුවා පෙර ජීවිතයේ මනුෂ්‍යයෙක් කියලා. මේ පින්වතා පෙර ජීවිතයේ හොඳින් සිල්පද ආරක්ෂාකොටගෙන තිබෙනවා. එම නිසයි නැවත මනුෂ්‍යයෙක් බවට පත්වෙන්නේ. ඒ වගේමයි පෙර ජීවිතයේ තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාවෙන් ජීවත්වෙලා තිබෙනවා. ඒ නිසයි බෞද්ධ අම්මා තාත්තාට දාව ඉපදුනේ. මෙම පින්වතා පෙර ජීවිතයේදී හොඳින් දන් පූජා කර තිබෙනවා. මෙම දානයන් අතර සාංඝික දානයක් වගේම උපාසක උපාසිකාවන් වැනි සිල්වතුන්ට දන් පූජා කරලා තිබෙනවා. සිල්වතුන්ට දන් පූජාකරනවා වගේම මේ පින්වතා ගිය ජීවිතයේදී දුගී මගී යාචක පින්වතුන්ලාට, රෝගී පින්වතුන්ලාට ළමා නිවාසවලට ආදී පිරිසවලටත් දානයන් පූජා කොටගෙන තිබෙනවා. මේ පින්වතා පෙර ජීවිතයේ මියයන වෙලාවේ අවසාන චුති සිතට අරමුණුවෙලා තිබෙන්නේ දුර්වල දානමය චේතනාවක්. දුර්වල දානමය චේනාවට අදාලව මොහු දුප්පත් පවුලක උප්පත්තිය සකස්කොට ගන්නවා.

සමහර පින්වත් මහත්වරුන් සිටිනවා එම පින්වතුන් හොඳින් ගෞරවයෙන් මහා සංසරත්නයට සිව්පසයෙන් ඇප උපස්ථාන කරනවා. ඒ වගේම එම පින්වතුන් තිරිසන් සතුන්ටත් බොහෝම කරුණාවෙන් ඇප උපස්ථාන කරනවා. තිරිසන් සතුනගේ තිබෙන අසරණභාවය, සුරතල්භාවය නිසා තමන් පූජාකරන සාංඝික දානමය චේතනාවන්ට වඩා තමන් ආශ්වාදය ලබන්නේ තිරිසන් සතුනට කරන උපස්ථානයන්ට මේ ස්වභාවය හරිම අනතුරුදායක තැනක්. එම පින්වත් මහත්වරුන් දීර්ඝායුෂ ලබල, යම් මොහොතක මිය පරලොවයත්දී අවසාන චුති සිතට සාංඝිකදානමය චේතනාවන් යටපත්වී තමන් වැඩියෙන් ආශ්වාදය ලබන තිරිසන් සත්ව උපස්ථානයක් මතකයට පැමිණියොත් එම පින්වතුන් සිල්පද ආරක්ෂාකරගන්න නිසා නැවත පටිච්චසමුප්පන්නව දුප්පත් පවුලක මනුෂ්‍යයෙක්ව ඉපදීමේ ප්‍රවණතාවය හුඟාක්ම වැඩියි.

ගෙදර සුරතල් මසුන් ඇතිකරන, මාළු ටැංකියක් තිබෙන පින්වතුන් නිරතුරුව එම මාළුවන්ට කෑම දමමින් එම මාළුවන්ගේ හැසිරීම් රටාවන් නිසා ලොකු ආශ්වාදයක් ලබනවා. මාළු ටැංකියේ මාළුන්ට කෑම දැමීම නිසා ඔහු දන්දීමේ ආශ්වාදය හොඳින් ලබනවා. නමුත් මෙම තිරිසන් සතුනට දන්දීමේ ආනිසංශ හුගාක් දුර්වලයි. මාළුන්ට දන්දීමේ ආශ්වාදය වැඩි නිසා මෙවැනි පින්වතුන්ට මරණාසන්න මොහොතේ තමන් පූජාකරගෙන තිබෙන සාංඝික දානයක් සිල්වතුන්ට පූජාකොටගත් දානයක් පිළිබඳ මතකය යටපත් වී දුර්වල සත්ව දානයක් මතකයට ඒමේ ඉඩකඩ වැඩියි. ඉහත කාරණාවන්ගෙන් පින්වත් ඔබ හොඳින් තේරුම් ගන්න ඕනේ රෝගීන් වේවා, ළමා නිවාස වේවා, දුගීමගී යාචක පින්වතුන් වේවා, සියළු දෙනාටම ඇප උපස්ථාන කරන්න. නමුත් මේ සෑම උපස්ථානයක් තුලින්ම පින්වත් ඔබ පූජාකොටගත් සාංඝික දානමය චේතනාවන්, සිල්වතෙකුට දන් පූජාකළ චේතනාවන් ශක්තිමත් කොටගන්න දක්ෂවෙන්න. පින්වත් ඔබ ජීවිතයේ පූජාකොටගත් සියළු දානයන්ට ඉදිරියෙන් සාංඝික දානමය චේතනාවන් ඉදිරියටම ගන්න ඔබ දක්ෂවෙන්න. දන් පූජාකරන පින්වතුන්ලා ශක්තිමත්ව ආරක්ෂාවෙන ඉහත හේතුව නිසාම රෝගී පින්වතුන්, ළමා නිවාස, වැඩිහිටි නිවාසවල පින්වතුන්, දුගීමගී යාචක පින්වතුන් දක්ෂවෙන්න නිරතුරුවම තම තමන් සිල්පද පහ හොඳින් ආරක්ෂාකොටගෙන ජීවත් වී, තමන්ට ඇප උපස්ථාන කරන පින්වතුන්ලාගේ දානමය කුසල් ශක්තිය ශක්තිමත්කොට දෙන්න. එතැනදී පින්වත් ඔබත් ආරක්ෂා වී ඔබට උපකාර කරන ඔබට උපස්ථානකරන පින්වතුන්ලාවද ආරක්ෂා කරනවා.

පෙර ජීවිතයේ සාංඝික දානයන් සහ සිල්වතුන්ට දන් පූජාකොගෙන තිබුණත් අවසාන චුති සිතට එම ශක්තිමත් දානමය චේතනාවන් යටපත්වී දුර්වල දානමය චේතනාවක් සකස්වීම හේතුවෙන් දුප්පත් පවුලක ඉපදුනොත් මොහු පසුපස පසුගිය ජීවිතයේ පූජාකොටගත් සාංඝික දානමය පින්කම්

සිල්වතුන්ට දන්දීමේ පින්කම්වල ශක්තිය සැඟවී තිබෙනවා. දැන් මේ දුප්පත් පින්වතා තරුණවියට එළඹෙනකොට සංස්කාර පච්චයා විඤ්ඤාණ කියන ධර්මථාවය යටතේයි මේ තරුණයාට දැනීම සකස්වෙන්න, ගොවිතැන් කරන්න නොවේ. අනුන් යටතේ රැකියාවක් කරන්න නොවේ. ඔහුගේ කැමැත්ත දැනීම් සකස්වෙන්නේ පේමන්ට් එකේ වෙළඳාමක් කරන්න, නැතිනම් මැණික් ගරන්න, කුමක් හෝ ව්‍යාපාරයක නියැලෙන්න. මේ දුප්පත් තරුණයාට මෙවැනි දැනීම් සකස්වෙන්නේ පසුගිය ජීවිතයේ සැඟවී ඇති පිනට, විපාකදීමට අවශ්‍ය පසුබිම සකස්කොට ගන්න. අවසානයේ මේ දුප්පත් තරුණයා බොහෝම කැපවීම් කරමින් ව්‍යාපාර ක්ෂේත්‍රයේ ධනවතෙක්, ප්‍රභූ පුද්ගලයෙක් බවට පත්වෙනවා.

පින්වත් ඔබ ඉහත කාරණය හොඳින් නුවණින් විමසා දකින්න. මොහු දුප්පත් පවුලක ඉපදුනේ, පෙර ජීවිතයේදී අවසාන චුති සිත, දුර්වල දානමය චේතනාවකට අදාලව සකස්වුණ නිසා, දුප්පත් පවුලක ඉපදීම හේතුඵල ධර්මයක්. එම දුප්පත් පවුලේ තරුණ දරුවාට ගොවිතැන් කරන්න, අනුන් යටතේ රැකියාවක් කරන්න, දැනීම් සකස් නොවී, අමාරුවෙන් හෝ ව්‍යාපාර ක්ෂේත්‍රයට යොමුවීමට දැනීම් සකස් වූයේ අතීත ජීවිතයේ සැඟවී ඇති ශක්තිමත් දානමය සංස්කාරයන්ට විපාකදීමට අවශ්‍ය අවස්ථාව ඇතිකොට ගන්න.

භික්ෂුව මේ මොහොතේ වැඩසිටින ප්‍රදේශයේ බොහෝම ධනවත් ව්‍යාපාරිකයෙක් සිටිනවා. මොහු බොහෝම දුප්පත් තැනකින් මතු වී පැමිණි ධනවතෙක්. මොහුගේ හිතවතෙක් මොහුට යෝජනා කරනවා, අපි පිරිතක් කියලා සාංඝික දානයක් පූජාකරලා ලොකු පින්කමක් කරමු කියලා. ඒ වේලාවේ මේ ධනවත් පින්වතා කියනවා, ඔය දාන පිරිත් මම ජීවිතයට ගාවගන්නේ නැහැ කියලා. පෙර ජීවිතයේ සිල්වතුන්ට පූජාකොටගත් දානමය පින්කම් හේතුවෙන් ලැබුණු ආයුෂ, වර්ණය, සැපය, බලය මත වැජඹෙමින් සංසරන්නයට, දානයේ

අර්ථයන්ට නිගරුකරන මෙවැනි පින්වතුන්ලා කවදා නැවත ඔය ලබන සැපයන් ලබන්නද? පින්වත් ඔබ කුමන ක්ෂේත්‍රයකදී වුවද ඔබ ලබන ජයග්‍රහණයන්ට සැපයන්ට, එකම හේතුව ඔබ අතීතයේ සිදුකරගත් ශක්තිමත් දානමය පින්කම්වල ඵලයන් වශයෙන්ම දකින්න දක්ෂවෙන්න. එය උතුම් සම්මාදිට්ඨියේ ලක්ෂණයක්. සැපයට හේතුව හඳුනාගැනීමට අදක්ෂ පින්වතා, යම් දවසක ඵලය අහිමිකොට ගන්නවා.

# ක්‍රමානුකූලව පල්ලම් බහින බෞද්ධ මනෝභාවය

බුදුරජාණන්වහන්සේ පහළ වුණ දඹදිව සමාජයේ බුදුරජාණන්වහන්සේ පහළවීමට පෙරාතුව දානය, සීලය, සාමධිය, මෛත්‍රිය කියන අර්ථයන් මනුෂ්‍යයින් හොඳින් පුහුණුකොට තිබුණා. එදා මනුෂ්‍ය සමාජය හොඳින් පුහුණුකොට තිබූ දානය, සීලය, මෛත්‍රිය, සමාධිය සම්මා දිට්ඨියෙන් පෝෂණය කොට, ආර්‍යය දානයක් ආර්‍යය සීලයත් ආර්‍යය සමාධියත් ආර්‍යය මෛත්‍රියක්, බවට පත්කොට ගැනීමේ මාර්ගය පෙන්වා දුන්නේ ලොව්තුරා බුදුරජාණන්වහන්සේයි. භවයේ දුකත්, සැපත් දෙක අතර දෝලනයවීම සඳහා පමණක් උපකාරවූ සීලය, දානය, සමාධිය මෛත්‍රිය කියන ධර්මයන් සංස්කාරයෙන්ගේ අනිත්‍යභාවය මතුකොට දක්වමින් භව නිරෝධය දෙසට යොමුකොට පෙන්වූයේ බුදුරජාණන්වහන්සේය. නමුත් පින්වත් ඔබ නුවණින් විමසා බලන්න. පින්වත් ඔබ දුකින් මිදී සැප ලබාගැනීම උදෙසා, සිල්පද රකිනවා, දන් දෙනවා, මෛත්‍රී වඩනවා, සමාධි භාවනාවන් පුහුණු කරනවා, මිස දුකෙත් සැපෙත් දෙකෙන්ම මිදීම උදෙසා මෙම ධර්මයන් ආර්‍යය දානයත් ආර්‍යය සීලයත් ආර්‍යය සමාධියත් ආර්‍යය මෛත්‍රියත් බවට පත්කොට ගැනීමට උත්සාහ ගන්නේ නැහැ නේද? බහුතරයක් පින්වතුන් සෑම පින්කමක්ම සිදුකරන්නේ මෙලොවදී සැප ලබමි පරලොව සැප ලබමි කියන බලාපොරොත්තුවෙන්, සමහර පින්වතුන් සිතේ සතුට උදෙසා පමණක් පින්කම් කරනවා. තවත් පින්වතුන් පරම්පරාවෙන් කරගෙන එන නිසා පින්කම් කරනවා. ස්වාමීන්වහන්සේලා

පන්සල, සමග සම්බන්ධතාවයන් පවත්වා ගැනීම උදෙසා පින්කම් කරනවා. වර්තමානයේ උතුම් ශ්‍රී සද්ධර්මය ජීවමානව පැවතියත් ධර්ම මාර්ගය ජීවමානව පැවතියත් අපි ක්‍රමානුකූලව බුදුරජාණන්වහන්සේ පහළ වීමට පෙර දඹදිව සමාජයේ ජනතාව තුල තිබූ මනෝභාවයන්ට ක්‍රමානුකූලව පල්ලම් බහිනවා නේද?

මේ ලෝක ධාතුව තුල පහළවෙන සෑම බුදුරජාණන්වහන්සේ නමක්ම ලෝක සත්වයාට කරන උතුම් අනුශාසනාවක් තිබෙනවා. එම අනුශාසනාව තමයි, සම්බ පාපස්ස අකරණං, කුසලස්ස උපසම්පදා, සචිත්ත පරියෝධපනං, එතං බුද්ධානුශාසනං කියන අනුශාසනාව. මේ උතුම් ගාථා රත්නයේ සැබෑම අර්ථය වෙන්නේ, සියළු පාපයන්ගෙන් මිදෙන්න, කුසල් ධර්මයත් ජීවිතයට එකතුකොට ගන්න. තුන් වැනි ගාථා පදයේ අර්ථය තමයි, කුසල් සහ අකුසල් සිත් දමනය කොට ගන්න. ඒ කියන්නේ කුසල් සිතත්, අකුසල් සිතත් විදර්ශනා නුවණින් දකින්න. එයයි සෑම බුදුරජාණන්වහනසේ නමකගේම අනුශාසනය වෙන්නේ. මෙතනදී අකුසල් සංස්කාර කියලා හඳුන්වන්නේ කාය සංස්කාර, හේතුවෙන් සකස්වෙන කාය කර්මයන්ට අදාල සතුන් මැරීම, සොරකම් කිරීම, කාමයේ වරදවා හැසිරීම. වචී සංස්කාර හේතුවෙන් සකස්වෙන වචී කර්ම වශයෙන් හඳුන්වන්නේ. මුසාවාදා, පිසුනාවාචා, පරුෂාවාචා, සම්ප්‍රප්පලාපා මනෝ සංස්කාර හේතුවෙන් සකස්වෙන මනෝ කර්මයන් වෙන්නේ, ලෝභ, ද්වේශ, මෝහ ධර්මයන්. ඉහත අකුසල් ධර්මයන්ගෙන් වැළලිලා කුසල් ධර්මයන් වන සතුන් මැරීමෙන් වැළකීම, සොරකම් කිරීමෙන් වැලකීම, කාමයේ වරදවා හැසිරීමෙන් වැළකීම ජීවිතයට එකතුකොටගන්නවා. මුසාවාදා, පිසුනාවාචා, පරුෂාවාචා, සම්ප්‍රප්පලාපා කීමෙන් වැළකෙමින් වචනයෙන් සිදුකරන්නා වු කුසල් ධර්මයන් ජීවිතයට එකතුකොට ගන්නවා. අලෝභ, අද්වේශ, අමෝහ ධර්මයන් ජීවිතයට එකතුකොට ගනිමින් මනසින් සිදුකරන්නා වූ කුසල් ධර්මයන් ජීවිතයට එකතුකොට ගන්නවා. මුලින්ම පින්වත් ඔබ අකුසලයෙන් වැළකෙනවා. දෙවැනිව කුසල් ධර්මයන් ජීවිතයට එකතුකොට ගන්නවා.

තෙවනුව කුසල් සංස්කාරයනුත් අකුසල් සංස්කාරයනුත් අනිත්‍ය වූ ධර්මතාවයන් යන්න නුවණින් දකිමින් භව නිරෝධයට අවශ්‍ය විදර්ශනා නුවණ සකස්කොට ගන්නවා. සබ්බ පාපස්ස අකරණං ගාථා රත්නයේ සැබෑම අවසන් අර්ථය වෙන්නේ දානය ආර්‍යය දානයක් බවටත් සීලය ආර්‍යය සීලයක් බවටත් සමාධිය ආර්‍යය සමාධියක් බවටත් මෛත්‍රිය ආර්‍යය මෛත්‍රියක් බවටත් ප්‍රඥාව ආර්‍යය ප්‍රඥාවක් බවටත් පත්කර ගැනීමයි. බුදුරජාණන්වහන්සේ පහළ වීමට පෙර සමාජයෙත් ජනතාව තුල ප්‍රඥාව තිබුණා. එදා සිටි සමහරක් පින්වතුන් රූපාවචර ධ්‍යාන, අරූපාවචර ධ්‍යාන සකස් කොටගෙන තිබුණා. ලෞකික සාමධියේ ශක්තින් නිසා චුතුපපාතඥාණයත්, පූර්වේනිවානුස්සති ඥාණයත් ලබාගෙන තිබුණා. දිව්‍යතලවල සිත පිහිටුවා ගැනීමේ හැකියාව තිබුණා එදා පින්වතුන්ට. භවයේ අනිත්‍ය වූ සැපයන් ස්පර්ශ කිරීමට අවශ්‍ය ලෞකික ප්‍රඥාව තිබුණා. නමුත් එය තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාවෙන් පෝෂණය වූ ප්‍රඥාව නොවෙයි. හුදු වෙනස්වන සංස්කාරයන් සමග වෙනස් වී යන ලෞකික ප්‍රඥාවයි.

ඉහත සටහන කියවන පින්වත් ඔබ මහා සංඝරත්නය අරමුණුකොටගෙන දන් පූජාකරමින් උපාසක උපාසිකාවන්ට දන් පූජාකරගනිමින් දානයෙන් ලැබෙන ආනිසංශ ධර්මයන් වන ආයුෂ, වර්ණය, සැපය, බලයේ අනිත්‍යභාවය නුවණින් දකින්න. රෝගී පින්වතෙකුට දානයක් පූජාකොට අසරණ පින්වතෙකුට දානයක් පූජාකොටගත්තත් තිරිසන් සතෙකුට බත් කටක් දුන්නත් දානය හේතුවෙන් සකස්වෙන ආශ්වාදජනක සිත අනිත්‍ය වශයෙන්ම දකින්න. දන් පූජාකොට ගනිමින් පින්වත් ඔබට ලැබෙන ආයුෂ, වර්ණය, සැපය, බලය කෙරෙහි තෘෂ්ණාවද ඔබ දන් දෙන්න. එය ආර්‍යය දානයේ සැබෑම අර්ථය වෙනවා.

පින්වත් ඔබ දිනපතා පංචසීලය සමාදන්වෙමින් පොහොය දිනයන්ට උපෝසතසීලය සමාදන්වෙමින් සීලයේ ආනිසංස හේතුවෙන් ඔබට පෙරලා ලැබෙන ජනප්‍රියභාවය, කීර්තිරාවය නොබියව සමාජය ඉදිරියට යාමේ ශක්තිය, සිහිමුලා නොවී මරණයට පත්වීම, සුගතියේ නැවත ඉපදීම කියන ධර්මතාවයන්

කෙරෙහි ඇති තෘෂ්ණාව දන් දෙන්න එය පින්වත් ඔබ රැකගන්නා සෑම සිල්පදයන්ට ආර්‍යය සීලයක් බවට පත්කොට ගැනීමේ මාර්ගය වෙනවා. පින්වත් ඔබ තෙරුවන් කෙරෙහි ගෞරවයෙන් රකින සිල්පදයන් පින්වත් ඔබ අතින් අතීතයේ බිඳුණු සිල්පදයන් අනිත්‍ය වූ සංස්කාරයන්ය කියන අර්ථය ආර්‍යය සීලයේම අර්ථයන් වෙනවා. සීලයේ ඵලයන් වශයෙන් ඔබ තුල සකස්වෙන ඉන්ද්‍රිය සංවරභාවය තුලින් ඔබ ඇතිකොට ගන්නා සමාධිමත්භාවය හේතුවෙන් ඔබ තුල සකස්වෙන රූපාවචර, අරූපාවචර ධ්‍යාන ශක්තීන් කෙරෙහි පින්වත් ඔබ ඇතිකොට ගන්නා වූ තෘෂ්ණාව දන්දීම ආර්‍යය සමාධියේ සැබෑම අර්ථය වෙනවා. පංචනීවරණ ධර්මයනුත් සප්ත බොජ්ජංග ධර්මයනුත් කෙරෙහි ඇතිකොට ගන්නා ඇලීම සහ ගැටීමත් ඇලීම් ගැටීම් දෙකෙන් මිදුන තැන සකස්වෙන උපේක්ෂාව කියන ධර්මතාවයන් කෙරෙහි ඇති තෘෂ්ණාව අතහැරීම තුලින් සකස්වෙන ආර්‍යය සමාධියේ ශක්තිය ආර්‍යය ප්‍රඥාවට පින්වත් ඔබව යොමුකරනවා.

සීලයෙන් පරිපූර්ණභාවයට පත්වෙන ඔබ සියළුම සත්වයින්ට දස දිශාවෙන් මෛත්‍රිය පැතිර වීමෙන් සකස්වෙන ආනිසංශ ධර්මයන් වන සුවසේ පිබිදෙනවා, සුවසේ නිදාගන්නවා, නපුරු සිහින දකින්නේ නැහැ. දෙවියන්ට මනුෂ්‍යයින්ට අමනුෂ්‍යයින්ට ප්‍රිය වෙනවා. වසවිසෙන් හානිවෙන්නෙ නැහැ. ශරීරය ප්‍රසන්න වෙනවා. සිහිමුලා නොවී මැරෙනවා. සුගතියේ උපදිනවා. මෛත්‍රිභාවනාව පුහුණු කිරීම තුල ඔබ දිට්ඨධම්ම වේදනීයව ලබන ඉහත ආනිසංශ කෙරෙහි නොඇලී එම ආනිසංශ කෙරෙහි ඇති තෘෂ්ණාව දන් දීම සැබෑම ආර්‍යය මෛත්‍රියේ අර්ථය වෙනවා. ඉහත සටහනින් පින්වත් ඔබට වැටහෙනවා, ඇති ආහාර, ගිලන්පස, සිවුරු, පිරිකර දන් දෙනවා වගේම ඒවා දන් දීමෙන් සකස්වෙන ආශ්වාදජනක කුසල් සිත කෙරෙහි ඇති තෘෂ්ණාව දන් දීම සැබෑම ආර්‍යය දානයක අර්ථය ඔබ තුල ඇතිකොට දෙනවා කියලා. ඒ වගේමයි සීලය, සමාධිය, මෛත්‍රිය තුලින් සකස්වෙන ආනිසංශ ධර්මයන් කෙරෙහි කුසල් සංස්කාරයන් කෙරෙහි ඇති කොටගන්නා තෘෂ්ණාව දන් දීමද දානයන්ගෙන් ශ්‍රේෂ්ඨම දානය බවට පත්වෙනවා.

ඒ වගේමයි ගිහි පින්වත් ඔබ දන් නොදෙමින් සිල් නොරකිමින් සමාධිය මෛත්‍රිය නොවඩමින් එම ධර්මථාවයන්ගේ අනිත්‍යභාවය දැකීමට ගියොත් නැවත නැවත ලෝභ, ද්වේශ, මෝහ අකුසල් ධර්මයන්ට ජීවිතයට එකතුවෙන බවද නුවණින් දකින්න දක්ෂ වෙන්න ඕනේ. දන් දෙමින්, සිල් රකිමින්, සමාධිය මෛත්‍රිය වඩමින් එම සංස්කාරයන්ගේ අනිත්‍යභාවය දකින පින්වතා සංස්කාරයන් හේතුවෙන් සකස්වෙන විඤ්ඤාණයට බැඳීයන්නේ නැහැ. දුක ප්‍රතික්ෂේප කොට සැප සොයන ලෝකය තුල ඔහු දුකත් සැපත් දෙකටම නොඇලෙන නොගැටෙන දක්ෂයෙක් වෙනවා.

# නියඟයත්, ගංවතුරත්, දුස්සීලභාවයේම ඵලයන්

භික්ෂුව මේ වස් කාලයේ වැඩ සිටින ගම්මානයට නිරතුරුවම වැසි වැටෙනවා, ගමේ පින්වත් දායක මහත්මයෙක් ප්‍රකාශ කළා, රටේ සෑම ප්‍රදේශකයකටම මේ වැස්ස පවතිනවා කියලා. පසුගිය අවුරුද්දෙ වස් කාලය, මේ ගම්මානවලට දැඩි නියගයක් ඇතිවෙලා තිබෙනවා. පසුගිය වස්කාලයේ මේ ගම්මාන වලට නියං සහනාධාර පවා බෙදාදීලා. ගම්මානවල පැරණි මනුෂ්‍යයින්ටත් සිතාගන්න බැරි විදිහට දේශගුණික තත්වයන් වෙනස් වෙනවා. පරිසරයේ ක්‍රියාකාරකම් චංචල වෙලා. රටේ දේශගුණික තත්වයේ චංචලභාවය ගැන ලියනකොට මනුෂ්‍ය සමාජයේ ජීවත්වන මනුෂ්‍යයන් තුල ඇතිවෙන ඉන්ද්‍රිය අසංවරභාවය ගැන භික්ෂුවගේ මතකයට ආවා. සමාජය තුල ඇණකොටා ගැනීම්, දූෂණය කිරීම්, මිනීමරාගැනීම්, හදිසි අනතුරු බොහෝම සීඝ්‍රයෙන් වැඩිවෙනවා. ඒ කියන්නේ මනුෂ්‍යාගේ ඉන්ද්‍රිය අසංවරභාවය වැඩියි. ඉන්ද්‍රිය අසංවරභාවය වැඩිවෙන්නේ මනුෂ්‍යයා තුලින් සිල්පද බිඳීම් වැඩිනිසා. මනුෂ්‍යයා තුලින් සිල්පද බිඳීම් වැඩිවෙනවාය කියන්නේ සමාජය සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව කියන ආර්‍යය අෂ්ඨාංගික මාර්ගයේ අර්ථයන් දුර්වලකොටගෙ නයි ජීවත් වෙන්නේ. ඇයි මනුෂ්‍යයාගේ සම්මා වාචාවන් දුර්වල වෙන්නේ. මනුෂ්‍යයා සම්මා සංකප්පයෙන් දුර්වලයි. මනුෂ්‍යයා තුලින් සීලයට අදාල අකුසල් වැඩිවෙනකොට මනුෂ්‍යයා තුලින් අවිහිංසාව, අව්‍යාපාදය, නෙක්ඛම්ම සංකප්පයන් දුර්වල වෙනවා. මේ සියල්ලටම හේතුව සම්මා දිට්ඨියේ දුර්වලභාවයයි.

සම්මා දිට්ඨියේ දුර්වලභාවය තමයි සමාජය තුල ඇති වී තිබෙන්නාවූ ජනතාවගේ ඉන්ද්‍රිය අසංවරභාවය, ජනතාවගේ ඉන්ද්‍රිය අසංවරභාවය නිසා සමාජය තුල පින්වත් ඔබට සිතාගන්නත් බැරි සිද්ධීන් සිද්ධවෙනවා. මේව අහලා දැකලා, මනුෂ්‍යයා වික්ෂිප්ත භාවයට, චංචලභාවයට පත්වෙනවා.


මනුෂ්‍යයාගේ ඉන්ද්‍රිය අසංවරභාවය නිසාම ඇති කොටගත් රූපයත් අයිතිකොටගැනීමේ තෘෂ්ණාව නිසා බරපතල වූ පාරිසරික විනාශයන් මනුෂ්‍යා සිදුකරනවා. මේ බරපතල වූ පාරිසරික විනාශයන් හේතුවෙන්ම රටේ ස්වාභාවික, දේශගුණික ක්‍රියාකාරකම්ද වෙනස්වෙනවා. සීලයේ දුර්වලතාවයන් හේතුවෙන් මනුෂ්‍යා තුල ඉන්ද්‍රිය අසංවරභාවය ඇතිවී මනුෂ්‍ය සමාජය චංචල වෙන්නාසේ, මනුෂ්‍යයාගේ දුස්සීලභාවයේ ක්‍රියාකාරකම් හේතුවෙන්, පරිසරයට කරන විනාශයන් හේතුවෙන් රටේ දේශගුණික අසංවරභාවයන් ස්වභාවධර්මය විසින් ඇතිකොට දෙනවා. මේ සියල්ල හේතුඵල ධර්මයන්. අනාගයේ මනුෂ්‍යයා සම්මා දිට්ඨියේ අර්ථයන්ගෙන් දුර්වලවී, හිංසාවෙන්, ද්වේශයෙන්, ලෝභ, ද්වේශ, මෝහ යන සම්මා සංකප්පයන්ගෙන් දුර්වල වෙනකොට ජනයා සීලයෙන් පිරිහීමට පත්වෙනවා. ඒ හේතුවෙන්ම ජනතාව තුල ඉන්ද්‍රිය අසංවරභාවය වැඩිවී මිනිස් සමාජය චංචල වෙනවා වගේම දුස්සීල මනුෂ්‍යයන්ගේ තෘෂ්ණාව හේතුවෙන්ම බරපතල පාරිසරික විනාශයන් සිදු වී අනාගත ලෝකයේ දේශගුණික තත්වයන්ද ජනතාවට සිතාගන්න බැරි ආකාරයට අසංවරවෙනවා, චංචල වෙනවා. ජනතාවගේ ඉන්ද්‍රිය අසංවරභාවයට සාපේක්ෂව, දේශගුණික අසංවරභාවයන්ද හේතුඵල ධර්මයන්ගේ ඵලයක් වශයෙන් සකස්වෙනවා. ඉහත සටහනින් පින්වත් ඔබට වැටහෙනවා ඇති, රටේ ඇතිවන නියගයටත්, ගංවතුරටත් ජනතාවගේ සම්මා දිට්ඨියේ දුර්වලතාවය නිසා සකස්වෙන දුස්සීලභාවය හේතුවෙනවාය කියන කාරණය ධර්මථාවයන්ය කියලා.

සමාජයේ ජනතාව තුල ඇතිවෙන ඉන්ද්‍රිය අසංවරතාවයට හේතුවත්, පරිසරයේ ඇතිවන දේශගුණික අසංවරභාවයන්ට හේතුවත් මනුෂ්‍යයාගේ දුස්සීලභාවයේම ඵලයන් වශයෙන් හඳුනාගන්න. පින්වතුන්, මෙවැනි අකාරුණික චංචල ධර්මථාවයන් ඉදිරියේ සතිය සිහිය ඇතිකොටගැනීම ගොඩාක් වැදගත් වෙනවා. පින්වත් ඔබ ඇතිකොටගන්නා සතිය සහ සිහිය විසින් ඔබව ප්‍රශ්නයට හේතුවෙන්නාවූ හේතුඵල ධර්මයන් නුවණින් විමසීමට ඔබව යොමු කරනවා. මෙය ධර්මවිජය බොජ්ජංගය වශයෙන් හඳුන්වන්න පුළුවන්. පින්වත් ඔබ ඉදිරියේ සකස්වෙන විනාශ ධර්මානුකූලව දකින්න දක්ෂවෙන තැන ඔබ තුල වීර්‍යය සකස්වෙනවා. ධර්ම මාර්ගය තුලින්ම ප්‍රශ්නයට විසඳුම් සොයායන්න. දැන් පින්වත් ඔබ, ධර්මානුකූලව ප්‍රශ්නයට විසඳුම් නුවණින් මෙනෙහි කොට දකිනවා. ඉන්ද්‍රිය අංසවරභාවය ඇතිවූයේ දුස්සීලභාවය නිසා, දුස්සීලභාවය ඇතිවුණේ සම්මා සංකප්පයන්ගේ දුර්වලභාවය නිසා, සම්මා සංකප්පය දුර්වලවුණේ සම්මා දිට්ඨියේ දුර්වලභාවය නිසා, සම්මා දිට්ඨිය දුර්වලවුණේ කල්‍යාණමිත්‍ර ආශ්‍රයේ, ශ්‍රද්ධර්මය ශ්‍රවණයේ, නුවණින් මෙනෙහි කිරීමේ දුර්වලභාවය නිසාය කියලා. පින්වත් ඔබ ඉදිරියේ ඇති ව්‍යසනයට සැබෑම ධර්මයේ හේතුව මතුකොට ගන්නවා. සමාජය තුල ඉන්ද්‍රිය අසංවරභාවය ඇති කරන, පරිසරය තුල, දේශගුණික අංසවරභාවය ඇති කිරීමට සැබෑම හේතුව, සතිය සිහිය තුලින් ධර්මානුකූලව මතුකොටගන්න තැන, පින්වත් ඔබ තුල ධර්මයේ සත්‍යය ජීවිතය තුලින් අත්දැකීමේ ප්‍රිතිය එනම් පස්සද්දිය ඇති වෙනවා. අධර්මයේ බරින් නිදහස්ව ධර්මයෙන් සැහැල්ලුවට පත් සිතින් පින්වත් ඔබ ඇලීම් ගැටීම් වලින් තොර උපේක්ෂාවට පැමිණීමට දක්ෂවෙනවා.

පින්වත් ඔබේ ජීවිතය ඉදිරියට පැමිණෙන සමාජීය පාරිසරික ප්‍රශ්න හමුවේ චංචලභාවයට පත්නොවී විනාශය සප්ත බොජ්ජංග ධර්මයන් බවට පත්කොටගෙන ධර්මානුකූලව අකුසලය කුසලයක් බවට පත්කොට ගැනීමට මාර්ගයයි භික්ෂුව ඉහතින් සටහන් කොට තැබුවේ.

පින්වත් ඔබ දක්ෂතාවයෙන් යුතුව, ඔබ ඉදිරියට පැමිණෙන සමාජීය පාරිසරික ව්‍යසනයන්, තුලින්, ධර්මානුකූලව සප්ත බොජ්ජංග ධර්මයන් ජීවිතය තුලින් මතුකොටගෙන, එම සප්ත බොජ්ජංග ධර්මයන්ගේ අනිත්‍යභාවය දැකීම, කුසලයත් අකුසලයත් දෙකින්ම මිදී විදර්ශනා නුවණ ඇතිකොට ගැනීමට මාර්ගය වෙනවා.

පින්වත් ඔබ අදක්ෂභාවයෙන් ඔබ ඉදිරියට පැමිණෙන සමාජීය පාරිසරික ව්‍යසනයන්ට ගැටෙමින් අධර්මානුකූලව පංචනීවරණ ධර්මයන් මතුකොට ගතහොත්, පින්වත් ඔබ අකුසලය නිසා තව තව අකුසල් රැස්කොටගන්න අදක්ෂයෙක්ම වෙනවා. ඉහත කාරණා සියල්ලෙන්ම පින්වත් ඔබට තේරුම් යන්න ඕනේ, සමාජය තුල ඇතිවෙන සමාජීය පාරිසරික අසංවරභාවයන් තුලින්, පින්වත් ඔබ දක්ෂනම් භව නිරෝධයට මාර්ගය සකස්කොට ගන්න පුළුවන්ය කියන කාරණය.



ඝෝරතර සසරේ
තවත් එක් සන්ධියක
ඉබාගාතේ ඇවිදි
සංසාර සතුන් හට
නොඇලෙන්න කියාදුන්
නොගැටෙන්න සිහිය දුන්
අතහරින සතිය දුන්
නිදුකානගේම පුත්
සඟ මැණික ඔබම විය

කරගන්න මහ කුසල්
බෙදා ලොවටම දහම
ඔබේ අවබෝධයෙන්
සැනසීය මනු කැලක්
එමතු නොව දෙවියෝද
එයින් තුටු වනු දනිමි

සාරිපුත් පරපුරේ
අපේ කාලේ උපන්
මහකසුප් මහතෙරගෙ
එමඟ යන බුදු පුතුනි
එක්කෝ මරණයය
නොමැතිනම් නිවනමය
කියා කළ සිහ නාද
තව කොහෙන් අසන්නද

ඔබේ දම් ගැලපුමට
නොතිත් පැසසුම් එතැයි
කියූ කල මා ඔබට
පුතේ මේ මගෙ නොවෙයි
බුදුරජුන් දහමමය
නිහතමානීව කිවු
ඒ වදන් රාවදෙයි

කොහේ හෝ වන පෙතක
මේ මොහොතෙ වැඩ සිටින
අපේ පිනටම උපන්
හිමියනේ ඔබෙ ගුණෙන්
දකිමු අපි බුදු රජුන්

ඒ අමා මැණියන්
සහස් දෙකකුත් අඩක්
ගෙවී වස් ගතවෙතත්
වදයි ඔබ වැනි පුතුන්
ලෝ සතට සෙනෙහසින්

ISBN 978-955-7887-11-1

මුද්‍රණය: ස්මාර්ට් ප්‍රින්ට් සොලියුෂනස් සෙන්ටර්

මිල රු. 100/-